# සඥාපනය.

පරිත්‍රාණ ප්‍රශනය නම්වූ මෙම කුඩා ග්‍රන්ථය එහි ප්‍රාරම්භයෙහි දක්වනලද නයින් තලංගම පදිංචි විලියම් පේ‍රරා අප්පුහාමි විසින් ලියා අසා හරිනලද පිරිත්කිරීම සම්බන්ධවූ ප්‍රශන 14 කට පිළිතුරුවශයෙන් කොට්ටාවේ බෞද්ධ තාපසාරාමාධිවාසී සුබෝධානන්ද බෞද්ධ තාපස සාමින්වහන්සේ විසින් ආගමානුකූලව පෙලපාඨාදිය නිදගින කොට ලියාදෙන ලද්දක්වේ—මෙහි පිරිත යන වචනයෙහි තේරුම පටන් ඒ ඒ පිරිත් සූත්‍රයන්ගේ උත්පත්ති කථාවන්ද ඒ ඒ පිරිත් වලින් පිරිත් කරණ කියන විධියද ඒ ඒ පිරිත් සූත්‍රවලින් ලැබෙන්නාවූ ගුණානුභාවයන්ද යන මේ ආදිවූ අපමණ දෙලොවැඩ පිණිස පවත්නාවූ කරුණු රාශියක් අන්තර්ගතකර තිබේ, එහෙයින් මෙය බලන්නාවූ අනුපාරම්භචිත්තය ඇති සත්පුරුෂ මහජනයාට ලබාගත හැකි විපුල ප්‍රයෝජනය මෙතෙකැයි ප්‍රමාණකල නොහැකිබව එක් වරක් මනාකොට කියවා බැලීමෙන් වැටහෙන්නේමය—එහෙයින් මෙහි වර්ණනාකිරීම උවමනා නොවේ—මෙහි පළමු කෙටුම් පත දුටුවාවූ මා විසින්ද එය එම සුබෝධානන්ද තාපස සාමින්වහන්සේ අතින් ලබාගෙණ ලෝවැඩ පිණිස මුද්‍රණයකරවා විසුරුවා හරින්ට යෙදුනා ඇත—තවද මෙය මුද්‍රණයකරවීමෙහිදී සුඩියපිණිස කොපිය බැලවීම කළේ එකවර බැගින්මවේ දෙවරවත් බලවා ගැණීමට නොහැකිවූ ප්‍රමාදයෙන් සමහරතැන්වල බැඳියයුතුඅකුරු නොබැඳීමත්ද නුසෑවියයුතු අක්ෂර දික්වීමත්ද යන මේ ආදිවශයෙන් අකුරු ඇමිණවීමෙහිදිවූ අක්ෂරදෝෂරාසියක් වැටීතිබේ– එයින්ද ශුද්ධපත්‍රය විශාලව යනාහෙයින් බොහෝ තැන් අත්හැර අර්ථාවබෝධයකර ගැණීමට දුශ්කරතැන් පමණක් ශුද්ධපත්‍රයට ඇතුලත්කරවා මුද්‍රණය කරවන්ට යෙදුනේය—එහෙයින් සර්වඥබවට නොපැමිණි සියලු පණ්ඩිතයන්ගෙන්ම වියහැකිවූ එබඳු ප්‍රමාද දෝෂ නොසලකා මෙයින් වන ලොකාර්ථසිද්ධියට පණ්ඩිතයෝ කොටස්කාරයෝ වෙත්වා—තවද මෙය ගුහ්‍යකරවා දෙවෙනිවර මුද්‍රණය කරවීමෙ අයිතිවාසිකම මා වෙතටම තබාගත් බවද සලකත්වා.

මෙවගට,

බරත්දෙනියේ ජූලර්සාප්පුවේ පදිංචි

එච්. ඒ. ඇස්. පේ්‍රරා වන මමය.

වර්ෂ 1910 ක්වූ ජූනි මස
15 වෙනි දිනදීය.

එච්. ඒ. ඇස්. පේ්‍රරා

# ශුද්ධ පත්‍රය.

| පිට. | පෙල. | අසුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 7 | කඬඹිනා | කඬබිනා |
| 3 | 18 | තුද්දස | තුදුස |
| 4 | 18 | සෙටඨ | සෙට්ඨ |
| 5 | 10 | සෙටඨානි | සෙට්ඨානි |
| ,, | 13 | අඹබාහාරිකා | අබ්බාහාරිකා |
| 6 | 11 | පබබතානි | පබ්බතානි |
| 8 | 25 | අසසායෙය්‍යං | අස්සායෙය්‍යං |
| ,, | ,, | පරිනිබබුතො | පරිනිබ්බුතො |
| ,, | 37 | මහබිනිමක්ත් | මහබිනික්මන් |
| 7 | 11 | මිහිෂණ | විභීෂණ |
| ,, | 14 | සම්පයෙහිටු | සමීපයෙහිවූ |
| ,, | 29 | මනොකොට | මනාකොට |
| 10 | 10 | දිවාභාගයෙදහි | දිවාභාගයෙහිද |
| ,, | 19 | මෙපණකුත් | මෙපමණකුත් |
| 11 | 8 | සමෙබාධ | සම්බාධ |
| ,, | 10 | බුඩාඤුව | බුඩඤුව |
| ,, | 21 | සුවිෂෙණ්ණා | සුවිෂණ්ණ |
| 13 | 33 | විපොතන ඒරිතුං | විපාතනඑරිතුං |
| ,, | 36 | විරූපකබඛි | විරූපක්ඛගි |
| 14 | 9 | සිඅලු | සියලු |
| 15 | 5 | එගි | එහි |
| ,, | 6 | සිරරු | සිරුරු |
| 16 | 5 | කෘහව | කෘශව |
| ,, | 14 | ඒහිසුවූ | ඒහිසුහු |
| ,, | 16 | කිසිම මවක්හට | කිසිමෙවක්හට |
| 17 | 17 | ශූදරූපයාගේ | හුදරූපයාගේ |
| ,, | 26 | ධශහපිරිත | ධජගහපිරිත |
| 19 | 3 | සුභික්ෂවූඑවිසාලාම්හනුවර | සුභික්ෂවූ ඒවිසාලාමහනුවර |
| 20 | 22 | සහිත | සහිතව |
| 21 | 34 | ඤූණාථී චංඝීාව | ඤූත්‍යාථීචංඝීාව |
| 23 | 34 | සහිකොට | සහිතකොට |
| ,, | 34 | නාංහවා | නාංවා |
| 24 | 5 | සිඅලු | සියලු |

| පිට | පෙල | අසුඬ | සුඬ |
|---|---|---|---|
| 24 | 24 | වීපිමශෙන | වීපීමංගග |
| 25 | 20 | සංවිවව | සංවිවව |
| 26 | 25 | විරූවිරූපාක්‍ෂ | විරූපාක්‍ෂ |
| 27 | 13 | පිහිටුවසතරා | පිහිටුවා සතර |
| ,, | 20 | බුදුන්වැද | බුදුන්වැඳඑකත්පස්වහුන් තාංහුය |
| 28 | 23 | උපාසකයන්ද | උපාසකයන්වද |
| 29 | 4 | සතවරම් | සතරවරම් |
| 30 | 25 | රෞද්‍රවූ | රෞද්‍රවූ |
| 31 | 13 | අඞනාගා | අඞගා |
| ,, | 17 | නිසණ්ඩුය | නිඝණ්ඩුය |
| ,, | 33 | බොහොතතිව්‍ය | බොහෝ කතීව්‍ය |
| 32 | 8 | භිකෙඛවෙ | භික්ඛවෙ |
| ,, | 11 | ආනාටියනම් | ආටානාටියනම් |
| ,, | 28 | ව්‍යඤ්ජන | ව්‍යඤ්ජන |
| ,, | 29 | පුහුණුනොකොට | පුහුණුකොට |
| ,, | 29 | ගරුකොට | ගරුනොකොට |
| 34 | 1 | දුකකාටිං | දුකකාටිං |
| ,, | 30 | පරිත්තසුත්තංවා | පරිත්තසුත්තංවා |
| 36 | 2 | තත්පරිසුඬංඥාසන | තත්පරිසුඬංඥාසනං |
| 37 | 12 | ගහනී | ගහනීා |
| 38 | 33 | පණ්ණකාරත්ථාය | පණ්ණාකාරත්ථාය |
| ,, | 37 | ආණංකරිස්සාමිති | ආණංකරිස්සාමාති |
| 40 | 11 | පින්කමෙන් | පින්කමෙක් |
| ,, | 16 | පින්කමෙන් | පින්කමෙක් |
| ,, | 20 | ධනවිරදම්කොට | ධනවියදම්කොට |
| 44 | 30 | උරම්භ | උපාරම්භ |
| 45 | 35 | සංක්‍ෂිප්තයෙන්ද | සංක්‍ෂිප්තයෙන් |
| 46 | 12 | වෙබුයයි | වෙවූයයි |
| 47 | 16 | අවවෙනි | අටවෙනි |
| ,, | 19 | විචාල්‍ය | විචාලේ්‍ය |
| ,, | 23 | අරබසා | අරබයා |
| 47 | 26 | කුමාරය | කුමාරයා |
| ,, | 37 | විනාසකොට | විනාසකොට |
| 48 | 3 | කල්ගී | කල්හි |
| 50 | 2 | හණ්නතස්ස | ගායන්තස්ස |
| ,, | 11 | කියන් නැහුගේ | ගායනා: කරන්න හුගේ |

| පිට | පෙල | අසුඩ | සුඩ |
|---|---|---|---|
| 50 | 26 | ඇවත් | ඇමැත් |
| ,, | 25 | ගහතබබං | ගනතබබං |
| ,, | 33 | නවචමපි | නචචමපි |
| ,, | 34 | ගවජනතසසදුකකටං | ගචඡනතසසදුකකටං |
| ,, | 35 | දුකකටමෙව | දුකකටමෙව |
| ,, | 36 | ගිරං | ගිරා |
| 51 | 2 | නටත්තාවුහෙ | නමත්තාවුගෝ |
| ,, | 18 | නවටටති | නචචති |
| ,, | 22 | පසසෙතාපි | පසසනතොපි |
| ,, | 31 | නෘකාාදිය | නෘතාාදිය |
| 52 | 4 | ගිගිවිනයෙහි | ගිහිවිනයෙහි |
| ,, | 15 | විසප්‍රකාර | සර්වප්‍රකාර |
| ,, | 34 | අනුමෙනාදත්වනාලද්දේය | අනුමොදත්වනලද්දෙය |
| 53 | 14 | නපටිශනහෙතබබං | නපටිගගහෙතබබං |
| ,, | 23 | ශෙලාක | ශෙළාක |
| ,, | 28 | සද | මද |
| 54 | 7 | ගණ හිසසනතීනි | ගණිහිසසනතීති |
| ,, | 29 | උතතාමෙහි | උනනාමෙහි |
| ,, | 30 | සන නාමෙති | සනනාමෙති |
| ,, | 32 | බොවාති | බොවති |
| ,, | 33 | ගමතීදුවති | හමතබොවති |
| 55 | 20 | හක්තාගුවමෙතගිදි | හතතගනවමෙතහිදි |
| 56 | 30 | පිලිමෙතාහත | පිළිමෙතාගත |
| ,, | 31 | සාත්‍රසද | පාත්‍රසද |
| ,, | 35 | ශබද | ශබ්ද |
| ,, | 37 | හමෙහතාගු වත | හක්තාගුවුනන |
| ,, | 37 | එකහයින් | එහෙයින් |
| 57 | 4 | ගෙණමුත් | ගෙණවුත් |
| ,, | 32 | අප්පදුක් | අපාදුක් |
| 58 | 1 | යථාහත | යථාහතං |
| ,, | ,, | තමාමෙනතබබ | නමාමෙනතබබා |
| ,, | ,, | ප්‍රතිපතති | ප්‍රතිපතති |
| 59 | 19 | සමෙබාධි | සමෙබාධි |

# පරිත්‍රාණ ප්‍රශ්නය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1 යස්සාණා සතසහස්සෙසු චක්කවාළෙසු කොටිසු
වත්තතෙ ධම්මරාජස්ස නමො තස්ස සිරිමතො.
2 නත්වා දූරසද්දං බුද්ධං ධම්මඤ්චාපි සුදෙසිතං
සඞ්ඝඤ්ච නරදෙවස්ස පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
3 විලියොනත්‍යාභිධානෙන පරිත්තාණෙසු කඞ්ඛිනා
වාහලතන්තිගොත්තෙන යොගතෙන සුධීමතා
4 පරිත්තකාරණමාරබ්භ පෙසිතං පඤ්හලෙඛණං
දිස්වාහං සහ ධම්මෙන විස්සජ්ජෙය්‍යං සමාසතො

ශ්‍රීසම්‍යක් සම්බුද්ධාදි තුනුරුවන් සරණ පරායනකොට ඇති හේවාගම් කොරළයෙහි පල්ලෙපත්තුව බද උතුරු තලඞ්ගම පදිංචි වාහලතන්ත්‍රිගේ විලියොන් ප්‍රේරා අප්පුහාමි විසින් වර්‍ෂ 1909 ක්‍රි.ව. නොවැම්බර් මස 14 වෙනිදිනදී කොට්ටාවේ බෞද්ධ තාපසාරාමාධිවාසී බැලගම සුබොධානන්ද බෞද්ධතාපසවන මා වෙතට ලියා අසාඑවන ලද පරිත්‍රාණ ප්‍රශ්නලෙඛණය ලද්දින් මේ වර්තමාන කාලයෙහි ගිහිපැවිද්දන්ගේ පවත්නාවූ ආගම විරොධ විපරීතදෘෂ්ට්‍යාදිය පහකරවීමට මෙය අත්‍යන්තොපකාරීයයි සලකා යට කී සුබොධානන්ද වන මා විසින් ලොකයාටද හිතපිණිස වන පරිද්දෙන් ධර්‍මවිනයාගත පෙළ පාඨාදිය නිදර්‍ශන කොට මෙහි මතු දක්වනු ලබන ක්‍රමයෙන් පරිත්‍රාණ ප්‍රශ්නයෝ විසඳන ලද්දහුයයි දතයුත්තේය.

මෙහි පළමුකොට මහත්මයා විසින් මා වෙත එවනලද පරිත්‍රාණ ප්‍රශ්නලෙඛණය දක්වනු ලැබේ.

වර්‍ෂ 1909 ක්‍රි.ව. නොවැම්බර් මස
14 වෙනිදින උතුරු තලංගමදීය.

තිසරණාධාරශ්චිවායි ආශිංසනය කොට අභිවාදන පූර්‍වාඞ්ගවූ
මෛත්‍රී චිත්තයෙන් බැලගම සුබොධානන්ද
ස්වාමින්වහන්සේ අතින් විචාරා ලියා එවන වගනම්.

ස්වාමින්වහන්ස,

අප ලක්දිව ගිහිපැවිද්දෙ ඒ ඒ ග්‍රාමනගරාදියෙහි බොහෝ වෙහෙරවහන්සි දරමින් විසිතුරු පින්තූරවලින්හා අලංකාර විකාර

රූකඩාදියෙන් පිට මණ්ඩපයද මනාකොට සරසා විසිතුරුවට කර කැරවන මැද මණ්ඩපාදියෙන් යුක්ත පිරිත් මඩු තනාගෙණ එහි පිරිත්කිමෙහි දක්ෂපක්ෂ භික්ෂූන්හා හෙවිසි බෙර තාලාකාරාදීන් ගෙන්වා ඒ ඒ ගම් නියම්ගම් වලට දන්වා හැර දනොපකරණ ගෙන්වා දෙවමින් නිතර පෙළහර කරවමින් මහ පිරිත් පින්කමයයිකියා සතියක් හෝ සතිගණනක් හෝ පින්කමක් කරති එහි දොරකඩ අස්න කියවීමට දෙවදූතයෙක් හා අනුසාසනාදිය කියවීමට භික්ෂූන්ද සම්මත කොට පිරුවාණ පොත තබාගෙණ යුග පිරිත් ආදිය කියා අවසානයෙහි දොරකඩ අස්නාදියද නිමවුවාට පසු සතරහම බැගින් වැඩහිඳ ශරීරයෙහිඇති ශක්තිය පමණින් හමාරයයිකියා පිරිතක්කියති එහිදී ශක්තිය ඇත්තෝ ජයගණින්යයි අපට හැගෙයි—තවද මෙබඳු පිරිත් පින්කාම් පිරිත පේකළ වෙලෙහි පටන් අනුපසම්පන්නයෙකුට මණ්ඩපය තුලට වදින්නද නොදෙන්නාහුය — එහෙයින් මේ පිරිත් පින්කමද භික්ෂූන්ට අනුදත වදාල පොහොය පවාරණාදි ගරුවූ විනය ප්‍රඥප්ති අතුරෙන් එකෙකැයි හැගේ—ස්වාමීන්වහන්ස නැක හෙයින් අපි මේ පිරිත් පින්කම සඳහා මෙහි පහත සඳහන්කරණු ලබන ප්‍රශ්න 14 විචාරමු අනුකම්පා උපදවා ආශම නියායෙන් ඊට කාරණා සහිත පිළිතුරු ලියාදෙනමෙන් ඉතා යටහත් භාවයෙන් ඉල්ලා සිටිමු,

1 ප්‍රශ්නය,—පිරිත් කිරීමය යන්නෙහි අර්ථය කුමක්ද.

2 ඒ පිරිත කී ආකාරයකින් ලොකයෙහි පවතීද,

3 කවරාකාරයකින් ලෝක යෙහි පවත්නාවූ පිරිතක් ශ්‍රෙෂ්ට වශයෙන් සලකා කරවාගැණිම වරද සහිතවේද,

4 කවරාකාරයකින් ලෝකයෙහි පවත්නාවූ පිරිතක් ශ්‍රෙෂ්ට වශයෙන් සලකා කරවා ගැණීම නිවරදි වේද,

5 පිරිත් පිණිස කියයුතු අග්‍ර සූත්‍රධර්මයෝ කවරහුද,

6 ධර්මවිනයෙහි ඒ පිරිත් ධර්මයන්ගේ ආනුභාවය කෙසේ දක්වන ලද්දේද,

7 ඒ පිරිත් ධර්මයෝ කවරකාලෙක කවරතැනකදී කවරෙකු විසින් කුමක් පිණිස වදාරණ ලද්දාහුද,

8 පිරිත් කිරිම පිණිස ආරාධනාවක් පැමිණි කල්හි භික්ෂූන් විසින් කෙසේ පිළිපැදිය යුතුවේද,

9 සතියක් මුළුල්ලෙහි පිරිත් කියමනට නියමය ඇත්තේ කවර තැනකදී කුමක් පිණිසද:

10 සතිය මුළුල්ලෙහි පිරිත් පිණිස කියයුතු සූත්‍රයෝ කවරහුද,

11 ආටානාටිය පිරිත කියන භික්ෂුව විසින් කෙසේ පිළිපැදිය යුතුවේද,

12 මෙකල අප්ලක්දිව සතිහණින් මුළුල්ලෙහි කරන්නාවූ පිරිත් පින්කම් ආගමානුකූල පින්කමෙක්ද,

13 පිරිත් පින්කම් ආදියෙහි භෝජන ශාලාවල වැඩසිඳ පිගන් තැටිවල දත් වැලඳීම භික්ෂූන්ට අනුදැන වදාළ චාරිත්‍රයක්ද

14 යමකිසි මෙකල කරන්නාවූ පිරිත්පින්කම කරන කරවන ගිහි පැවිදි දෙපක්ෂයට පරලොවුහිදි ලැබෙන විපාකානිසංසය කෙසේද,

ස්වාමින්වහන්ස මෙකී ප්‍රශ්න 14 ට ආගම් නියායෙන් පිළිතුරු ලියාදෙනමෙන් නැවත නැවතත් ඉතා යටහත් භාවයෙන් ඉල්ලා සිටිමු.

මෙම්විගම,

තලන්ගම පදින්චි වාහල තන්ත්‍රීගේ

විලියම් ප්‍රේරා අප්පුහාමි විසිනි.

විලියම් ප්‍රේරා.

---

## 1, පලමුවෙනි ප්‍රශ්නය.

මෙවිසි මහත්මයා විසින් අසා එවනලද පිරිත් කිරීම සම්බන්ධවූ ප්‍රශ්නයන් තුද්දස අතුරෙන් පිරිත්කිරීමය යන්නෙහි අර්ථය කුමක්ද යන පලමුවෙනි ප්‍රශ්නයට පිළිතුරනම් —පරිතමන්ත තොතායති රක්ඛතීති පරිත්තං, යනු නිර්වචනහෙයින් හාත්පසින් ආරක්ෂාකරානුයි. පරිත්ත නම්වේ එහෙයින් හාත්පසින් ආරක්ෂා කිරීම පිරිත් කිරීම නම්වේයයි දතයුත්තේය.

## 2. ප්‍රශ්නය.

ඒ පිරිත කී ආකාරයකින් ලොකයෙහි පවතීද යන්නෙහි විස්දිමනම් ඒ පිරිත හෙවත් ඒ ආරක්ෂාව බාහිර රක්ෂාවය ශාසනිකා රක්ෂාවයයි කියා දෙපරිද්දකින් ලෝකයෙහි පවතීය යනුයි—මෙහි බාහිරා රක්ෂාවය යනු කුමක්ද – ශාසනිකා රක්ෂාවය යනු කුමක්දයි ප්‍රශ්නයෝ දෙකෙක්ද වෙති—එහි බාහිරා රක්ෂාව නම් රොග මනුෂ්‍ය රාජ චෞර සිංහ ව්‍යාඝ්‍රාදි භයක් පැමිණි කල්හි සකන්ධකුමාරය ඊශ්වරය විෂ්ණුය, විභීෂණය, දෙවොල්ය, පත්තිනිය, යන මේ ආදි දෙවිවරු ඒ සියලු භයොපද්‍රවයන්ගෙන් මේ සත්‍වයාට සුවඑලවාදීමට සමර්ථයෝ යයි ශ්‍රේෂ්ඨවශයෙන් සලකා මට දෙවියන්ගේ පිහිටය කියමින් සිතමින් ඔවුන්ට අභිවාදනය කිරීමය ඇඳිලි බැඳ නමස්කාර කිරීමය මල්බුලත් පුටු යහන් ආදියකොට දෙලසිදවීනි දීමය

ඔවුන්ට බාරහාර වීමය අභ්‍යවුද එබඳුවු ජපහොමාදිය කිරීමය යන මේ ආදිය බාහිර රක්ෂාව නම්වේ—ශාසනිකා රක්ෂාව නම් බුද්ධාදි රත්නත්‍රයම දෙවිමිනිසුන්ගේ සියලු භයදුඃඛදුර්ගති පරික්ලේශයන් නසා සත්ත්වයාට සුවඵලලබාදීමට සමර්ථයයි ශ්‍රේෂ්ඨ වශයෙන් සලකා ඒ තුනුරුවන්ට අභිවාදන අඤ්ජලිකර්මාදිය කිරීමය ඒ තුනුරුවන් සරණකොට යාමය ගුණ සිහිකිරීමය—යන මේ ආදිය කිරීම හා සියලුම ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි මනාකොට පිහිටීමද ඒ ඒ පරිත්‍රාණ සූත්‍රවලින් පිරිත්කරගැනීමද ශාසනිකා රක්ෂාව නම් වේයයි දත යුත්තේය.

## 3. ප්‍රශනය.

කවරකාරණයකින් ලෝකයෙහි පවත්නාවූ පිරිතක් ශ්‍රේෂ්ඨවශයෙන් සලකා කරවාගැනීම වරද සහිතවේද යත්හොත් විසඳීම නම් යටකී ශාසනිකාරක්ෂාවට වඩා බාහිරාරක්ෂාව පිහිට ඇතැයි ශ්‍රේෂ්ඨ වශයෙන් සලකා ඒ ආකාරයෙන් ලෝකයෙහි පවත්නාවූ ආරක්ෂාව කරවා ගැනීම වරද සහිතවේ කුමක් හෙයින්දයත් මේ ලෝකයෙහි පැමිණෙන්නාවූ රෝගා මනුෂ්‍යාදි භය නසාගැනීමද ශාසනිකා රක්ෂාවට වඩා ඒ බාහිරා රක්ෂාව ශ්‍රේෂ්ඨයයි සලකන්නාවූ ගිහියන්ගේ ඒ සිත උපන් කොණෙහිම සරණාගමනයද, සෙට්ඨවසෙනෙව ගණ්හති සෙට්ඨවසෙන ගිණ්හති, යනු කී නයින් සාවද්‍ය භේදයෙන් බිඳීමට පැමිණෙ මරණින්මතුද නරකයෙහි උපදින්නාහුමය, යමෙක් රෝගයක් පැමිණි කල්හි පළමුව ඒ රෝගයට බෙහෙත්කරමින් සිටි වෙදුව හැරදමා අන්‍ය වෙදෙක්ව සොයාගත්තේනම් ඒ මුලින් බෙහෙත්කළ වෙදුට වඩා පසුව සොයා ගත්නාවූ වෙද මේ රෝගය සුව කිරීමට සමර්ථයෙකැයි ශ්‍රේෂ්ඨවශයෙන් සලකාම සොයා යන්නේය. එසේ යමෙක් යම් කිසි රෝගාමනුෂ්‍යාදි භයක් පැමිණිකල්හි ශාසනික උත්තමාරක්ෂාව හැරදමා යටකී බාහිරා රක්ෂාව කරගත්තේනම් ඒ විෂ්ණු විභීෂණාදී භූතයෝ ශ්‍රේෂ්ඨයෝයයි සලකාමැයි, එහෙයින් එසේ සලකන්නවුන්ගේ සරණාගමනයද සාවද්‍යභේදයෙන් බිඳෙන්නේමයයි දතයුත්තේය—මොවුන්ට මෙසේ ශ්‍රේෂ්ඨවශයෙන් සැලකීමට හේතුවනම් රත්නත්‍රයාගේ ගුණ නොදැනීමමවේ එහෙයින් මෙකල තුනුරුවන්ගේ ගුණ නොදන් ගිහි පැවිද්දෝ මෙලොවට දෙවියන් පරලොවට බුදුන් යනාදි මිසදිටු වචන ප්‍රකාශ කරමින් යම්කිසි රෝගාමනුෂ්‍යාදි භයක් පැමිණිකල්හි මට දෙවියන්ගේ පිහිටයයි සිතමින් කියමින් තුන්ලොවට පිහිටඇති අග්‍රවූ රත්නත්‍රය ලාමක වශයෙන් සිතා හැරදමා ලාමකවූ භූතයන් ශ්‍රේෂ්ඨකොට ගෙණ ස්කන්ධ කුමාරයාය, ඊශ්වරයාය, විෂ්ණුය, විභීෂණය, දෙබොලය,

පත්තිනිය, රත්වල මුත්තාය, කොහොඹ යකාය, මොරටුවෙ යකාය යනාමේආදී භූතයන්ට අභිවාදනයද, ඇඳිලි බැඳ වැඳීමද, මල් බුලත් පුටු, මල් යහන් ආදිය සංවිධානයකොට දෙල පිදවිනි ආදිය දීමද රූප පූනනූල් කිරිබත් කිරිකල මල්වට්ටි තෙල්පහන් රතුතිර සුදු තිර තිල්තිර යනාමේආදිය බාරහාර වීමද, ඒ භූතයන්ගේ ගුණ බල ප්‍රකාශවත මන්ත්‍ර ජපකිරිමද, වෙනත් එබඳු බලිබිලි තොවිල් යන්ත්‍ර මන්ත්‍රාදියද කරන්නාහුය—මෙසේ කරන්නවුන්ගේ මේ දුශ්ශීල කර්මය දශඅකුසල කර්ම පර්‍යාට අයත් මිථ්‍යාදෘෂ්ටියනම්වේ. මේ කාරණය අඪ්ඨසාලිණී නම් අටුවාවෙහි—මිච්ඡාදිට්ඨි සහගතෙන ඛන්ධ සිවාදයො සෙට්ඨාති තෙසං අභිවාදන අඤ්ජලීකම්ම භූත පීඨක පරිභණ්ඩාදීනිකරොති තදුකම්මං මනොකම්මංහොති වාරං පනකාය වාරං, එවං අකුසලං මනොකම්මං කායවාරෙ සමුට්ඨාති චෙතනා පනස්ස අබ්බොහාරිකා—යනාදිනයින් දක්වනලද්දේය. මෙහි භාවය—මිථ්‍යාදෘෂ්ටි සහගත චිත්තයෙන් ස්කන්ධ කුමාරයාය, ඊශ්වරයාය, විෂ්ණුය, විභීෂණය යනාමේආදි භූතයෝ ශ්‍රේෂ්ඨයෝයයි සලකා ඔවුන්ට අභිවාදනය කිරිම ඇඳිලිබැඳ වැඳීම භූතපීඨක සංවිධානය හෙවත් මල් බුලත්පුටු සංවිධානය කිරීමය ( ඒ ඒ ස්ථානයෙහි ඒ භූතයන්ට සත්කාරාදිය පිණිස ) ගොම ආලේප කිරීමය යනාමේ ආදිය කරයිද එකල්හි (ඔහුගේ) ඒ මිථ්‍යාදෘෂ්ටි කර්මය මනොකර්මය නම්වේ—වාරය වූකලී කායවාරය වේ. මෙසේ (මිථ්‍යාදෘෂ්ටිය නම්වූ) අකුශල මනොකර්මය කායවාරයෙහි නැගේ. මෙසේ කායවාරයෙහි නැංගාවූ මිථ්‍යාදෘෂ්ටිමනොකර්මයෙහි චෙතනාවවූකලී අබ්බොහාරික වේය යනුයි—මෙහි අටුවා පාඨයෙහි—ඛන්ධසිවාදයො-යන තැන්හි ඛන්ධානි ඉස්සරසපුත්තා, යනුකීහෙයින් ඛන්ධ යනු ඊශ්වරයාගේ පුත්‍රයායයි කියනලද කඳකුමරු නම්වේ. එහෙයින් අභිධානප්‍රදීපිකාගෙහි, කුමාරොතු ඛන්ධොසත්තිධරොහ චේ-යන්නෙන් දක්වන ලද්දේය—මෙහි ආදි ශබ්දයෙන් විෂ්ණු විභීෂණ දෙවොල් පත්තිනි ආදි සියලුම භූතයො ප්‍රකාශ වන්නාහුය—මේ භූතයෝ ශ්‍රේෂ්ඨයෝයයි මොවුන් කෙරෙහි භක්තිය ඇත්තාවූ සියලු ගිහිපැවිද්දෝ මිථ්‍යාදෘෂ්ටිකයො නම් වෙති, ඔවුහු ඒ මිථ්‍යාදෘෂ්ටිය සටකිසේ ඒ අචිද්‍යුෂ්‍ය භූතයන්ට වැඳීම්පිදීම් මල්බුලත්පුටු මල්යහන් ගොමපිරිබඩගෑමාදිය කිරීමෙන්ද සුවඳදුම් මල්පහන් පූජාකිරීමාදි සියලුබලිබිලිකර්ම කයින් කිරීමෙන් කායවාරයෙන්ද, ඒ විෂ්ණු විභීෂණ දෙවොල් පත්තිනි ස්කන්ධ කුමාරාදීන්ට බාරහාර වෙත්ද, දෙල පිදවිනි දීපියවු, සියලු යන්ත්‍ර මන්ත්‍ර ජප හොමාදිය කරවූ, ඒ විෂ්ණු විභීෂණාදි දෙවියො ලොකයා විසින් සත්කාර ගරුකාර වන්දනාමාන පූජා කටයුත්තොයයි අනුන්ට නියොග කිරීමෙන් වාග්වාරයෙන්ද ඒ භූතයො යම්කිසි භය

කින් තෑතිනත්කල්කී ලෝකයාට පිහිටවීමට සමර්ථයෝයයි විශ්වාස කිරීමෙන් මෙනා භාරයෙන්ද සිඩකරගත්තාහුය—මෙසේ ඒ මිථ්‍යා දෘෂ්ටිය චාරිත්‍රයෙන්ම සිඩකරගැණීමෙන් තුන්ලොවට පිහිටඇයි ශාසනයද නසා දෙවියන් සහිත ලෝකයාට මහානාර්ථකාරයෝවී—මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ ද්වින්නංගතීනං අඤ්ඤතරාගති පාටිකඞ්ඛා නිරයොවා තිරච්ඡානයොනිවා—යන්නෙන් මහණෙනි මිථ්‍යාදෘෂ්ටිකයා විසින් සංජීවකාලසූත්‍රාදි නිරය හෝ බලු කවුඩු කුකුල් හූරු ආදී තිරශ්චීන යෝනිය හෝ යන ගති දෙක අතුරෙන් එක්තරා ගතියක් කැමතිවිය යුත්තියයි වදාළ නයින් මරණින් මතු සතරඅපා ගතවන්නාහුමයයි දතයුත්තේය—තවද මේ කාරණය—

බහුංවෙ සරණං යන්ති පබ්බතානිවනානිච
ආරාම රුක්ඛ චෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා
නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණ මුත්තමං
නෙතං සරණ මාගම්ම සබ්බ දුක්ඛා පමුච්චතී'ති.

යන පරික්ඛිත්තසූත්‍රයෙන් දතයුත්තේය-භාවය-ඒ ඒ රෝගා මිනුෂ්‍ය රාජ චෞරාදි භයින් තැතිගත්තාවූ බොහෝ මනුෂ්‍යයෝ ඒ ඒ රෝගා මනුෂ්‍යාදි භයින් මිදෙනුකැමැත්තාහු පුත්‍රලාභ ධනලාභාදි ලාභයන් හෝ පතන්නාහු ඒකාන්තයෙන් ඉසිගිලි වෙපුල්ලවේභාරාදි පර්වතයන්ද මහාවන ගොසිඞ්ග සාලවනාදි වනයන්ද වේළුවන ජීවකම්බවනාදි ආරාමයන්ද උදෙනි චෛත්‍ය ගෞතමචෛත්‍යාදිවෘක්ෂචෛත්‍යයන්ද පිහිටකොට යන්නාහුය—ඒ සියලුම පිහිටය නිර්භය පිහිටක් නොවන්නේමය, උත්තම පිහිටක් නොවන්නේමය, ඒ පර්වතාරණ්‍යාදි ස්ථානවලින් දක්වනලද දෙවතාවන් පිහිටකොට පැමිණ ජාත්‍යාදි සියලු දුකින් නොමිදෙන්නේය යනුයි—මෙසේ බුදුන් විසින් මේ පරික්ඛිත්ත සූත්‍රයෙන් නහනම් කරණලද බව නොදැන හෝ ඒ බුද්ධ වචනය නොඅදහමින් හෝ මේකාලයෙහිද බොහෝ ගිහිපැවිදි මනුෂ්‍යයෝ ඒ ඒ රෝගා මනුෂ්‍යාදි දුකින් භයින් මිදෙනු පිණිසද පුත්‍ර ධන ලාභාදිය ලබාගැණීම පිණිසද අප ලක්දිවෙහිවූ සමනනකූට පර්වතාදි පර්වතයන්ද අයෝධ්‍යාසකාදි වනයන්ද කඩුවෙල නාගමු ආදී දෙවාලයන්ද බෙල්ලන්විලාදි චෛත්‍ය වෘක්ෂයන්ද විෂ්ණු විභීෂණ ස්කන්ධ කුමාරාදීන්ගේ ප්‍රතිමා රූපයන්ද පිහිටකොට සලකා පඬුරු ගැට ගසමින් බාරහාර වෙමින් පිහිටකොට යන්නාහුය. ඔවුහු ඒ මිථ්‍යාදෘෂ්ටි සමාදානයෙන් මෙලොව් පමණක්නොව පරලොව සතර අපා දුකින්ද නොමිදෙන්නාහුයයි දතයුත්තේය—තවද අප බුදුන් විසින්—

අරඤ්ඤෙ රුක්ඛමූලෙවා සුඤ්ඤාගාරෙව භික්ඛවො
අනුස්සරෙථ සම්බුද්ධං භයං තුම්හාකනොසියා

නොචෙ බුද්ධං සරෙය්‍යාථ ලොක ජෙට්ඨං නරාසභං
අථ ධම්මං සරෙය්‍යාථ නිය්‍යානිකං සුදෙසිතං
නොචෙ ධම්මං සරෙය්‍යාථ නිය්‍යානිකං සුදෙසිතං
අථ සඞ්ඝං සරෙය්‍යාථ පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
එවංබුද්ධං සරන්තානං ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවො
භයංවා ඡම්භිතත්තංවා ලොමහංසො නහෙස්සතී ති—

යන්තෙනත් මහණෙනි ආරණ්‍යයෙක්හිහෝ වෘක්ෂමූලයක් සමීපයෙහි හෝ ශූන්‍යාගාරයෙක්හි හෝ (යම්කිසි භයක් පැමිණිකල්හි) සම්‍යක් සම්බුද්ධවූ සර්වඥයා සිහිකරවු (එසේ සිහිකිරීමෙන්) තොපට රාජ චෞර මනුෂ්‍යාමනුෂ්‍ය සිංහ ව්‍යාඝ්‍ර ගජ්නි අශ්වාදි භයෙක් නොවන්නේය. ඉදින් ලොකශ්‍රෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සර්වඥරාජයා සිහි නොක රවු නම් නැවත සුදෙසිතවූ නෛර්‍යාණිකවූ ශ්‍රී සද්ධර්මය සිහිකරවු. ඉදින් නෛර්‍යාණිකවූ සුදෙසිතවූ ශ්‍රී සද්ධර්මය සිහිනොකරවූනම් නැවත නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍රවූ ආර්‍ය්‍ය සඞ්ඝයා සිහිකරවු. මහණෙනි මෙසේ සර්වඥරාජයාද ධර්මයද සඞ්ඝයාද සිහිකරන්නාවූ තොපට යක්ෂ භය රජභයාදි භයෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමොද්ගමන යෙක් හෝ නොවන්නේයයි වදාළබවමුත් එබඳුභයක් පැමිණිකල්හි මෙකල මිසදිටුවන්ගේ ස්කන්ධකුමාර විෂ්ණු විභීෂණ දෙවොල් පත් තිනි රත්වලමුත්තා මොරටුවෙ යකා කොහොඹ යකා ආදි භූතයන් තබා ලොකප්‍රසිද්ධ ශක්‍ර ප්‍රජාපත්‍යාදි මහෙශාඛ්‍ය දෙවතාවන්වත් සිහි කරවු කියා වදාළ තැනක් නැත්තේමය—කුමක්හෙයින්දයත් ඒ ශක්‍ර ප්‍රජාපත්‍යාදී දෙවතාවො පවා රාගය ද්වෙෂය මොහය පහනොකළාහු නම් වෙති. භයවන ස්වභාව ඇත්තෝ වෙති. තැතිගන්නා ස්වභාව ඇත්තෝ වෙති. උත්‍රාසයට පැමිණෙන ස්වභාව ඇත්තෝ වෙති පලා දුවන ස්වභාව ඇත්තෝ වෙති. මෙකල අදහන ස්කන්ධකුමාර විෂ්ණු විභීෂණ දෙවොල් පත්තිනි ආදි අල්පෙශාඛ්‍ය භූතයන් ගැණ කියනුම කවරේද. මේ කෙළලක්ෂයක් සක්වළ මුළුල්ලෙහි ආඥව පවත්නාවූ බුද්ධ වචනය එබඳු බල ආනුභාවයක් ඇතැයියන විශ්වාස මාත්‍රයකුදු නැතිව මෙකල ස්කන්ධකුමාර විෂ්ණු විභීෂණාදි භූතයන් නිසා භයින් මිදීම පිණිස සිතන්නාවූ ගිහිපැවිදි දෘෂ්ටිගතිකයො දුතව රාක්ෂසයෙකුට අසුවීමෙන් භයට පැමිණි පුරුෂයෙක් තුඹසක් දැක අවතාරයෙකැයි භයවී දුවන පුරුෂයෙකුහෙන් පිහිට සොයන් නෙක් වැන්නාහුය. බිය නාමැති හැළෙල ගැලී සිටිනාවූ ස්කන්ධ කුමාර දෙවොල් පත්තිනි විෂ්ණු විභීෂණාදී භූතයන්ට යාඥකිරීම නම් කරවටක්පමණ හැළෙක්හී ගැලී ගිය පුරුෂයෙකුගේ එසේ කර වටක් ගැලීසිටින අන් පුරුෂයෙකුට මාව මේ හැළෙන් ගොඩ දමුවයි

කියා කරන්නාවූ යාඥවක් වැනිවේ. ලෝකයෙහි භයකට පත්වූ අනිකෙක්ව භයින් මුදවා ගැණීමට සමර්ථයෙක් වීමට නම් තමාව පළමුකොට සියලු භයින් මිදුණොත්වී අනුන්වත් මුදවාගැණීමට සමර්ථවූ ආනුභාවයක් ඇතිකෙණෙක්ද වියයුත්තේය. එබඳු ආනුභාවයක් ලැබීමත් පූර්වජාතිවල තදනුච්ඡවිකවූ කුශල ධර්මයන්ගේ රැස්කර ගැණීමෙන්ම වන්නේය. එසේ මෙකල දෘෂ්ටිගතිකයින්ගේ ස්කන්ධ කුමාරෙස්වර විෂ්ණු විභීෂණ දෙවොල් පත්තිනි රන්වලමුන්නා ආදි භූතයෝ මේ සත්ව ලොකයාට අනුකම්පා පිණිස අනන්ත ජාතිවල තබා අසවල් ජාතියෙහි සමතිස් පෙරුම්පුරා ඒ හේතුවෙන් සියලු දුකින් භයින් මිදී දූත් ලෝකයෙහි පහළවී පූර්ණ පාරමි බලයෙන් ලබනලද ආනුභාවය ඇත්තෝවී මේ සත්වයාගේ භය දුරුකරමින් සිටිනාහුයයි කියා දක්විය හැකි ධර්මයක් මෙකල මිථ්‍යාදිට්ඨිවන්ට කල්පාන්තය දක්වා සෙවුවත් නොලැබෙන්නේමය. අප සර්වඥරාජයන් වහන්සේවූකලි ඉම් මහාභද්‍ර කල්පයට විසතාසංඛ්‍ය කල්පලක්ෂයකින් පෙර ලොකයෙහි පහළවූ බ්‍රහ්මදෙව නම් බුදුරජානන් වහන්සේ දැක සතුටුවී මමද බුදුවන්නෙමියි දෘඪතර සමාදානයෙන් සෙදි එතැන් පටන් සතාසංඛ්‍ය කල්පලක්ෂයක් මනොප්‍රනිධානය පුරා පුරාණ ගෞතම බුද්දරජානන්වහන්සේ දැක මමද මෙබඳු ශාක්‍යවංශයෙක්හි ඉපිද බුදුවන්නෙම්වායි වාක්භෙදයෙහි පතා එතැන්පටන් නවාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි වාක්ප්‍රනිධානය පුරා දීපඞ්කර බුද්ධ කාලයෙහි සුමෙධ නම් තාපසව සිඬකරගත් කායප්‍රනිධානයෙහි පටන් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි ඒ දිපංකර බුදුන් ඇතුළුවූ සුවිසි නමක් බුදුවරයන් දැක අධිකතර පූජාවන්කොට ලබනලද විවරණ ඇත්තේ-තිණ්ණෝ තාරෙය්‍යං මුත්තො මොචෙය්‍යං දන්තො දමෙය්‍යං සන්තො සමෙය්‍යං අස්සත්ථො අස්සාසෙය්‍යං පරිනිබ්බුතො පරිනිබ්බාපෙය්‍යං බුද්ධො බොධෙය්‍යං—යන්නෙන් මම එතරවූයේ දෙවියන් සහිත ලෝකයා එතර කරවන්නෙම්වා. මම සියලු ක්ලේශ භයාදියෙන් මිදුනේ ලොකයාද මුදවින්නෙම්වා. මම දමනයවූයේ අනුන්ව දමනය කරවන්නෙම්වා. මම ශාන්තවූයේ අනුන්ද සංසිඳුවන්නෙම්වා. මම අස්වැසිලි ලද්දේ අනුන්ද අස්වසවන්නෙම්වා. මම පිළිනිවන්පෑයේ අනුන්ද පිළිනිවන් පාවන්නෙම්වා. මම බුදුවූයේ අනුන්ටද අවබොධ කරවන්නෙම්වායයි කියනලද සප්ත ප්‍රතිඥාවෙන් යුක්තවූයේ ලෝකානුකම්පා පිණිස දානාදී සමතිස් පෙරුම්පුරා වෙස්සන්තරාත්ම භාවයෙහිදී සත්වරක් මහපොළව කම්පාකොට සත්සතක මහාදානාදිය දී තුසීපුරයට පැමිණ දසදහසක් සක්වළ මහෙශාක්‍ය දිව්‍යබ්‍රහ්මයන්ගේ ආරාධනාවද පිළිගෙණ මිනිස්ලොව ඉපිද වැඩිවිය පැමිණ මහබිනිමක්මන් කොට පැවිදිව සාවුරුද්දක්

මුළුල්ලෙහි දුෂ්කරක්‍රියාකොට සත්වෙනි වර්ෂයෙහි වෙසගපුර්ණපසලොස්වක්දින ඇසතුබෝමුල විජ්‍රාසනාරූඪව වැඩහිඳ අධිෂ්ඨානයෙන් අතුරෙන් අශනැත් පත්වූ දසබිම්බරක් මාරසේනාව හා සමග විරුද්ධව ආවාවූපාපී මාරයාද පරාජයකොට සර්වඥතා සකල ක්ලේශයන් නසා බුද්ධරාජ්‍යයටපැමිණි උත්තමයෙක්වේ. මෙසේ මෙබඳු අග්‍රසර්වඥ රාජයා පිහිටවකොට ගොස් දුරුකරගත නොහැකි තරක් දුරුකිරීමට සමර්ථවූ යකෙක් ගෙපින් අවීචියපටන් මත්තෙහි භවාග්‍රයදක්වාද එපින් අනන්තාප්‍රමාණ ලෝකධාතුද ගිම්කොට කොතැනකවත් නැතිබවට පිටකත්‍රධර්මයම සාක්ෂිවේ. මෙසේ අප ස්වාමිදරුවූ බුද්ධරජතාන්වහන්සේගේ පුන්‍යගුණ තේජානුභාවයන් බලනකල්හී මෙකල සිහිපැවිදි දෘෂ්ටිගතිකයන්ගේ විෂ්ණු විභීෂණ දෙවොල් පත්තිනි කුමාරේශ්වර කොස් නම රාලහාමි, රන්වලමුත්තා, මොරටුවේ යකා, කොහොඹායකා ආදි භූතයෝ, කෙසර සිංහරාජයෙකු සමීපයෙහි සිටිසාවු හිවලෙකු වැන්නාහුය ඡද්දන්ත නම් හස්තිරාජයා සමීපයෙහිවූ මීවස්සෙකු වැන්නාහුය-ධෘතරාෂ්ට්‍රනම් හංසරාජයා සමීපයෙහිවූ කපුටුවෙකු වැන්නාහුය ශක්‍රදිව්‍ය රාජයා සමීපයෙහිවූ පාංශුප්‍රේතයෙකු වැන්නාහුය සක්විති රජු සමීපයෙහිවූ සැඩොල්දරුවෙකු වැන්නාහුය. පනස් යොදුන් හිරුමඬල සමීපයෙහිවූ කනාමැදිරියෙකු වැන්නාහුයයි දතයුත්තේය. එහෙයින් යක් දෙවිවරු ඇදහීමෙන් කරන්නාවූ බාහිරා රක්ෂාව ආගම් විරුද්ධවූ ග්‍රාමක මිථ්‍යාදෘෂ්ටි කර්මයක්බව මෙතෙකින් සැලකිය යුත්තේය යනු යටකී ප්‍රශ්නයාගේ විසඳීමයි.

4—ප්‍රශ්නය,

කව්රාකාරයකින් ලෝකයෙහි පවත්නාවූ පිරිතක් ශ්‍රේෂ්ඨවශයෙන් සලකා කරවා ගැණීම නිවරදිවේද—සත්වෙනි විසඳීම නම් අප්‍රමාණ ගුණ ඇති බුද්ධාදි රත්නත්‍රයම සියලු සත්වයාට මෙලෝ පරලෝ දෙකෙහිම වන්නාවූ සර්වභය දුඃඛදුර්භික්ෂ උපක්ලේශයන් නසා සුවඵල වාදීමට සමර්ථයයි ශ්‍රේෂ්ඨවශයෙන් සලකා ඒ රත්නත්‍රයාගේ ගුණ දන්නා පැහැදී ගුණ සිහිකිරීමය අභිවාදන අඤ්ජලිකර්ම සාමීචිකර්ම කිරීමය සරණයාමය සියලුම ධර්මානුධර්මප්‍රතිපදාවෙහිම නොකොට පිහිටීමය ඒ ඒ පරිත්‍රාණ සූත්‍රවලින් පිරිත්කරවාගැණීමය සහ මේ ආදි ආකාරයෙන් පවත්නාවූ ශාන්තික උත්තමවූ පිරිත කරගැණීමද කරවාගැණීමද අනවද්‍යවේ කුමක් හෙයින්දයත් ඒ රත්නත්‍රයම මෙලෝ පරලෝදෙකින් වන්නාවූ සියලු බිය දුක්නසා සුවඵලවාදීමට සමර්ථහෙයිනි, මෙබඳු උත්තමවූ ශාන්තිකා රක්ෂාව කරගැණීමෙන්

සියලු දුකින් හයින් මිදුනාවූ සත්වයන්ගේ ප්‍රමාණයක් නම් නැත්තේ මය — මෙහි තුනුරුවන් සිහිකිරීම උතුම්වූ පිරිතක්වනබව ධම්ම පදයෙහි.

සුප්පබුද්ධංපබුජ්ඣන්ති සදාගොතමසාවකා
යෙසංදිවාචරත්තොච නිච්චංබුද්ධගතාසති
සුප්පබුද්ධංපබුජ්ඣන්ති සදාගොතම සාවකා
යෙසං දිවාච රත්තොච නිච්චංධම්මගතාසති
සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදාගොතමසාවකා
යෙසංදිවාචරත්තොච නිච්චංසඞ්ඝගතාසති

යත්තෙන් යම් ගෞතම ශ්‍රාවක කෙනෙකුන්ගේ දිවාභාගයෙහිද රාත්‍රිභාගයෙහිද නිරන්තරයෙන් බුදුගුණ අරබයා උපදනාවූ ස්මෘතිය ඇත්තීද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැමකල්හි බුදුගුණ සිහින් සලකා නිදා පුබුදිනා හෙයින් සුවසේනිදා සුවසේ පුබුදිනාහුය-යම් ගෞතම ශ්‍රාවක කෙණෙකුන්ගේ දිවාභාගයෙහිද රාත්‍රිභාගයෙහිද නිරන්තරයෙන් ධර්මය අරබයා උපදනාස්මෘතිය ඇත්තීද ඒගෞතමශ්‍රාවකයො හැමකල්හි සුවසේනිදා සුවසේ පුබුදිනාහුය—යම් කෙණෙකුන්ගේ දිවාභාගයෙහිද රාත්‍රිභාගයෙහිද නිරන්තරයෙන් ආර්‍ය්‍යසංඝයා අරබයා උපදනාවූ ස්මෘතිය ඇත්තීද ඒගෞතම ශ්‍රාවකයෝ හැමකල්හි සුවසේනිදා සුවසේපුබුදිනාහුයයි වදාරණ ලද්දේය—මෙපණකුත් නොව යෙසංපන ඡබ්බිධෙන චිත්තං සුභාවිතංහොති අඤ්ඤෙන රක්ඛාවරණෙනවා මන්තෙනවා ඔසධෙනවා කිච්චංනත්ථි—යත්තෙන් යම් ගෞතම ශ්‍රාවක කෙණෙකුන්ගේ බුද්ධානුස්මෘතිය ධර්මානුස්මෘතිය සංඝානුස්මෘතිය කායගතා සතිය කරුණා භාවනාව මෛත්‍රීභාවනාව යන මේ සය වැදෑරුම් භාවනාවෙන් සිත මනාකොට වඩන ලද්දේනම් ඒ ගෞතම ශ්‍රාවකයන්ට අනිකුදු රක්ෂාවරණයකින් හෝ මන්ත්‍රෞෂධයකින් හෝ කෘත්‍යයක් නැත්තේයයි දක්වනලද්දේය.

තුනුරුවන් වැඳීම උතුම්වූ පිරිතක්වන බව ධම්මපදයෙහි—

අභිවාදන සීලිස්ස නිච්චං වුඩ්ඪා පචායිනො
චත්තාරොධම්මාවඩ්ඪන්ති ආයුවණ්ණො සුඛංබලං

යත්තෙන්ද ප්‍රකාශවන්නේය—තවද තුනුරුවන් සරණකොට සියවුන්ගේ ඒසරණාගමනයෙන් බියදුක් නැසෙන හෙයින් බුද්ධාදිරත්නත්‍රයට සරණය යන නාමයවූයේය—මේකාරණය—හිංසතීති සරණං සරණගතානං තෙනෙව සරණාගමනෙන භයං සන්තාසං දුක්ඛං දුග්ගතිපරිකිලෙසං හනති විනාසෙතීති අථෙතං රතනත්තයස්සෙවනාමං

අභිවචනං—යන්නෙන්, හිංසාකරාතුයි සරණනම්වේ සරණගතවූ වන්ගේ එම සරණගමනයෙන් රාජචෞරාදි භය සන්ත්‍රාසය දුඃඛය දුර්ගතිය පරික්ලේශය නසයි විනාශකරයි යන අර්ථයෙන් තුනුරුවන්ම ම මේ සරණය යන නාමය ඇත්තේයයි කියනලද්දේය—එහෙයින් තුනුරුවන් සරණකොට යාමද ඒ ඒ බියදුක් පැමිණි තැන්හි ඒ සරණාගමනය සිහිකරනැණීමද උතුම් පිරිතක්වේ— මේකාරණය—

නමොතෙබුද්ධ වීරත්‍ථු විප්පමුත්තොසි සබ්බධි
සම්බාධ පටිපන්නොස්මි තස්සමෙ සරණං භව

යනමේ ආදි සඳහිරු පිරිත්වලින්ද

යොචබුද්ධඤ්චධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණංගතො
චත්තාරිඅරිය සච්චානි සම්මප්පඤ්ඤායපස්සති
දුක්ඛංදුක්ඛසමුප්පාදං දුක්ඛස්සච අතික්කමං
අරියංචට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං
එතංඛො සරණං ඛෙමං එතංසරණ මුත්තමං
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චතීති.

යන මේ ආදි බුද්ධ වචනවලින්ද ප්‍රකාශවන්නේය-නවද ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි මනාකොට පිහිටීම ඒ ඒ භයින් මිදීම පිණිස පවත්නාවූ පිරිතක් බව

ධම්මොහවෙරක්ඛති ධම්මචාරී
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
නදුග්ගතිං ගච්ඡති ධම්මචාරී

යනාදි වශයෙන් බොහෝ තැන්හි ප්‍රකාශවන්නේය—එහෙයින් සටකී ලාමකවූ බාහිරා රක්ෂාව හැරදමා උතුමවූ තුනුරුවන්ගේ ගුණ සිහිකිරීමාදිවූ පිරිත්වලින් ආරක්ෂාකරනැණීමද සෙසු අනුවූ පරිත්‍රාණ සූත්‍රවලින් පිරිත්කරනැණීමද කරවාගැණීමද කර්මවිපාක හැර සෙසු සියලු උපද්‍රව පහවීමෙන් ඒකාන්ත ලොවිලොවුතුරා සැප එලවන්නාවූ අනවද්‍ය ආරක්ෂාව බව දතයුත්තේය. මෙසේවුවත් මෙම ශාසනයෙහි දූන දූන වැරදිකරමින් හැසිරෙන්නාවූ බුද්ධාපරාධ කාරිවූ ගිහිපැවිදි දුශ්ශීලයෝ විසින් මේ උත්තමවූ ශාසනිකා රක්ෂාව සුවසේ ලබාගත නොහැක්කේමය. කුමක්මෙන්දයත්, යම්සේ මේ ලෝකයෙහි සිතගැණින් වරත්තුවලට සැහවී සිටිනා රාජාපරාධකා රිවූ සොරෙකු විසින් රජනුහරා එලඹ නිර්භය ලබාගතයුතු චෞර

දී භයක් තමාට පැමිණි කල්හිරජ්ජුකරා එලඹ නිර්භයක් ලබාගැණීම හෝ සාක්ෂි කීම ඈපවීමාදියෙන් අහිංසකත්ව මුදවාගැණීම හෝ සුව සේ නොහැක්කේ වේද, එපරිද්දෙන්ම මේ ශාසනයෙහි බුද්ධාපරාධ කාරී දුශ්ශීලයකු විසින් තමාට ආරක්ෂාවා ලබාගැණීම හෝ අනුන්ට පිරිත් කියා ආරක්ෂා කිරීම හෝ සුවසේ නොහැක්කේමයයි සැලකිය යුත්තේය. මෙතෙකින් සතරවෙනි ප්‍රශ්නයාගේ විසර්ජනය නිමවූයේය.

## 5. ප්‍රශ්නය.

පිරිත් පිණිස කියයුතු අග්‍රසූත්‍රධර්මයෝනම් කවරහුද—යත්හට පිළිතුරුනම් ඛන්ධපිරිතය, මෙත්ත සූත්‍රය, ධජග්ග සූත්‍රය, රතන සූත්‍රය ආටානාටිය සූත්‍රය යන මේ ආදී සූත්‍ර ධර්මයෝය යනුයි—

## 6. ප්‍රශ්නය.

ඒ පිරිත් ධර්මයන්ගේ ආනුභාවය ධර්මවිනයෙහි කෙසේ දක්වන ලද්දේද යත්හොත් "ආණාඛෙත්තං කොටිසතසහස්සචක්කවාළ පරියන්තං යං රතනසුත්තං ඛන්ධපරිත්තං ධජග්ගපරිත්තං ආටානාටිය පරිත්තං මොරපරිත්තන්ති ඉමෙසං පරිත්තානං ආනුභාවො වත්තති’ යන්නෙන් බුද්ධරාජානන්වහන්සේගේ ආණාක්ෂේත්‍රය කෙළලක්ෂයක් සක්වළ කෙළවරකොට ඇත්තේය. යම් පමණ තැනෙක්හි රතන සූත්‍රය ඛන්ධපිරිතය ධජග්ගපිරිතය ආටානාටිය පිරිතය මොරපිරිතය යන මේ පරිත්‍රාණයන්ගේ ආනුභාවය පවත්නේද, එපමණ තැන් ආණාක්ෂේත්‍රනාම වන්නේයයි කියනලද හෙයින් මේ පරිත්‍රාණයන්ගේ ආනුභාවය කෙළලක්ෂයක් සක්වළ යන්හි පවත්නාබව දක්වන ලද්දේය යනු විසඳීමවේ. මේ පරිත්‍රාණයන්ගේ ආනුභාවය කෙළලක්ෂයක් සක්වළයන්හි කෙසේ පවත්නේදයත් මේලෝකයෙහි යම් සෘද්ධිවන්තයෙක් ආඥාක්ෂේත්‍රයට ඇතුළත්වූ යම් කිසි සක්වළක සිට තමා පිණිස පිරිත්කොට එහිම අනික් සක්වළකට ගියේනම් මහතෙම කරණලද පිරිත් ඇත්තෙක්වේ, නොහොත් එහි එක් සක්වළකසිට සියලු සත්වයන් පිණිස පිරිත් හළකල්හි එහි දෙවියන් විසින් පරිත්‍රාණය පිළිගතහුකු වී එන් පිරිතෙයි ආනුභාවය ආඥාක්ෂේත්‍රයෙහි සියලුසත්වයන්ටම පැමිණෙන්නේයයි දතයුත්තේය.

## 7. ප්‍රශ්නය.

පිරිත් ධර්මයෝ කවරකලෙක කවරතැනකදී කවරෙකු විසින් කුමක් පිණිස වදාරණලද්දාහුද, යත්හොත් විසඳීමනම්, සටකී පිරිත් අතුරෙන්. විරූපක්ඛෙහිමෙ මෙත්තං යනාදි කඳ පිරිත අතීතයෙහි

මහානුභාව සම්පන්න ඍෂිකෙනෙකුන් විසින් බඳනාලද පිරිතක්වේ
හේ කෙසේදයත්, අතීතයෙහි බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජෙක්
රාජ්‍යයකරණ කල්හි අපමහ බෝධිසත්වෝත්තම කසිරට බමුණු මහසල්
කුලයක ඉපිද වැඩිවිය පැමිණියේ පස්කම්සැප හැරපියා ඍෂිප්‍ර
ව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා හිමවත් පෙ
දෙසෙහි එක් ගංගානිවර්තනයෙක්හි අසපුවක් මවා ධ්‍යාන ක්‍රීඩාකර
මින් ඍෂි සමූහයා විසින් පිරිවරණලදුව වාසය කෙළෙය. එකල්හි
ඒගංඉවුරෙහි නානාප්‍රකාර සර්පජාතීහු ඍෂීන්ට උපද්‍රව කරන්නාහුය
බොහෝ සෙයින් ඍෂිවරයෝ ජීවිතක්ෂයට පැමිණෙන්නාහුය එකල්
හි ඒ ඍෂිවරයෝ බොධිසත්වවූ ගණශාස්තෲවරයාට දැන්වූවාහුය—ඉක්
බිති මහබෝසතානන්වහන්සේ සියලු ඍෂීන් රැස්කරවා ඉදින් නුබ
වහන්සේලා සතරනාරද කුලයන්කෙරෙහි මෛත්‍රීත වැඩූයේනම්
සර්පයෝ නුබවහන්සේලාට දෂ්ට නොකරන්නාහුය එහෙයින් මෙ
තැන්පටන් සතරනාරද කුලයන්කෙරෙහි මෛත්‍රීන්වඩවූයයි රත්
නත්‍රයාගේ අප්‍රමාණ ගුණදක්වා මේ කඳපිරිත බැඳදුන්නේය එතැන්
පටන් ඍෂීන්ට අපාදක ද්විපාදකාදි සතුනගෙන් උපද්‍රවයක් නූයේය
බෝසතානන්වහන්සේද නොපිරිහුණු ධ්‍යානයෙන් බඹලොව උපන්
නේය—අප බුදු රජානන්වහන්සේද සැවැත්නුවර දෙව්රම් වෙහෙර
වැඩවසන කල්හි එම වෙහෙර ගිනිහල්ගේ දොරසමීපයෙහි දරපල
මින් සිටි එක්තරා භික්ෂුවෙකුගේ පය ඇඟිලෙහි පූතිවෘක්ෂාන්තරය
කින් නික්ම අවුත් එක්සර්පයෙක් දෂ්ටකෙළේය. එභික්ෂුව එහිම
කාලක්‍රියාකළේය, එභික්ෂුව කළුරියකළබව සියලු විහාරයෙහි ප්‍රකට
වූයේය. ධර්මසභාවෙහි භික්ෂූහු ඇවැත්නි අසවල් භික්ෂුව ගිනිහල්ගේ
දොර සමීපයෙහි දරපලන්නේ සර්පයකු විසින් දෂ්ටකරණලදුව එහිම
කාලක්‍රියාකළේයයි කථාවක් ඉපදෙවූවාහුය ශාස්තෲන්වහන්සේ වැඩ
මවා මහණෙනි දැන් කවරනම් කථාවකින් හුන්නාහුදයි. විචාරා
මෙනම් කථාවකින්යයි කීකල්හි ඉදින් මහණෙනි එ මහණතෙම
සතරනාරද කුලයන් අරබයා මෛත්‍රිය වැඩූයේනම් ඒ භික්ෂුවට
සර්පයා දෂ්ට නොකරන්නේය, පුරාණ තාපසවරුද අබුදෙධාත්
පාද කාලයෙහි සතර නාරද කුලයන් කෙරෙහි මෛත්‍රියවඩා ඒ
නාරද කුලයන් නිසා උපන් භයින් මිදුනාහුයයි යම්කී වස්තුව වදාරා
අනුජානාමි භික්ඛවෙ ඉමානිචත්තාරි අහිරාජකුලානි මෙත්තෙන
චිත්තෙන ඵරිතුං අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තායාති
යන්නෙන් මහණෙනි තමාට ගුප්තියපිණිස තමාට ආරක්ෂාපිණිස
තමාට පරිත්‍රාණය පිණිස මෙසතරනාරද කුලයන් අරබයා මෛත්‍රීසිත්
පතුරුවන්ට අනුදනිමියයි වදාරා විරූපක්ඛෙහිමෙ මෙත්තං—යනා
දිනයින් මේකඳපිරිත අනුදන වදාළේය-මෙප්‍රකාශවූයේ කඳපිරිතගේ

උත්පත්තියමේ, යටකී නයින් මේ ඛණ්ඩපිරිතෙහි ආනුභාවය කෙළ ලක්ෂයක් සක්වළ මුළුල්ලෙහි පවත්නේවේ එහෙයින් යමෙක් මේ ඛණ්ඩ පිරිතෙන් තමා පිණිස පිරිත් කොට කෙළලක්ෂයක් සක්වල හැම තැන්හි ඇවිදිනේ නමුත් කරණලද පිරිත් ඇත්තෙක්බැවින් සියලුම සතුන් නිසා උපදින්නාවූ භයින්මිදී සුවසේම හැසිරෙන්නේමය. එසේම යමෙක් එක්සක්වළෙක සිට කෙළලක්ෂයක් සක්වල සියලු සතුන් පිණිස මෙයින් පිරිත්කළෙනම් පිරිතෙහි ආනුභාවය ඒ සියලු සතුන්ටම පැමිණෙන්නේය—මෙසේ මෙයින් පිරිත්කරගත්තවුන්ට ගංගා සමුද්‍රාදියෙහි කුම්භිලම කරාදි සියලු ජලචර සත්වයෝද දියගොඩ සියලුම දිව්‍යනාගයෝද සෙසු සියලු නාපොලොන් පිඹුරු මාපිල් ආදි සර්පජාතිහුද රාජචෞරාදි සියලු මනුෂ්‍යයෝද යක්ෂරාක්ෂස ගන්ධර්ව කුම්භාණ්ඩාදි සියලු අමනුෂ්‍යයෝද සියලු පක්ෂිජාතිහුද යන මේ ආදි සියලුම ජලථල ආකාශස්ථ විපාදක සත්වයෝද සිංහව්‍යාඝ්‍ර හස්ති අශ්ව ගවමහිෂ සුනඛසූකර මූෂික ඝරගොළිකාදී සියලුම සිව්පා සත්වයෝද ගෝණුසු කන්වෑයාදි සියලුම බොහෝ පා ඇති සත්වයෝද උපද්‍රවයක් නොකරන්නාහුය මෙකී අපාදකාදි සතුන්ගේ දෂ්ට කීර්ණාදියෙන්වූ විෂට මෙයින් පිරිත්කරන්නේනම් එකෙණෙහිම විෂබන්ධ යාමෙන් සත්වයෝ සුවපත්වන්නාහුමය—එහෙයින් අසහාය විෂහරණ බ්‍රහ්මමන්ත්‍රයක්වූ මේ ඛණ්ඩපිරිත හා සමාන විෂහරණ බාහිර මන්ත්‍රයක් තුන්ලොවම නැතිබව දතයුත්තේය.

## කරණීය මෙත්ත සූත්‍රයාගේ උත්පත්තිය.

තවද කරණීය මෙත්ත පිරිතනම්, එක් සමයෙක්හි බුද්ධරජානන්වහන්සේ වස්එළඹෙන කාලය ළංවූකල්හි සැවත්නුවර වැඩවසනසේක එසමයෙහි නානා නොයෙක් රටවාසීවූ බොහෝ භික්ෂූහු භාග්‍යවත්හු සමීපයෙහි කමටහන්ගෙණ ඒ ඒ තැන්හි වස්එළඹෙනු කැමැත්තාහු භාග්‍යවතුන් වහන්සේකරා එළඹෙන් එකී වනාහි බුද්ධරජතෙම රාගචරිතයන්ට සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වශයෙන් එකොළොස් වැදෑරුම් අසුබකමටහන්ය—ද්වේෂචරිතයන්ට සතර වැදෑරුම් මෙත් ආදි කමටහන්ය මොහචරිතයන්ට මරණානුස්මෘති ආදිකර්මස්ථානයන්ද විතර්කචරිතයන්ට ආණාපාන සතිපඨවිකසිණාදි කර්මස්ථානයන්ද ශ්‍රද්ධාචරිතයන්ට බුද්ධානුස්මෘති ආදිකර්මස්ථානයන්ද බුද්ධිචරිතයන්ට චතුර්ධාතුව්‍යවස්ථානාදි කර්මස්ථානයන්ද යන මේ නයින් චතුරාසීති සහස්‍ර ප්‍රභේදවූ චරිතානුකූල කර්මස්ථානයන් වදාරණසේක, ඉක්බිත්තෙන් පන්සියයක් පමණ භික්ෂූහු බුදුන්ගේ සමීපයෙහි කමටහන්ගෙණ සැපවූසෙනස්නක්ද ගොදුරු ගමක්ද

ගොසමින් අනු පිළිවෙළින් වඩනාහු ප්‍රත්‍යන්තයෙහි හිමවත්හා එක්
බඩවූ නිල්කඳු මිණිවැනි ගල්තලා ඇති සීතල ඝනඡායා ඇති නිල්
වන ලැහැබින් හෙබියාවූ මුතු දූල්පිදිපට වැනි වැල්ලෙන් ගැවසු
නාවූ භූමිභාග ඇති පවිත්‍රවූ මධුරසීතල ජලාශයෙන් පිරිවරණලද
පර්වතයක් දුටුවාහුය. ඉක්බිත්තෙන් ඒ භික්ෂුහු එයි එක්රැයක් වැස
රැය පහන්වූ කල්හි සිරුරු පිරියම්කොට ඊට නුදුරු තැන්හි එක්තරා
ගමකට පිඬුපිණිස වන්හ ඒ ග්‍රාමය තෙම ඝනව පිහිටියාවූ කුල දහස
කින් යුක්තවේ එහි මනුෂ්‍යයෝද ශ්‍රද්ධාප්‍රසන්න ඇත්තෝවෙති ඔවුහු
පසල් දනව්වෙහි පැවිද්දන් දක්නට දුර්ලභ බැවින් ඒ භික්ෂූන් දැකම
හටගත් ප්‍රීතිසෞමනස්‍යය ඇත්තාහු දන්වළඳවා ස්වාමීන්වහන්ස
මෙහිම තුන්මස මුල්ලෙහි විසුව මැනවැයි යාඥකොට ප්‍රධාන කුටි
පන්සියයක් කරවා එහි ඇඳපුටු පානියපරිභොජනියකල ආදි සියලු
උපකරණයන් පිළියෙල කළාහුය, භික්ෂූහු දෙවන දවසෙහි අන්ගම
කට පිඬුපිණිස ප්‍රවිෂ්ටවූවාහුය එහිද මනුෂ්‍යයෝ එසේම උපස්ථාන
කොට වස්විසීමට යාඥකළාහුය භික්ෂූහු අනතරායක් නැතිකල්හි
වසම්හයි ඉවසා එවන ලැහැබට වැද රුදුවල් මුල්ලෙහි පටන්ගත්
නා ලද වීර්‍ය ඇතිව යාම ඝණ්ඩාව ගසා යොනිසො මනසිකාර බහුල
ව වාසය කරන්නාහු රුක්මුල් කරා එලඹ වැඩහුන්නාහුය සිල්වත්
භික්ෂූන්ගේ තෙජසින් නටුවාවූ තෙජස් ඇති වෘක්ෂදෙවතාවෝ තම
තමාගේ විමනින් බැස දරුවන්ගෙණ ඔබිනොබ හැසිරෙන්නාහුය.
යම්සේ වනාහි ගමෙහි නවාතැනට පැමිණි රජුන් විසින් හෝ රජ
මහමැතියන් විසින් හෝ ගම්වැස්සන්ගේ ගෘහයන්හි අවකාශගත්
කල්හි ගෘහවාසී මනුෂ්‍යයෝ ගෙයින් නික්ම අන්තැනෙක වසන්නාහු
කවරකලෙක්හි යෙද්දෙහොයි දුරසිට බලත්ද එපරිද්දෙන්ම දේව
තාවෝ තමන්ගේ විමන්හැර ඔබිනොබ හැසිරෙන්නාහු පින්වතුන්
වහන්සේලා කවරකලෙක යෙත්දෙහොයි දුරසිට බලන්නාහුය
නැවත මෙසේද සිතුවාහුය පෙරවස් එලඹියාවූ භික්ෂූහු අවශ්‍යයෙන්
තුන් මසක් මුල්ලෙහි වෙසෙති අපි වනාහි එපමණකලක් දරුවන්
ගෙණ ඉවත්ව වසන්ට නොහැක්කෙමු එබැවින් අපි භික්ෂූන්ට භය
ජනක අරමුණු දක්වම්හයි සිතා ඒදෙවතාවෝ රාත්‍රීභාගයෙහි භික්ෂූන්
ගේ ශ්‍රමණ ධර්ම කරණවේලාවෙහි බිහි සුණු යක් වෙස් මවා පෙරටු
වෙන් පෙරටුවෙන් සිටිති බියකරු හඬද කරති, ඒ බිහිසුණු රූපදැක්
මෙන්ද ඒ බියකරු යක් හඬ ඇසීමෙන්ද භික්ෂූන්ගේ ළය කම්පාවූ
යේය දුර්වර්ණව පඬුවන්දවූවාහුය එහෙයින් සිත එකඟකරන්නට නො
හැකිවූහ එකඟනොවූ සිත් ඇත්තාවූ භයින් නැවත නැවත සංවෙ
ගය ඇත්තාවූ ඒ භික්ෂූන්ගේ සිහිමුලාවිය ඉක්බිති මුළවූ සිහිඇති ඒ
භික්ෂූන්ට දුගඳවූ අරමුණු යෙදූවාහුය. භික්ෂූහුගේ හිස්මුල් ඒ
දුගඳයෙන් අලලන්නාක් වැනිවිය. බලවත් වෙදනා උපන එත

කුදුවූවත් එපවත් ඔවුනොවුන්ට නොකීවාහුය, නැවත එක්දිනක් සංඝස්ථවිරයන්ට උපස්ථානකරණ වේලෙහි රැස්වූහ එකල සංඝස්ථවිරතෙම ඇවැත්නි මේ වනලැහැබට පැමිණියාවූ නුඹවහන්සේලාගේ සිව්පාහැර කිපදිනක් ඉතා පිරිසිදුවූයේය ඉතාප්‍රභාස්වරවූයේය ඉන්ද්‍රියයෝ ඉතා ප්‍රසන්නවූහ, දැන් වනාහි ඉතා කෘශව දුර්වර්ණව සුදුමැලිවූවාහුය—කිමෙක්ද නුඹවහන්සේලාට මෙහි නොසැපදැයි විචාළේය, ඉක්බිති එක් භික්ෂුකෙනෙක් ස්වාමීනි මම රාත්‍රියෙහි මෙබඳු මෙබඳු බියකරු අරමුණු දක්නෙම්ද අසන්නෙම්ද වෙමි මෙබඳු ගඳකුත් ආඝ්‍රාණය කෙරෙමි එහෙයින් මාගේ සිත එකඟනොවේයයි කීයේය—මේ නියායෙන් සියල්ලෝ එපවත් සැලකළාහුය—එකල සංඝස්ථවිරතෙම ඇවැත්නි බුදුන්විසින් වස්සූපනායිකා දෙකදෙනක් පනවනලද්දාහ අපට මේ සේනාසන නොසැපය ඇවැත්නි බුදුන්ගේ සමීපයට යම්හ එසේගොස් අනික් සප්පාය සේනාසනයක් විචාරම්හයි කීයේය - යහපත ස්වාමීනියි කියා ඒ භික්ෂූහු මහතෙරුන්ගේ වචනය අසා සියල්ලෝ සේනාසුන් හැත්පත්කොට පාසිවුරුගෙණ කුලයා කෙරෙහි නොඇලුනු බැවින් කිසිමමවක්හට කථානොකොට යම් තැනක සැවත්නුවරද එදිසාවට සැරිසරා වැඩියාහුය. ක්‍රමයෙන් සැවැත්නුවරට ගොස් බුදුන් සමීපයට පැමිණියාහුය බුදුහු ඒ භික්ෂූන් දැක මෙපමණත් වදාළහ. මහණෙනි ඇතුළුවස්සෙහි චාරිකාවෙහි නොහැසිරියයුතුයි කියා මා විසින් ශික්ෂාපදයක් පනවනලද්දේය තෙපි කුමක් පිණිස සැරිසරවුදැයි විචාළේය—ඒ භික්ෂූහු බුදුන්ට දැන්වූවාහුය බුදුහු ආවර්ජනා කරණසේක් මුළුදඹදිවුහී යටත් පිරිසයින් සතර පාපුටුවක් තබනා තැනක් පමණවූද ඒ භික්ෂූන්ට සුදුසු අන්සෙනස්නක් නුදුටුසේක, ඉක්බිති ඒ භික්ෂූන්ට මෙසේ වදාළේය—මහණෙනි තොපට අනික් සප්පාය සේනාසනයක් නැත එහිම වාසයකරන්නාවූ තෙපි රහත් බවට පැමිණෙන්නාහුය යව මහණෙනි එම සේනාසන ඇසුරුකොට වාසයකරවු ඉදින් වනාහි දෙවතාවන්ගෙන් අභය කැමැත්තාහුනම් මේ පිරිතඋගණිවු මේවනාහි තොපට පිරිතද කම්ස්ථානයද වන්නේයයි කියා මේ කරණීය මෙත්තසූත්‍රය වදාළසේක, මේ ප්‍රකාශවූයේ මෙත් පිරිතගේ උත්පත්තියවේ මෙහි ගුණානුභාවය නම් යමෙක් සුපිරිසිදු සීලයෙහි පිහිටා උදයාස්තමයෙහි ඒ මේ මෙත් පිරිතෙන් පිරිත්කරන්නෝ නම් නිතර මේ පිරිත වඩන්නෝනම් ඔහු සියලු අමනුෂ්‍යාදි උපද්‍රවලින් මිදී සුවසේම නිදන්නේය—ප්‍රබෝධවන පියුමක්මෙන් නිර්විකාරව සැපසේ පුබුදින්නේය—නපුරු භයජනක ස්වප්න නොදක්නේය—උරෙහි පළඳනාලද මුක්තාහාරයක් මෙන්ද හිසපැළඳි මල්දමක්මෙන්ද මිනිසුන්ට ප්‍රියවන්නේය—මනුෂ්‍යයන්ට

මෙන් අමනුෂ්‍යයන්ටද ප්‍රියවන්නේය මවුපියන් විසින් රක්නාලද පුත්‍රයකුමෙන් දෙවියො ඔහු රක්නාහුය අමනුෂ්‍යයෝ ඔහට භයජනක අරමුණු නොදක්වන්නාහුය. මෙයින් පිරිත්කරගත් සීලසම්පන්න යෙකුගේ ශරීරයෙහි විෂහෝ ගිණිහෝ කඩු තෝමරාදි ආවුධයක් හෝ නොවදින්නේමය--තවද යමෙක් මේපිරිත ආදරයෙන් සේවනය කරන්නේනම් වඩන්නේනම් නැවත නැවත කරන්නේනම් සොදහලද යානාවක් මෙන් කරන්නේනම් ප්‍රතිෂ්ඨානාර්ථයෙන් වස්තුවක්මෙන් කරන්නේ නම් හාත්පසින් පුරුදු කරන්නේනම් සිතින් මනාකොට පටන්ගන්නේනම් ඕහට යම් අමනුෂ්‍යයෙක් චිත්තඋපඝාතයකට යුතුයයි සිතානම් එම අමනුෂ්‍යයාම කලානතයට වෙහෙසට දුකට පැමිණෙන්නේමය, කුමක්මෙන්ද යත් යම් පුරුෂයෙක් අතිශයින් කැපුම් ඇත්තාවූ මුවහත් තබහලද ආයුධ මුවහතට අත්ලෙන් පහරක් ගයා සුණු විසුණු කරන්නෙමියයි පහරක් ගැසූයේනම් එ පුරුෂයාම කලානතයට වෙහෙසට දුකට පැමිනෙන්නාක් මෙනි—තවද සර්වඥශාසනයෙහි තමාට හිතවැඩ කරගැණීමෙහි දක්ෂවූ පුරණලද ප්‍රඥාඅතිශ්‍රාවකයෝ ධම්මිස්සරවූ බුදුන් විසින් වදාරණලද මේ මෙත් පිරිත වඩා උත්තමවූ චිත්තයාගේද ශුද්ධරූපයාගේද සිතල භාව කරණයෙන් සාන්තියයි සංඛ්‍යාවට ගියාවූ ධ්‍යානවිදර්ශනාභිඥා අගින් මාර්ගඥාන සංඛ්‍යාත ආර්ය්‍යධර්මය ලබා ශාන්තවූ නිර්වාණ පදයට පැමිණෙන්නාහුය—එහෙයින් ඒ අමෘතවූ අද්භූතවූ ආර්ය්‍යයන් විසින් කැමතිකරණලද්දාවූ සාන්තවූ නිර්වාණපදයට පැමිණ වාසය කරණු කැමති නිර්මල ශීලසමාධි ප්‍රඥාවෙන් යුක්තවූ නුවනැති ජනයා, කරණීයමත්ථකුසලෙන, යනාදි මේ මෛත්‍රී සූත්‍රය නිරන්තරයෙන් වාක්භේද කරන්නේමය.

## ධජග්ග පිරිතගේ උත්පත්තිය.

ධජග්ගපිරිතනම් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර දෙව්රම වෙහෙර වැඩවසනකල්හි වදාරණලද පිරිතක්නේ 'එහි අට්ඨකථාවෙහිද' ඉදං ධජග්ගපරිත්තං නාමභගවා අචොචයස්ස ආණාඛෙත්ත කොටි සතසහස්ස චක්කවාළෙසු ආනුභාවෝවත්තති, යන්නෙන් මේ ධජග්ග පිරිත නම් භාග්‍යවතුන් වහන්සේ වදාළසේක—යම් පරිත්‍රාණයක් හුගේ ආඥාවක් ඇත්තිද කොටිශතසහශ්‍රයක් චක්‍රවාටයන්හි ඒ ධජග්ග පිරිතගේ ආනුභාවය පවත්නේ වේයයි කියනලද්දේය—තවද එහි අට්ඨකථාවෙහි, ඉදං ආවජ්ජේත්වානි යක්ඛ භය චොරභයාදිහි දුක්ඛයි මුත්තානං අනන්තානන්ත් තිට්ඨතු අඤ්ඤං දුක්ඛවූපසමේනා ඉදං ආවජ්ජමානේනාහි පසන්නචිත්තේනා ආකාසෙ පතිට්ඨං ලභනතීති—යන්නෙන් මේ ධජග්ගපිරිත ආවර්ජනාකොට යක්ෂභය චෞරභයාදිවූ දුක්වලින්

මිදුණාවූන්ගේ කෙළවරක් හැප්පේය. අතින් දුක්ඛයාගේ සංසිඳී මෙසේ තිබෙවා ප්‍රසන්න සිත් ඇත්තාවූ තැනැත්තෝ මේ පිරිත ආවර්ජනා කරණු ලබන්නේ ආකාශයෙහිද ප්‍රතිෂ්ඨාව ලබන්නේයයි මෙහි ආනුභාවය දක්වනු ලද්දේය, මීට නිදර්ශන පිණිස මේ එක්වස්තුවෙක්වෙයි. දීඝවාපි මහා චෛත්‍යයෙහි වනාහි සුධාකර්මය කරණු ලබන කල්හි එක් තරුණ භික්ෂූන්වහන්සේ නමක් මූලවේදිකා පාදයෙන් වැටී සෑ කුසින් බස්නේය එකල්හි යට සිටි භික්ෂුසංඝයා ඇවැත්නි ධජග්ග පිරිත ආවර්ජනා කරවයි කීයේය. ඒ භික්ෂුවද මරණ භයින් තැතිගත්තේ ධජග්ග පිරිතමා රක්වායයි කියේය එකෙණෙහිම ඒ භික්ෂුවට සෑකුසින් ගල්දෙකෙක් නික්ම සෝපානයක්වී සිටියාහුය මුදුනෙහි සිටියෝ වැල්හිණක් බැඳ්සෙවුවාහුය— ඒ භික්ෂුව ඒ වැල්හිණිව ගොවුවී සිටිකල්හි පළමු ගල්දෙක තුබුතැනම සිටියාහුය, මෙසේ මේ ධජග්ග පිරිත ආවර්ජනා කළපමණකින්ම ආකාශයෙහිද ප්‍රතිෂ්ඨාව ලැබෙන්නේයයි දතයුත්තේය. මෙසේ ආකාශයෙහි ප්‍රතිෂ්ඨාව ලැබෙන්නාක්මෙන් සියලුම ගංගා සමුද්‍රාදියෙහිද සොරුන්ගෙන් ගැවසිගත් චෝරකන්තාරය සිංහව්‍යාඝ්‍රහස්ත්‍යාදීන්ගෙන් ගැවසීගත් මාර්ගය ඇති ව්‍යාළකාන්තාරය ස්නානපානාදියට ජලයනැත්තාවූ නිරුදක කන්තාරය යක්ෂරාක්ෂසාදි අමනුෂ්‍යයන් විසින් අධිගෘහීතවූ අමනුෂ්‍යකන්තාරය මූලඛාද්‍යනීයාදීයෙන් විරහිතවූ අල්පභක්ෂ්‍යකන්තාරය යන මේ හැම්තැන්හිදීම මෙ පිරිත ආවර්ජනාකළපමණින්ම පිහිට ලැබෙන්නේමය, ශීලසම්පන්නවූ යමෙක් මේ පිරිත පුහුණුකොට නිතර පිරිත්කරගන්නේනම් කරවාගන්නේ නම් කියනුම කවරේද, නවද මේ පිරිත ආදරයෙන් වඩන්නාවූ ශීලවන්තයෝ මෙලොව සියලු භයින් මිදී සුවලබනවා පමණකුත් නොව පරලොව සියලු සතර අපා භයින්ද මිදී අග්‍රවූ දෙවිමිනිස් සැප හා කෙළවර අමා මහ නිවන් සැපද ලබන්නාහුමයයි දතයුත්තේය—මේ ධජග්ග සූත්‍රයාගේ උත්පත්ත්‍යාදියවේ.

## රතනසූත්‍රයාගේ උත්පත්තියනම්.

බුදුන් ධරමානකාලයෙහි ලිච්ඡවි රජුන්ගේ සර්වසම්පත්තියෙන් සමෘද්ධවූ විපුලත්වයට ගියාවූ වෛශාලිනම් නුවරෙක්වූයේය. එහි වාරයෙන් වාරයෙහි රාජ්‍යය කරන්නා වූ ක්ෂත්‍රිය රජදරුවන් සම්බන්ධවම සත්දහස් සත්සිය සත්දෙනෙක් මහරජ්දරුවෝද, සත්දහස් සත්සිය සත්දෙනෙක් යුවරජවරුද සත්දහස් සත්සිය සත්දෙනෙක් සේනාපතියෝද සත්දහස් සත්සිය සත්දෙනෙක් භාණ්ඩාගාරිකයෝද සිටියාහුය. ඒ රජුන්ගේ සත්දහස් සත්සිය සතෙක් ප්‍රාසාදයෝද සත්දහස් සත්සිය සතෙක් කූටාගාරයෝද සත්දහස් සත්සිය සතෙක් ආරා

මහෝද සත්දහස් සත්සිය සතෙක් මගුල්පොකුණුද ඇතිවූවාහුය. මෙසේ සමෘද්ධසම්පත්තිත් සමුදිවූ එයින් පිරීගියාවූ බොහෝ ජනයා විසින් ගැවසීගත්තාවූ අතිශයින්ම සුභිකෂවූ එව්සාලා මහනුවර මැත කාලයෙහි දුර්භික්ෂවූවාය නපුරු සස්‍ය හටගත්තාහුය එහෙයින් පළමුකොට දිලිදු මනුෂ්‍යයෝ කාලක්‍රියා කළාහුය. ඒ කුණපගන්ධ ප්‍රතික්කූලතාවයෙන් ඒ ඒ තන්හී දමතාලද ඔවුන්ගේ ඒ මිනුණ් කුණපගන්ධයෙන් අමනුෂ්‍යයෝ නුවරටම ප්‍රවිෂ්ඨවූවාහුය. ඒ අමනුෂ්‍යෝපද්‍රවයෙන් අතිශයින් වැඩියක් කාලක්‍රියා කලාහුය එ කුණපගන්ධප්‍රතික්කූල තාවයෙන් අහිවාතකරෝගය හෙවත් මහමාරීරෝගයද උපන්නේය—මෙසේ දුර්භිකෂ මනුෂ්‍යරෝග යන ත්‍රිවිධභයෙකින් උපද්‍රවලත් විසාලා මහනුවර වාසීහු රජුකරා එළඹ මහරජානනි නුවරෙහි ත්‍රිවිධ භයෙක් උපන්නේය මෙයින් පෙර සත්වෙනි රාජකුලපරම්පරාව දක්වා මෙබඳු භයෙක් උපන් විරූ බවක්නැත දැන් නුඹ වහන්සේලාගේ අධර්මිකභාවයකින් උපන්නේයයි හඟිමුයයි දැන්වූවාහුය—එකල්හි රජතෙම සන්ථාගාරයෙහි සියලුදෙනා රැස් කරවා මාගේ අධර්මිකභාවයක් පරීක්ෂාකරවුයයි කීයේය. එකල්හි සියලු නුවරවාසීහු ප්‍රවේණිය පරීක්ෂාකරන්නාහු රජහුගේ කිසි දෝෂයක් නොදුටු මහරජානෙනි දෝෂයෙක් නැත්තේයයි කියා අපගේ මේ භය කෙසේ සංසිඳීමට යන්නේදැයි එක්ව මන්ත්‍රණය කලාහුය එහි සමහරෙක් ඒ ඒ අමනුෂ්‍යයින්ට බලිකර්මකිරීමෙන්ද ඒ ඒ දෙවාලකරා පැමිණ යාඥාකිරීමෙන්ද මඞ්ගල කිරියාවෙන්ද සංසිඳෙන්නේයයි කී කල්හී ඒ සියල්ලදකොට සංසිඳුවාගන්ට නොහැකිවූවාහුය. එකල්හි සමහරෙක් පූරණකාශ්‍යපාදි ශාස්තෘවරයෙක් මහානුභාව ඇත්තෝය එ ශාස්තෘවරයන් මේ නුවරටවත් කල්හි සංසිඳෙන්නේයයි කීවාහුය අන්‍යයෝ සම්‍යක්සම්බුද්ධරජාතන් වහන්සේ ලෝකයෙහි උපන්නේය. එ භාග්‍යවතුන් වහන්සේ සියලු සත්වයාට හිතපිණිස ධර්මදේශනාකරන්නේය මහත්වූ ඍද්ධිඇත්තෝය මහානුභාව ඇත්තෝය උන්වහන්සේ මේ නුවරට වත් කල්හි මේ ත්‍රිවිධභය සංසිඳෙන්නාහුයයි කීවාහුය, ඔවුන්ගේ ඒවචනයට සියලුදෙනා සතුටුවී දැන් ඒ භාග්‍යවතුන් වහන්සේ කොතැන්හී වැඩවසන්නේදැයි කීවාහුය. එකාලයෙහි ශාස්තෘන්වහන්සේ වස්එළඹීමට සමීපවූ කාලයෙහි බිම්බිසාර රජුට ප්‍රතිඥාවදි වේළුවන මහාවිහාරයෙහි වැඩවසන සේක එකාලයෙහි බිම්බිසාර සමාගමෙහි බිම්බිසාර රජුහා සමග සෝතාපත්ති ඵලයට පැමිණි මහාලීනම් ලිච්ඡවී රජද ඒ පිරිසෙහි හුන්නේවේ විසාලා මහනුවරවාසීහු මහත්වූ පණ්ණාකාර සරසවා බිම්බිසාර රජුට දන්වා ශාස්තෘන්වහන්සේ මෙහි වැඩමවාගෙණ එවුයයි ඒ මහාලිනම් ලිච්ඡවි රජුද පුරෝහිත පුත්‍රයාද මහබලසේනාව හා සමග

හැරියාහුය. ඔවුහු ගොස් රජුට පණ්ණාකාරාදී එපවත් දන්වා මහ
රජානනි ශාස්තෲන්වහන්සේ අපගේ නුවරට පමුණුවනු මැනවැයි
යාඥාකළාහුය—රජතෙම නුඹවහන්සේලාම දැනගණිවුයයි නොපිළි
ගන්නේය, ඔවුහු බුදුන් කරා එළඹ වැඳ ස්වාමිනි විසාලාමහනුවරෙහි
භයත්‍රයෙක් උපන්නාහුය එ සියලු බියහු නුඹවහන්සේලා වැඩිය
කල්හි සංසිඳෙත්යයි යාඥාකලාහුය ශාස්තෲන්වහන්සේද ආවර්ජනා
කොට බලා විසාලා මහනුවරෙහිදී රතනසූත්‍රය කිකල්හී ඒ ආරක්ෂා
තොමො කෙළලක්ෂයක් සක්වළයන්හි පැතිර පවත්නේය. ශුභ්‍රකෙළ
වරැ ස්වාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමයද වන්නේය ඒ සියලු බිය
හුද සංසිඳෙන්නාහුයයි දූත ඔවුන්ගේ වචනය පිළිගත් සේක, එකල්
හි බිම්බිසාර රජතෙමේද බුදුන් පිළිගත්බව අසා බුදුන් විසාලානුවර
ගමන පිළිගන්නාලද්දේයයි නුවරෙහි ඝොෂාකරවා බුදුන්කරා එළඹ
කිමෙක්ද ස්වාමිනි විසාලානුවරට යාම පිළිගන්නා ලද්දේදැයි විචාරා
එසේය මහරජයි වදාළ කල්හි—එසේවි නම් ස්වාමිනි යම්තාක් මාර්ගය
පිළියෙළ කරන්නෙම්ද එතාක් නවතිනු මැනවැයි කියා රජගහනු
වරයාගේද ගංගාවගේද අතුරෙහි පස්යොදුන් භූමිය සමතලාකරවා
යොදුනෙහි යොදුනෙහි විහාරපිහිටුවා බුදුරජහුගේ ගමනටකල් දුන්
වූයේය, එකල්හි ශාස්තෲන්වහන්සේ පන්සියයක් භික්ෂූන් හා සමග
මාර්ගයට පැමිණිසේක. රජතෙමේ පස්යොදුන් මාර්ගය පස්වණක්
මලින් දනක් පමණ විසුරුවා ධජපතාක හා කෙසෙල් තොරන් ආදිය
ඔසවා භාග්‍යවත්හට ඡත්‍රාති ඡත්‍රකොට සේසත් දෙකෙන්ද එක එක
භික්ෂුවට එක එක සේසත බැගින්ද මත්තෙහි අල්වවා පිරිවර සහිත
සුවඳ මල්ආදියෙන් පූජාකරමින් එක එක විහාරයෙහි වස්වවා මහ
දන්දී පස්දවසකින් ගංඉවුරට පමුණුවා එහි නැවක් අලඞ්කාර කර
වමින් විසාලානුවර වාසීන්ට මාර්ගය පිළියෙළකොට බුදුන්ට පෙර
ගමන්කරන්වායයි අස්නක් ලියා හැරියේය, ඔවුහුද ද්විගුණව පූජා
කරන්නෙමුයයි වෙසාලි නාගරයාගේද ගංගාවගේද අතුරෙහි තුන්
යොදුන් භූමිය සමකරවා භාග්‍යවතුන් වහන්සේට සතරකින්ද එක
එක භික්ෂුවට දෙකදෙක බැගින්ද සේසත් වලින් ඡත්‍රාධි ඡත්‍ර සරසා
පූජාකරණලබමින් අවුත් ගංඉවුරෙහි සිටියාහුය—බිම්බිසාර රජ
තෙමේ නැවු දෙකක් ගළපා මණ්ඩපයක් කරවා මල්දම් ආදියෙන්
අලඞ්කාර කරවා සර්වරත්නමය බුද්ධාසනයක් මැව්වූයේය, එහි ශාස්
තෲන් වහන්සේ වැඩහිඳගත්සේක, පන්සියයක් භික්ෂූහුද නැවට
නැගී බුදුන් පිරිවරා හිඳගත්තාහුය, රජතෙමේද අනුවයන්නේ කර
වටක් පමණ වතුරට බැස ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස යම්තාක්
දවසකින් වඩින්නේද එතාක් මම මේ ගංඉවුරෙහිම වාසයකරන්නෙම්

යයි කියා නැවහැර නැවතුණෝය, මත්තෙහි දෙවිතාවෝද අකනිෂ්ඨ භවනය දක්වා පූජාකළාහුය. යට ගංගාවාසී කම්බලස්සතරාදි නාගයෝද පූජාකළාහුය, මෙසේ මහත්වූ පූජාවන් පවත්නා කල්හි බුදුරජානන්වහන්සේ යොදුනක් පමණ ගංගාවෙන්ගොස් විසාලානුවර වාසීන්ගේ ඉමට පැමිණි සේක—ලිච්ඡවි රජහුද බුදුන්ට පෙරගමන් යන්නාහු කරවටක් පමණ වතුරෙහිද ගියාහුය බුදුරජ ඉමට පැමිණීම හාසමග ඒක්ෂණයෙන් එ මොහොතින් විද්‍යුත්ප්‍රභාවෙන් විනධවූ අන්ධකාරයෙන් පතලාවූ මෙඝකූට ඇති ගලගලයන ශබ්දකරමින් සතරදිසාවන්හි මහාමෙඝයක් නැංගේය ඉක්බිති බුදුන් විසින් ප්‍රථම පාදය ගංඉවුරෙහි තබනලද මාත්‍රයෙහිම පොකුරු වැස්සක් වැස්සේය, ඒවැස්සෙන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති නොතෙමෙනු කැමැත්තෝ නොතෙමෙන්නාහුය, කැමපාන්හි දනපමණ කලවා පමණ උකුල පමණ කරවටක් පමණ වතුරගලාගියේය සියලු කුණපයෝ ජලයෙන් ගංගාවට ප්‍රවිෂ්ඨකළාහුය, භූමිභාගය පිරිසිදුවූයේය ලිච්ඡවි රජහු ශාස්තෘන්වහන්සේව යොදුනෙහි යොදුනෙහි නවත්ව නවත්වා මහදන්දී බිම්බිසාර රජුකළ පූජාවටවඩා දිගුණව පූජාකරමින් තුන්දවසකින් වෙසාලිනගරයට වැඩමවා ගත්තාහුය, බුදුන් විසාලානුවරට සම්ප්‍රාප්තකල්හි ශක්‍රදිව්‍යරාජයාද දිව්‍යසමූහයා විසින් පිරිවරණලදුව ආයේය, මහේශාක්‍ය දෙවියන්ගේ රැස්වීමෙන් බොහෝ සෙයින්ම අමනුෂ්‍යයෝ පලාගියාහුය, ශාස්තෘන්වහන්සේ සවස්වේලෙහි නුවරදොර සමීපයෙහි සිට ආනන්ද මහතෙරුන්වහන්සේට ආමන්ත්‍රනය කළසේක, උන්වහන්සේට ආමන්ත්‍රනය කොට ආනන්දය මේ රතන සූත්‍රය උගෙණ පූජොපකරණයන්ගෙණ ලිච්ඡවිකුමාරයන් සමග විසාලා මහනුවරෙහි ප්‍රාකාර තුන අතුරෙහි පිරිත්කරමින් හැසිරෙවයි කියා පළමුකොට ආනන්දස්ථවිරයන් වහන්සේට රතන සූත්‍රය විදාළසේක, මෙසේ මේ රතන සූත්‍රය කවරෙකු විසින් කවර කලෙක කවරතැනකදී කුමක් පිණිස වදාරණ ලද්දේද යන ප්‍රශ්නයන්ගේ විසර්ජනයෝ වෙති, මෙසේ බුදුහු විසාලාමහනුවරට වැඩිය දවසහිම විසාලා නුවර දොරසමීපයෙහිදී ඒ උපද්‍රවයන්ගේ ප්‍රතිඝාතය පිණිස වදාරණලද රතනසූත්‍රය උගෙණ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ බුදුරජහුගේ ශෛලමය පාත්‍රයෙන් පැන්ගෙණ නුවර දොරසමීපයෙහි සිටියේ කායප්‍රණිධානයෙහි පටන් තථාගතයන් වහන්සේගේ දසපාරමිතාවන්ද පඤ්චමහාපරිත්‍යාගයන්ද ලෝකාර්ථචර්‍යාව ඥාත්‍යර්ථචර්‍යාව බුද්ධචර්‍යාව යන ත්‍රිවිධචර්‍යාවන්ද පශ්චිම භවයෙහි ගර්භාවක්‍රාන්තිය ජාතිය අභිනිෂ්ක්‍රමණය ප්‍රධාන චර්‍යාව බෝධිපර්‍යංකයෙහි මාරවිජය සර්වඥතාඥාණප්‍රතිවේධය නව ලෝකෝත්තර ධර්මය යන මේ සියලු බුදුගුණයන් ආවර්ජනාකොට

නුවරට ප්‍රවිෂ්ටව රතන සූත්‍රය පිරිත් පිණිස කියනු ලබන්නේ සියලු නුවරෙහි පැන් ඉසිමින් හැසුරුණේය. තෙරුන්වහන්සේ විසින් "යංකිඤ්චි" යන වචනය කියනලද මන්ත්‍රයෙහිම උඩට ඉසිනලද ජලය අමනුෂ්‍යයින්ගේ මස්තකයෙහි වැටුණේය, තුන්වෙනි ගාථාවෙහි පටන් රිදී බුබුලුවැනිදිය බින්දු අහසින් ගොස් ගිලන් මිනිසුන්ගේ මස්තකයෙහි වැටුනාහුය. එකෙණෙහිම සංසිඳෙනලද රෝග ඇති මනුෂ්‍යයෝ නැගිට නැගීට අවුත් සියලු සුවඳ මල් ආදියෙන් තෙරුන් වහන්සේට පූජාකොට පිරිවරාගත්තාහුය, යංකිඤ්චි යයි කියනලද පදයෙහි පටන් දියබින්දුවලින් ස්පර්ශකරණලද්දාවූ පළමු පලා නොගියාවූ කසලගොඩය භිත්තිප්‍රදේශය යනාදි ස්ථාන ආශ්‍රිතකළාවූ යම් අමනුෂ්‍යකෙණෙක්වූවාහුනම් ඔවුහු නුවර සතරදොරින් පලාගියාහුය වාරයෙහා අවකාශ නැතිවූවාහුය. එහෙයින් වාරයන්හි අවකාශ නොලබන්නාවූ සමහරයක්ෂයෝ ප්‍රාකාරය බිඳ පලාගියාහුය. මාරයෝ නොයෙක් දහස් ගණන්වූවාහුය—මහජනයා නුවර මැද සන්ථාගාර සාලාව සියලු සුවඳින් ලෙපනයකොට මත්තෙහි රත්තරු ආදියෙන් විසිතුරු වියනක් බැඳ සියලු අලංකාරයෙන් අලංකාරකොට එහි බුද්ධාසනයක් පනවා බුදුන්ට දැන්වූයේය, බුදුරජ සන්ථාගාරයට ප්‍රවිෂ්ටව පනවනලද ආසනයෙහි වැඩහිඳගත්සේක භික්ෂු සංඝයාද ලිච්ඡවි රජහුද සෙසු මනුෂ්‍යයෝද බුදුන් පිරිවරා සුදුසු අවකාශයන්හි හිඳගත්තාහුය. ශක්‍රදිව්‍යරාජයාද දෙදෙව්ලොව දෙවිපිරිස හා සමග සුදුසු අවකාසනැනෙක්හි සිටියේය. අනික් දෙවියෝද ආනන්ද ස්ථවිරයන්වහන්සේද සියලු විසාලා මහනුවර හැසිරෙමින් ආරක්ෂාකොට සංසිඳෙනලද රෝග ඇති විසාලා නුවරවාසි මහජනයන් හාසමග අවුත් බුදුන්වැඳ එකත්පසෙක හිඳගත්සේක—එහි බුදුරජානන්වහන්සේ පිරිස බලා එම රතන සූත්‍රය නැවතත් වදාළේය—එහි, යානිධභූතානි—යන පළමුවෙනි ගාථාවෙන් ආශය යොනිසොමනස්කාර ආත්ම සම්‍යක් ප්‍රතිධි සමාධි හේතුසම්පත්තියෙහිද ප්‍රයොග පරතොඝොෂ සත්පුරුෂො පාශ්‍රය ප්‍රඥාහෙතු සම්පත්තියෙහිද යොදවා 'දෙවෙනි ගාථාවෙන්' දෙවිතාවන් කෙරෙහි මනුෂ්‍යයන්ගේ උපකාරත්වයද දක්වා මනුෂ්‍යයන්ගේ උපද්‍රව සංසිඳුවන පිණිස බුද්ධාදිරත්නත්‍රය ගුණ ප්‍රකාශකිරීමෙන් දෙවිමිනිසුන්ට ධර්මදේශනාපිණිසද—යංකිඤ්චි විත්තං—යනාදී සත්‍යක්‍රියාව යොදන්ට පටන්ගත්සේක—බුදුන් විසින් යංකිඤ්චි ගාථාව වදාළ මාත්‍රයෙහිම රජකුලයට සුවවූයේය. භයද සංසිඳී ගියේය. ගාථාවෙහි ආඥාව ශත්ලක්ෂයක් දක්වතැයි අමනුෂ්‍යයන් විසින් පිළිගන්නා ලද්දීය. වෙනස්ව ඛිණං පුරාණං—යන ගාථාව දක්වා

එක එකගාථා කෙළවරදී ඒ ඒ ගාථාවන්හී ආඥාවෝ කෙළලක්‍ෂ යක් සක්වළ අමනුෂ්‍යයන් විසින් පිළිගත්තා ලද්දාහුය— එම් ඛීණං පුරාණං යන ගාථාවෙන් දෙශනාව එකළුවරකල කල්හි රජකුලයටද සුවවූයේය— සියලු උපද්‍රවයෝද සංසිඳුනාහුය අසූහාර දහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමයද වූයේය—නැවත ශක්‍ර දෙවේන්ද්‍ර තෙමේද බුදුන් විසින් රතනත්‍රයගුණ අරභයා සත්‍යවචන යෙදීමින් නුවරට සුවඇතිබව කරණලද්දීය. මා විසින්ද නුවරට සුවපිණිස රත්නත්‍රය ගුණ අරබයා යම් කිසිවක් කියයුතුයයි සිතා යානීධභූතානි යන අවසාන ගාථාතුන කීයේය; ශක්‍රදිව්‍යරාජයා ගාථා තුන කියා දෙවූ පිරිස හාසමඟ බුදුන්වැඳ ප්‍රදක්‍ෂිණාකොට දිව්‍යපුර යට ගියේය. භාග්‍යවතුන්වහන්සේ වනාහි එම රතනසූත්‍රය දෙවෙනි දවසෙහිද තුන්වෙනි දවසෙහිදයි මෙසේ සත්වෙනි දවස දක්වා සත්වරක් ධර්මදේශනා පිණිස වදාළේය, ඒ එක එක දවසෙහි අසූ සාර දහසබැගින් සත්වයෝ නිවන් දුටුවාහුය. මෙසේ මේ රතන පිරිතනම් කෙළලක්‍ෂයක් සක්වළ මුළුල්ලෙහි ආනුභාවය පවත්නාවූ සියලු රෝගා මනුෂ්‍ය දුර්භික්‍ෂාදි භය විනාසකරමින් සතුන්ට මෙලො පරලො දෙක්හී ලොව් ලොවුතුරු සැපඑලවන්නාවූ මහානුභාව සම්පන්නබ්‍රහම මන්ත්‍රයක්බව දතයුත්තේය. එහෙයින් මේ රතන පිරිත යම් කිසි ග්‍රාම නගරාදියෙක්හි වශංගත රොගාදි රෝග භයක් හෝ දුර්භික්‍ෂ භයෙක්හෝ අමනුෂ්‍ය භයෙක්හෝ පැමිණිකල්හී ලාභසත්කාරාදිය ගරු නොකොට මෙත්සිත් පෙරටුකොට හසුරුවා පිරිසිදු ශීලසම්පන්නයෙක් මෙසින් පිරිත්කොට ගත් පැන් ආදිය පිරිත්කරණු ලබමින් ඒ ග්‍රාමනගරාදියෙහි ඉසිමින් හැසිරෙන්නේනම් එකෙණෙහිම ඒ සියලු උපද්‍රවයෝ සංසිඳෙන්නාහුමයයි නිසැකව දතයුත්තේය—නවද ඊට වස්තුවෙක් නම්, අප ලංකාද්වීපයෙහි බුද්ධවර්ෂයෙන් 711 වෙනි වර්ෂයෙහි රාජ්‍යයට පැමිණි දෙවෙනි උපතිස්සනම් රජුදවස ද ලක්දිවෙහි දුර්භික්‍ෂරොග යන භය දෙකෙක් උපන්නාහුය, එකල්හි රජ තෙමේ භික්‍ෂුසංඝයාකරා එළඹ වැඳ එකත්පස්ව හිඳ ස්වාමිනි ලෝකයෙහි දුර්භික්‍ෂාදි භයෙකින් පෙළීමක්වූකල්හී ලෝකයාට හිතපිණිස බුදුන්විසින් කරණලද යම් කිසිවක්නැත්තේදැයි ඇසූයේය. එකල්හි භික්‍ෂූහු ගංගාරොහනසූත්‍රයාගේ හෙවත් මේරතනසූත්‍රයාගේ උත්පත්තිය දක්වූවාහුය, ඒ අසා රජතෙම සර්වඥධාතුනිධාන කරණලද රන්පිළිමයක් කරවා බුදුන්ගේ ශෛලමය පාත්‍රය පැන් සහිකොට අත්ලෙහි තබා ඒ බුදුප්‍රතිමාව මහාරථයකට නංගවා තෙමෙ සිල් සමාදන්ව මහජනයාටද සිල්සමාදන්කරවා මහදානයක්ද පවත්වා සියලු සතුන්ට අභයදානයද දී නුවර අලංකාරකොට දිපවාසී භික්‍ෂූන් විසින් පිරිවරණලදුව මහවීථියට බැස්සේය, එකල් හී

එකී රැස්වූ භික්ෂූහුද රතනසූත්‍රය කියන්නාහු පැන්ඉසිමින් තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි රජගේ සමීපයෙහිද විථිමාර්ගයෙහිද ප්‍රාකාර සමීපයෙහිද ප්‍රදක්ෂිණා කරමින් හැසුරුනාහු අරුණෝද්ගමන වේලාවෙහි රතන පරිත්‍රාණ භාවයෙන් මහාමේඝයක් වසීකළේය. එකෙණෙහිම සියලු රෝගාතුරයෝද සුවපත්වූවාහු නොයෙක් උත්සව ක්‍රීඩාකරන්ට පටන්ගත්තාහුය—ඒ කාරණයෙන් ප්‍රීතිමත්වූ රජතෙම යම්කලෙක්හි මෙම දිවයිනෙහි රෝගදුර්භික්ෂාදි භයෙක් වන්නේ නම් එකල්හි මෙපරිද්දෙන්ම රතන සූත්‍රයෙන් පිරිත්කරන්වායයි නියෝගයක්කොට තැබූසේය—මේ කාරණය මහාවංසයෙහි—

කාලෙ තස්සාසි දුබ්භික්ඛ රොගදොසාභිපීළිතො
දීපො දීපප්පමොදාය තමමොචෙසි සුමානසො
භික්ඛූ පුච්ඡිත්වා කිංහොති දුබ්භික්ඛාදි භයද්දිතෙ
ලොකෙ ලොකහිතං නාත්ථිකතං කිඤ්චිමහෙසිනා
ගංගාරොහණ සුත්තස්ස උප්පත්තිං තත්ථ නිද්දිසුං
සුත්වාතං සබ්බසොවණ්ණං බිම්බං සම්බුද්ධධාතුතො
කත්වාසත්ථු සිලාපත්තං සොදකං පාණිසම්පුටෙ
ඨපෙත්වාතස්සතං රූප මාරොපෙත්වා මහාරථං
සයංසීලං සමාදාය සමාදෙත්වා මහාජනං
මහාදානං පවත්තෙත්වා අභයං සබ්බපාණිනං
අලඞ්කත්වාචනගරං දෙවලොක මනොහරං
දීපවාසීහි සබ්බෙහි භික්ඛූහි පරිවාරිතො
ඔතරිත්වා මහාවීථිං භික්ඛූ තත්ථ සමාගතා
භණන්තා රතනං සුත්තං සිඤ්චමානා ජලංතද
රාජගෙහන්තිකෙ වීථිමග්ගෙ පාකාරසන්තිකෙ
විචරිංසු තියාමන්ත කුරුමානා පදක්ඛිණං
ඛිජ්ජමානෙ අරුණෙ වස්සි මහාමෙඝො මහීතලෙ
රොගාතුරාච සබ්බෙපි සුඛිතාහංසු උස්සවං
යදාදුබ්භික්ඛ රොගාදි භයං දීපම්හි හෙස්සති
එවමෙව කරොන්තූති නියොජෙසි නරාධිපො—

යන්නෙන් දක්වනලද්දේය, මෙතෙකින් රතන සූත්‍රයාගේ උත්පත්ත්‍යාදිය නිමකරණ ලද්දේවේ—

## අංගුලිමාල පිරිතගේ උත්පත්තිය.

තවද අංගුලිමාල පිරිතද මහානුභාව සම්පන්න පිරිතෙක්වේ. එහි උත්පත්තිය කෙසේදයත් එක්සමයෙක්හි අප ශාස්තෲවූ බුද්ධරාජනාත්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවනාරාමයෙහි වැඩ

වසන සේක—එසමයෙහි වනාහි ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරයන්
වහන්සේ පෙරවරුවෙලෙහි හැඳපොරවා පාසිවුරුගෙණ සැවැත්
නුවරට පිඬුපිණිස ප්‍රවිෂ්ටවූසේක—සැවැත් නුවරෙහි ගෙපිළිවෙළින්
පිඬුසිඟා වඩිනාවූ ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරයන්වහන්සේ මූඪවූ
දරුගර්භය ඇති ව්‍යසනයට පැමිණි දරුගර්භය ඇති එක්තරා ස්ත්‍රි
යාවක් දුටුයේය—දුක පින්වත්නි ඒකාන්තයෙන් සත්වයෝ කිලිටුවූ
වාහුය පින්වන්නි ඒකාන්තයෙන් සත්වයෝ කිලිටුවූවාහුයයි කියා
උන්වහන්සේට මෙබඳු සිතෙක්වූයේය. ඉක්බිති ආයුෂ්මත් අංගුලි
මාලස්ථවිරයන්වහන්සේ සැවැත්නුවරෙහි පිඬුපිණිස හැසිර පසුබත
පිණ්ඩපාතයෙන් වැලකුණුසෙක් භාග්‍යවතුන් වහන්සේ යම්තැ
නෙක් හිඳ එතැන්හි එළැඹුනුසේක. එළඹ බුදුන්වැඳ එකත්පසෙක
හුන්නේය. එකත්පසෙක හුන්නාවූ අංගුලිමාල ස්ථවිරයන්වහන්සේ
බුදුරජානන්වහන්සේට ඒ සියලු ප්‍රවෘත්තිය දැන්වූයේය. එකල්හි බුදු
රජානන්වහන්සේ එසේවීනම් අංගුලිමාලය තොප සැවැත්නුවර
යම්තැනෙක්හිද එතැන්හි එලඹෙව එළඹ ඒස්ත්‍රියට, නැගනියනි
මම යම් කලෙක පටන් සම්‍යක්බුඩවූ ආර්‍ය්‍යයන් වහන්සේගේ ආර්‍ය්‍ය
ජාතියෙහි උපන්නේ වෙම්ද එතැන් පටන් දැනදැන ප්‍රාණියක් ජීවිත
යෙන් තොරකළා නොදනිමි ඒ සත්‍යය හෙතුකොටගෙණ තිට සුව
යක් වේවා ගර්භයට සුවයක්වේවායයි—යතොහං භගිනි අරියාය ජාතියා
ජාතො නාභිජානාමි සංචිච්ච පාණං ජීවිතා වොරොපෙතා තෙනසච්චෙ
න සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සාති යන මෙයින් සත්‍ය ක්‍රියාකර
වයි කියා මේ පිරිත වදාළේය. එකල්හී අංගුලිමාලස්ථවිරයන්වහන්
සේ තමන් ගිහිකල ප්‍රාණඝාත කලේ නොවේදැයි උපන් සැකයද
බුදුන් සමීපයෙහි සිඳගෙණ සැවැත්නුවරට එළඹ අංගුලිමාල ස්ථවිර
යන්වහන්සේ සත්‍ය ක්‍රියාවක්කොට මූඪගර්භවූ ස්ත්‍රියට සුවකිරීම
පිණිස වැඩියේයයි දන්වාහැරියේය. එහෙයින් එහි මනුෂ්‍යයෝ තිර
යක් ඇද තිරයෙන් පිටත තෙරුන්වහන්සේට පුටුවක් පනවාදුන්
නාහුය තෙරුන්වහන්සේ එහි වැඩහිඳ යතොහං භගිනි යනාදි සත්‍ය
ක්‍රියාවෙන් පිරිත් කළේය. සත්‍යක්‍රියා වචනය හා සමගම ඩබරාවකින්
නික්මුනු ජලධාරාවක් මෙන් කුමරුවා බිහිවී පුත්‍රයාටද මවුටද සුවවු
යේය. මේ අඞ්ගුලිමාල පරිත්‍රාණයාගේ උත්පත්තියවේ ඒ අඞ්ගුලි
මාල ස්ථවිරයන්වහන්සේ විසින් වැඩහිඳ සත්‍යක්‍රියාකළ ස්ථානයෙහි
පුටුවක්ද කළාහුය. එතැන්පටන් ගර්භමූඪ තිරශ්චීන ස්ත්‍රීන්ද ගෙණ
අවුත් එහි හොවනි එකෙණෙහිම සැපසේ දරු බිහිවීමවේ. යම් ස්ත්‍රි
යක් දුර්වලවෙයිනම් ගෙණවුත් හොවන්ට නොහැක්කිනම් ඒ පුටුව
සෝදනලද ජලයගෙණ හිස්මුදුනෙහි ඉසිනේය. එකෙණෙහිම දරු

කියවීම වන්නේය. අනිකුදු රොගභයෝද සංසිඳෙන්නාහුය, මෙය මේ මහාභද්‍රකල්පය මුළුල්ලෙහි පවත්නාවූ ප්‍රාතිහාර්‍ය්‍යයෙකැයි කියනලද්දේය, මෙපමණක්ද නොව මේ පිරිතෙන් දුරුනොවන උපද්‍රවයෙක් නම් නැත්තේමය එහෙයින් මේ අංගුලිමාල පිරිතට මහපිරිතය යන නාමය කියනලද්දේය, මේ කාරණයද අටුවාවෙහි—ඉදංඛොපන පරිත්තං නසක්කාවිපරිවත්තයංනාමද්දති මහාපරිත්තංනාමෙතංපහිවුත්තං යන්නෙන් දක්වනලද්දේය. මෙහි භාවය මේ අංගුලිමාල පිරිතද වනාහි කිසි උපද්‍රවයක් නොමඩනේනම් නොවේ (සියලුම උපද්‍රව යන් මර්දනය කරන්නේය යනුයි) මේ අංගුලිමාල පිරිත මහපිරිත නම් වන්නේයයි කියනලද්දේය යනුයි—මෙසේ හෙයින් සිලසම්පන්නවූ යමෙක් මෙසින් පිරිත්කොට මුඝගර්භ ස්ත්‍රීන්ගේ ඉසට පැන් ඉසීමෙන් එකෙණෙහිම දරුබිහිවීමද වී ප්‍රසූතාද මවුද යන දෙදෙනාම සුවපත් වන්නා පමණක්නොව සෙසු සියලුහස්ති අශ්වාදීන්ගෙන් භයක් පැමිණිකල්හි මෙම පිරිත කියකිරීමාදියෙන් ඒ සියලු භයද සංසිඳෙන්නේමයයි නිසැකව දත යුත්තේමය.

## ආටානාටිය පිරිත ගැණ.

ආටානාටිය පිරිත කවරෙකු විසින් කවර කලෙක කවරතැනක දී කුමක් පිණිස වදාරණලද්දේද යත්—එක් කාලයෙක්හි බුදුරජානන්වහන්සේ රජගහනුවර නිසා ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වාසය කරණ සේක. ඒ කාලයෙහි මේ ශාසනයෙහි භික්ෂුභික්ෂුණී උපාසක උපාසිකාවන්ට නපුරු මිථ්‍යාදෘෂ්ටි අමනොඥ යක්ෂයන් ගෙන්වන උපද්‍රවයන් වලක්වනු පිණිසද ආරක්ෂා පිණිසද ආවෙශොන්මාද පීඩා කිරීමාදි වෙහෙස නොවන පිණිසද ස්ථාන ගමනාදි සතර ඉරියවුවෙහි භයොපද්‍රවය නැතිව සැපසේ විසීම පිණිසද වෙසමුනි මහරජානන්ගේ ආටා නාටා නම් නුවරෙහිදී ධෘතරාෂ්ට්‍ර විරූළ්හක විරූ විරූපාක්ෂ වෛශ්‍රවණ යන සතරවරම් මහරජ දරුවෝ එක්ව සිඳ, විපස්සි ආදි සපත සම්‍යක් සම්බුද්ධවූ සර්වඥවරයන් අරබයා මේ ආටානාටිය පිරිතබැඳ යක්ෂරක්ෂසාදි යම් අමනුෂ්‍යයෙකුනෙක් බුදුන්ගේ ධර්මානත්තියද අපගේ රාජානත්තියද නොඅසයිනම් ඔහුට දිව්‍යග්‍රාම නගරාදියෙහි සත්කාරයක් හෝ ගරුකාරයක්හෝ නොලැබෙනසේද ආලකමන්දනම් රාජධානියෙහි ගෘහවස්තුවක් හෝ නිත්‍යවාසයක් හෝ නොලැබෙනසේද යක්ෂසමාගමනට ප්‍රවිෂ්ටවන්ට. නොලැබෙනසේද ආවාහයකට විවාහයකට යොග්‍යනොකාරණසේද නිග්‍රහකටයුත්තේ යයිකියාද, තවද ඒ දුෂ්ටඅමනුෂ්‍යයාට සම්පූර්ණකලාර අඩකලාර දුනන යනාදීන් ආත්මභාවය එලවා ඇඹුර සම්පූර්ණව ඇසෙනසේ යක්ෂා

ක්‍රෝධජනකවූ පරිභව වචනයෙන් ආක්‍රොශකරම යුත්තෝයයි කියාද ඔහුගේ හිසෙහි මහත්වූ ලෝහපාත්‍රයක් ගලවළුව දක්වා මුනින් නමා මැද ඇනයක් ගසා බැඳුන්නේයයි කියාද. දුෂ්ට අමනුෂ්‍යයාගේ හිස සත්කඩක් කොට පැලිය යුත්තේයයි කියාද මෙසේ නිග්‍රහකට යුත්තේයයි මන්ත්‍රනයකොට ඒ සතරවරම් මහරජදරුවෝ තමන් ගිජ්ඣකූට පර්වතයට ගියකල්හි සවකීය ආරක්ෂාවෙහි පවත්නාවූ තවුසා භාවනාවට ප්‍රතිපක්ෂවූ අසුරයන්ගෙන් උපද්‍රවයක් වේදෝහොයි සිතා වාසුරාජයා මහාවිනාශ එකහෙලා එක අතර මැඩ කඳපතරතුරු සමූහයා කඩා බිඳුවාගෙන නික්මුනාක්මෙන් අසුර සෙනාව වෙව්ලුල් වා භයචකිතකොට ප්‍රවෙශනිවාරණය පිණිස මහත් යක්ෂසෙනාවගෙන්ද මහත් ගන්ධර්වසෙනාවගෙන්ද මහත් කුම්භාණ්ඩසෙනාවගෙන්ද මහත් නාගසෙනාවගෙන්ද ශක්‍රදේවේන්ද්‍රයාට සතරදිසාවෙහි ආරක්ෂා පිහිටුවා සතරදිසාවෙහි අතුරු නොදී මහාබල සෙනාව පිහිටුවා සතර වලල්ලකින් හා තුන්සන්ධියකින් වටකරණලද සංසනා යුධයෙන් සන්නද්ධවූ චතුරංගිනීසෙනාව රැකවල්පිණිස සතරදිගට බුහුනුකොට සතරදිගින් තරයලා පිහිටුවා පෙරයම්රාත්‍රිය ගතවීමෙන් මධ්‍යමරාත්‍රියට පැමිණිකල්හි විශිෂ්ටවූ ශරීරවර්ණයෙන් සියළු ගිජ්ඣකූට පර්වතය එකාලෝකකොට බබුලුවා බුදුරජහු යම්තැනක නම් එතැන්හි එළඹ බුදුන්වැඳ එකත්පස්ව හුන්නාහුය. ඒ සතරවරම් මහරජදරුවන් සමග ආවාවූ යක්ෂයෝ වනාහි ඇතැමෙක් මනාකොට බුදුන්වැඳ සමහර යක්ෂයෝ බුදුරජාණන්වහන්සේ හා සමග සතුටුවූවාහුය සමග සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවන්කොට එකත්පස්ව හුන්නාහුය සමහර යක්ෂයෝ බුදුන් යම්තැනෙකත්හිද එතැන්හි දොහොත් මුදුන්හි එකත්පස්ව හුන්නාහුය සමහරයක්ෂයෝ තමතමන්ගේ නාම ගොත්‍ර අස්වා එකත්පස්ව හුන්නාහුය. සමහර යක්ෂයෝ තුෂ්ණිම්භූතව එකත්පස්ව හුන්නාහුය—මෙසේ එකත්පස්ව හුන්නාවූ සතරවරම් මහරජදරුවන් අතුරෙන් බුදුන්ට ඉතා විශ්වාසගෙසිනුත් ප්‍රසනාවට යුදුසුවාන් පටුසවයන්හා පණ්ඩිතභාවයෙන් යුක්තහෙයිනුත් වෛශ්‍රවණනම් වරම මහරජතෙම බුදුරජාණන්වහන්සේට මේ මතු කියන වචනය සැළකළේය; ස්වාමිනි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අප්‍රසන්නාවූ මහේශාක්‍ය යක්ෂයෝ ඇත්තාහුය—ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූ මහේශාක්‍ය යක්ෂයෝද ඇත්තාහුය— ස්වාමිනි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අප්‍රසන්නවූ මධ්‍යමානුභාවය ඇති යක්ෂයෝද ඇත්තාහුය. ස්වාමිනිභාග්‍යවතුන්වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූ මධ්‍ය මානුභාවය ඇති යක්ෂයෝද ඇත්තාහුය ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි අප්‍රසන්නවූ අල්පේශාක්‍ය යක්ෂයෝද ඇත්තාහුය, ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූ අල්පේශාක්‍ය යක්ෂයෝද ඇත්තාහුය. ස්වාමිනි බොහෝසෙයින්ම යක්ෂයෝ භාග්‍ය

වතුත්වහන්සේකෙරෙහි අප්‍රසන්නයෝමය කවරහෙයකින්ද යත් ස්වාමිනි භාග්‍යවතුන් වහන්සේ ප්‍රාණඝාතයෙන් වැලකීම පිණිස ධර්මදේශනාකරණසේක සොරකම්කිරීමෙන් වැලකීම පිණිස ධර්මදේශනාකරණසේක කාමමිථ්‍යාචාරයෙන් වැලකීමපිණිස ධර්මදේශනාකරණසේක මුසාවාදයෙන් වැලකීම පිණිස ධර්මදේශනාකරණසේක මත්විමෙන් ප්‍රමාදයට කාරණාවූ රහමෙර පානයෙන් වැලකීම පිණිස ධර්මදේශනාකරණසේක, ස්වාමිනි බොහෝසෙයින්වනාහි යක්ෂයෝ ප්‍රාණඝාතයෙන් නොවැලක්කාහුමය අදත්තාදානයෙන් නොවැලක්කාහුමය. කාමමිථ්‍යාචාරයෙන් නොවැලක්කාහුමය—මුසාවාදයෙන් නොවැලක්කාහුමය, මත්විමෙන් ප්‍රමාදයට කාරණාවූ රහමෙරපානයෙන් නොවැලක්කාහුමය,එහෙයින් ඒයක්ෂයින්ට භාග්‍යවතුන්වහන්සේගේ ඒ මධුර ධර්මදේශනාව සොරුන්ට චණ්ඩකාන්තියමෙන් අප්‍රියවන්නේමය ස්වාමිනිභාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ නොයෙක්ජනපදයන්හි ඇත්තාහුමය ඒශ්‍රාවකයෝ කාෂියාම් බිජවාපනාදි මනුෂ්‍යාපචාර රහිතවූ ග්‍රාමාන්‍යසෙනාසනය ඉස්ම පැවැත්තාවූ ග්‍රාමවාසීන්ගේ වාසස්ථානයට ඉතා දුරුවූද නිශ්ශබ්දවූ කොලාහල නැත්තාවූ ජනසඤ්චාරයෙන් උපදනා පවන් නැත්තාවූ මනුෂ්‍යයන්ගේ රහසට යෝග්‍යවූ විවේකකාශ්‍රාන්තාවයට සුදුසුවූ සෙනාසනයන් සෙවනය කරන්නාහුය ඒ ආරණ්‍ය සෙනාසනයන්හි නිබද වාසය කරන්නාවූ ආනුභාවසම්පන්න යක්ෂයෝ ඇත්තාහුමය. යම් යක්ෂ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධවචනයෙහි අප්‍රසන්නයෝද ඔවුන්ගේ චිත්තප්‍රසාදය පිණිස ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ද උපාසිකාවන්ටද දුෂ්ට යක්ෂයින්ගෙන් වන උපද්‍රව නිවාරණය පිණිසද ආරක්ෂාපිණිසද ආලව ශොත්මාද පීඩා කිරීමාදි වෙහෙස නොවනා පිණිසද සතර ඉරියව්වෙහි භයොපද්‍රව රහිතව සැපසේ විසීම පිණිසද, වෙසමුනින් මහරජානන්ගේ ආටානාටා නම් නුවරෙහිදි සතරවරම් මහරජදරුවන් විසින් එක්ව හිඳ රචනාකළහෙයින් ආටානාටියනම්වූ පිරිත උග්‍රහණය කරණසේක්වායයි දැන්වූයේය.(මෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂනොකල ධර්මයෙක් නම් නැත්තේමය එසේ ඇති කල්හිද මේ වෛශ්‍රවණ මහරජතෙම භාග්‍යවතුන්වහන්සේට මේ පිරිත අස්වන්ට අවසරගන්නේ උග්ගණ්හාතුභන්තෙ, යනාදිය කීයෙය, තවද මේ පිරිත බුදුන්ගේ ශ්‍රීමුඛයෙන් වදාළෙනම් අනිගසින් ගරු පිරිතෙක් වීමෙන් කිසිවෙකු විසින් ඉක්මවන්ට නොහැකිවූ ආඥව ඇතිවන හෙයින්ද උග්ගණ්හාතුභන්තෙ—යනාදිය කීයේය,) එකල්හි බුදුරජාණන්වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදාළසේක. ඉක්බිති වෛශ්‍ර

මුනි මහරජතෙම භාග්‍යවතුන්වහන්සේගේ ඉවසිම්දුන සවණිය නාද යෙන් මහාමේඝ ගර්ජනාවක්මෙන් ගර්ජනාවට පවත්ගනිමින් ගම්භීර ඝිරනාදයෙන් සකල යක්ෂරාක්ෂස නාග ගරුඬ ගන්ධර්ව කුම්භාණ්ඩ සමූහයා භයගන්වමින්,—විපස්සිස්ස නමනවූ ඝනපදය ආදිකොට සතා වරම් මහරජුන්ගේ වශයෙන් සතරවරක් ආවාවූ, බුඩංවඥාම නොත මං, ඝන පදය කෙලවරකොට ඇති මේ ආටානාටිය පිරිතකියෙය්ය, එසේ වෙසමුණි මහරජ ආටානාටිය පිරිතකියා ඊටපරිකම් දක්වන් නේ නිදුකානන්වහන්ස මේ ආටානාටිය පිරිත වනායී භික්ෂූන්ටද භික්ෂුනීන්ටද උපාසකයන්ටද උපාසිකාවන්ටද ගුප්තිය පිණිස ආරක්ෂාව පිණිස හිංසා නොවන පිණිස සැපවිහරණය පිණිස වන්නීය, නිදුකානන්වහන්ස යම්කිසි භික්ෂුවක් විසින් හෝ භික්ෂුණියක් විසින් හෝ උපාසකයෙකු විසින් හෝ උපාසිකා වකු විසින්හෝ මේ ආටානාටිය පිරිත අර්ථයද ව්‍යඤ්ජනයද පිරි සිදුව මනාකොට උගෙණගන්නා ලද්දීද, (කුමක් හෙයින්දයත් මේ පිරිතෙහි අර්ථයද පාළියද විසංවාදනයකොට හෝ සර්වප්‍රකාර යෙන් ප්‍රගුණ නොකොට හෝ කියන්නහුගේ පිරිත තෙජානුභාවය ඇති නොවන්නේය. ලාභ සත්කාරාදිය හේතුකොටගෙණ කියන් නහුගේ අර්ථසිද්ධිය නොවන්නේය. ත්‍රිසරණපක්ෂයෙහි සිට මෛත්‍රී විහාරය පෙරදූරිකොට කියන්නහුගේම අර්ථසිද්ධියවන්නේය, එහෙ හින් මේ පිරිත පදව්‍යඤ්ජන නොපිරිහෙලා සම්පූර්ණකොට ප්‍රගුණ කරණලද වන්නීද, ඉදින් මේ ආටානාටිය උගත්තාවූ පුද්ගලයාව යක්ෂයෙක් හෝ යක්ෂණියක්හෝ යක්ෂපොතකයෙක්හෝ යක්ෂපොති කාවක්හෝ යක්ෂ මහාමාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහිවූ යෙක් හෝ යක්ෂ මෙහෙකරුවෙක්හෝ ගන්ධර්වයෙක් හෝ—පෙ—ගන්ධර්ව මෙහෙ කරුවෙක්හෝ කුම්භාණ්ඩයෙක්හෝ—පෙ—කුම්භාණ්ඩ මෙහෙකරු වෙක්හෝ—නාගයෙක්හෝ- නාගිනියක්හෝ නාගපොතකයෙක්හෝ නාග පොතිකාවක් හෝ නාග මහාමාත්‍යයෙක් හෝ නාගපිරිසෙහිවූ යෙක් හෝ නාග මෙහෙකරුවෙක් හෝ භූතපිසාචාදි අමනුෂ්‍ය යෙක් තෙම දූෂිත සිත්ඇත්තේ යන්නහු අනුව ලොල්මත්කොට යන්නේ හෝ වේද සිටියහු සමීපයෙහි සිටින්නේ හෝ වේද හිඳිනහු සමීපයෙහි හිඳින්නේහෝ වේද සයනයකරන්නහු සමීපයෙහි සයනය කරන්නේහෝ වේද නිදුකානන්වහන්ස ඒ මාගේ අමනුෂ්‍යතෙම. ග මෙක්හිහෝ නිඝම්ගමෙක්හි හෝ සත්කාරයක්හෝ ගරුකාරයක්හෝ නොලබන්නේය, නිදුකානන්වහන්ස ඒමාගේ අමනුෂ්‍යතෙම ආලක මන්දා නම් රාජධානියෙහි ගෘහවස්තුවක්හෝ නිත්‍ය වාසයක්හෝ නොලබන්නේය නිදුකානන් වහන්ස ඒ මාගේ අමනුෂ්‍යතෙම යක්ෂ

සමාගමට යන්වද නොලබන්නේය නිදුකානන් වහන්ස තවද ඔහු අමනුෂ්‍යයෝ ආවාහයටද යොග්‍ය නොකරති විවාහයටද යොග්‍ය නොකරති, නිදුකානන් වහන්ස තවද ඔහුට අමනුෂ්‍යයෝ කළාර අක්‍ෂිකළාරදන්ත යනාදීන් ආත්මභාවය එලවා අක්‍ෂරයන් සම්පූර්ණයෙන් ඇසෙන පරිද්දෙන් සක්‍ෂාක්‍රොෂ නම්වූ පරිභව වචනයෙන් ආක්‍රොෂ කරන්නාහුය. නිදුකානන්වහන්ස තවද අමනුෂ්‍යයෝ ඔහුගේශීර්ෂයෙහි භික්‍ෂූන්ගේ පාත්‍රයමැනි ලොහ පාත්‍රයක් ගළවා එව දක්වා මුනින් නමා මධ්‍යයෙහි අයොමය හුලක් ගසන්නාහුය, නිදුකානන් වහන්ස තවද අමනුෂ්‍ය යෝ ඔහුගේ හිස සත්කඩක්කොට පලන්නාහුය, නිදුකානන්වහන්ස අත්‍යන්ත යාපිවූ අතිශයින් රෞද්‍රවූ කරණොත්තරිය කරණයෙන් යුක්තවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුමය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහරජ දරුවන්ගේ වචනය ආදරකොට නොගන්නාහුය සතරවරම් රජුන්ගේ අමාත්‍යවූ අටවිසියක් සෙනෙවියන්ගේ වචනයද ආදරකොට නොගන්නාහුය එ වරම් මහරජුන්ගේ අටවිසියක් සෙනෙවියන් සම්බන්ධවූ නියුක්ත යක්‍ෂ පුරුෂයන්ගේ වචනයද ආදරකොට නොගන්නාහුය, නිදුකාන් වහන්ස ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහරජ දරුවන්ගේ පස මිතුරෝ යයි කියනු ලැබෙති නිදුකානන්වහන්ස මගධේශ්වරවූ බිම්බිසාර රජහුගේ රටෙහි සොරු යම්සේද එසොරු මගධේශ්වරවූ බිම්බිසාර රජහුගේ ආඥාව නොකරන්නාහුය—බිම්බිසාර රජහුගේ අමාත්‍යයන්ගේ වචනයද ආදරකොට නොකරන්නාහුය—බිම්බිසාරරජුගේ අමාත්‍යන් සම්බන්ධවූ නියුක්තක පුරුෂයන්ගේ වචනයද නොකරන්නාහුය—නිදුකානන්වහන්ස ඒ සොරු බිම්බිසාර රජහුගේ පසමිතුරෝ යයි කියනු ලැබෙති, නිදුකානන් වහන්ස අතිශයින් කොපවෙන සුලුවූ රෞද්‍රවූ කරණොත්තරිය කරණයෙන් යුක්තවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුමය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහරජුන්ගේ වචනය ආදරයෙන් ගෙණ නොකරන්නාහුය ඒ වරම් මහරජුන්ගේ සෙනාපතියන්ගේ වචනයද ආදරයෙන් ගෙණ නොකරන්නාහුය ඒ වරම් මහරජුන්ගේ යක්‍ෂසෙනාපතියන්ට අයිති යක්‍ෂපුරුෂයන්ගේ වචනයද නොකරන්නාහුය නිදුකානන්වහන්ස ඒ අමනුෂ්‍යයෝ වරම් මහරජුන්ගේ පසමිතුරෙයයි කියනු ලැබෙති, නිදුකානන්වහන්ස යම්කිසි අමනුෂ්‍යයෙක් හෙම යක්‍ෂයෙක් හෝ යක්‍ෂණියක් හෝ යක්‍ෂ පොතකයෙක් හෝ යක්‍ෂ පොතිකාවක්හෝ යක්‍ෂ මහාමාත්‍යයෙක්හෝ යක්‍ෂ පිරිසෙහිවූවෙක් හෝ යක්‍ෂ මෙහෙකරුවෙක් හෝ ගන්ධර්වයෙක්හෝ-පෙ-ගන්ධර්ව මෙහෙකරුවෙක්හෝ-කුම්භාණ්ඩයෙක් හෝ—පෙ—කුම්භාණ්ඩ මෙහෙකරුවෙක්හෝ—නාගයෙක්හෝ-පෙ-නාග මෙහෙකරුවෙක්හෝ ප්‍රකම්පිතයන් දූෂිත සිත් ඇත්තේ භික්‍ෂුවක්

හෝ භික්ෂුණියක්හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක්හෝ යන්නහු සමග සොල්මින් කරමින් අනුව යන්නේවේද සිටියහු සමීපයෙහි සිටිනේ හෝවේද හුන්නහු සමීපයෙහි හිඳිනේහෝවේද සැතපුනහු සමීපයෙහි සයනයකරන්නේ හෝවේද එකල්හි, අයංශකොබා ගණිහාති අයංශකොබා ආවිසති—ගහාදි යනින් මේ යක්ෂතෙම ග්‍රහණය කරන්නේය මේ යක්ෂතෙම ශරීරයෙහි ආවේශවන්නේය මේ යක්ෂතෙම ශීර්ෂරෝගාදිය වඩිනය කරමින් පීඩාකරන්නේය මේ යක්ෂතෙම විශෙෂයෙන් පීඩාකරන්නේය මේ යක්ෂතෙම ශරීරයෙහි මස් ලේය ක්ෂයකරමින් හිංසාකරන්නේය මෙ යක්ෂතෙම විශෙෂයෙන් හිංසා කරන්නේය මේ යක්ෂතෙම අපස්මාර ග්‍රහණය කොට නොහරනේයයි කියා පළමුකොට පිරිත්කියා යක්ෂයින් පලවන්ට නොහැක්කහු විසින් මේ යක්ෂයන්ට මේ මහායක්ෂයන්ට මේ සෙනාපතියන්ට මේ මහා සෙනාපතියන්ට මුරගා කියයුත්තේය අඬනාගා කියයුත්තේය, කවර යක්ෂකෙනෙකුන්ට කවර මහා යක්ෂකෙනෙකුන්ට කවර සෙනාපතියන්ට කවර මහාසෙනාපතියන්ට අඬගා කියයුත්තෝදයත්, ඉන්ද්‍රය සොමය, වරුණය, භාරද්වාජය, ප්‍රජාපතීය, චන්දනය කාමසෙට්ඨය, කිණ්ණුඝණ්ඩුය නිඝණ්ඩුය, පනාදය, ඔපමඤ්ඤය දෙවසූතය, මාතලිය, චිත්‍රසෙනය, ගන්ධබ්බය, නලය, රාජය, ජනෙසභය සාතාගිරය, හෙමවතය, පුණ්ණකය, කරතියය, ගුලය, සිවකය, මුචලින්දය, වෙස්සාමිත්තය, යුගන්ධරය, ගොපාලය, සුප්පගෙධය, හිරිය. නෙත්තියය, මන්දියය, පඤ්චාලචණ්ඩය, ආලවකය, පජ්ජුන්නය, සුමනය, සුමුඛය, මණිමාණිචරය, දීඝය. සෙරීසකය—යන මේ යක්ෂයින්ට මේ මහා යක්ෂයින්ට මේ සෙනාපතීන්ට මේ මහා සෙනාපතීන්ට මේ යක්ෂතෙම ශීර්ෂරොගාදිය වඩිනයකරමින් පීඩාකරන්නේය. මේ යක්ෂතෙම මාංසරුධිරාදිය වියලවමින් හිංසාකරන්නේය. මෙ යක්ෂතෙම විශෙෂයෙන් හිංසාකරන්නේය. මේ යක්ෂතෙම අපස්මාරග්‍රහණයකොට නොහරනේයයි කියා මුරගා කියයුත්තේය. අඬගා කියයුත්තේය, නිදුකානන්වහන්ස මේ ආටානාටිය පිරිතවනාහි භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටද උපාසිකාවන්ටද ගුප්තිය පිණිස ආරක්ෂාපිණිස ආවෙශොන්මාදාදි යක්ෂොපද්‍රව නොවන පිණිස සතර ඉරියව්වෙහි භයොපද්‍රව රහිතව සැපසේ විසීම පිණිස වන්නේයයි දන්වා—නැවත නිදුකානන්වහන්ස, අපි බොහෝ කෘත්‍ය ඇත්තෝ වෙමු බොහෝකතිව්‍ය ඇත්තෝ වෙමු එබැවින් දූන් අපි යම්හයි දන්වූවාහුය, එවිට බුදුරජතෙම, මහරජදරුවෙනි යම් ගමනකට සිතවූද ඊට කල්දනුමයි වදාළේය. ඉක්බිති වරම් මහරජ දරුවෝ හුනස්නෙන් නැගිට බුදුන්වැඳ ප්‍රදක්ෂිණාකොට එතන්හිම අන්තර්ධානවූවාහුය සෙසුයක්ෂයෝද සමහරෙක් බුදුන්වැඳ ප්‍රදක්ෂිණා

කොටද සමහරෙක් දෙහොත්මුදුන්හි නමස්කාරකොටද සමහරෙක් සමග සතුටුවිය යුතු කථාදියකොටද සමහරෙක් නාමගොත්‍ර අස්වාද සමහරෙක් තුෂ්ණීම්භූතවූවාහුද එතැන්හිම අනතඩීනාවූවාහුය, නැවත බුදුරජාණන්වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට ඉකුත් රාත්‍රියෙහි සතරවරම් මහරජදරුවෝ ආප ටිදින් ආටානාටිය පිරිත වෙසමුනි මහරජහු විසින් ප්‍රකාශකළ පරි දින් බුඩාඥතෙජස් පිහිටුවා ශ්‍රීමුඛයෙන් වදාරා, උගණ්හාථ භික්ඛවෙ ආටානාටියංරක්ඛං පරියාපුණාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛංධාරෙථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං අත්ථසංහිතා භික්ඛවෙ ආටානාටියා රක්ඛා භික්ඛූණං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති—යන්නෙන් මහණෙනි ආටා ටියනම් ආරක්ෂාපිරිත පදව්‍යඤ්ජන නොපිරිහෙළා උගණුව මහ ණෙනි ආටානාටිය නම් ආරක්ෂාපිරිත නිරන්තරයෙන් පුහුණුකරව මහණෙනි ආටානාටිය නම් ආරක්ෂාපිරිත ධරාගණුව මහණෙනි ආටානාටියනම් පිරිත මෙලොපරලෝ දෙකින් අභිමතවූ අභිසිද්ධි කොට දීමට සමර්ථය එහෙයින් අර්ථවත්ය. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන්ට අමනුෂ්‍යයන්ගෙන් වන උපද්‍රවය නිවාරණය පිණිස ආරක්ෂා පිණිස ආවෙශොන්මාදාදි පීඩානොවනු පිණිස සතර ඉරියව් වෙහි භයොපද්‍රව නැතිව සැපසේ විසීමපිණිස වන්නේයයි මේ ආටා නාටිය පිරිත අනුදැන වදාළේය. එසේ ශ්‍රීමුඛයෙන් වදාළකල්හි කෙළ ලක්ෂයක් සක්වළ ආඥාව පැතිර ගියේය, මේ ප්‍රකාශවූයේ ආටානාටිය පිරිත කවරෙකු විසින කියනලද්දේද යනාදි ප්‍රශ්නයන්ගේ විසඳීම නම්වේ. මෙසේ හෙයින් මේ ශාසනයෙහි මෙලොවපරලො සියලු උපද්‍රවලින් මිදී ලොව්ලොවුතුරු සැපලබාගණු කැමති ගිහිපැවිදි සියල්ලන් විසින් මේ ආටානාටිය නම් බ්‍රහ්මමන්ත්‍රය යථොක්තනයින් අක්ෂරපද ව්‍යඤ්ජන නොපිරිහෙළා නිස්සරණ පක්ෂයෙහිසිට මනාකොට පුරුදු පුහුණු කරගතයුත්තේමය. මේ ශාසනයෙහි ශීලසම්පන්නවූ යමෙක් නිස්සරණාධ්‍යාශයෙන් අක්ෂරපද ව්‍යඤ්ජන නොපිරිහෙළා පුහුණුනොකොට ධනනෙණ ලාභසත්කාරාදිය ගරුකොට මෙහින් පිරිත්කරන්නේනම් මේපිරිතෙන් පහකරගත නොහැකි අමනුෂ්‍යොපද්‍රවයක් මේ ඉරසඳදෙකින් එළියවන මේසක්වළෙහි තබා මෙවැනි කෙළලක්ෂයක් සක්වළයන් අතුරෙහිද නැත්තේමය, එහෙයින් මෙකළ ගිහිපැවිදියකදුරන් විසින් ගරුකොට සලකනලද ඔවුන්ගේ ඒ යක්ෂමන්ත්‍රයන්ගේ ආනුභාවය කතමැදිරියන්ගේ ප්‍රභාවය වැනිවේ මේ ආටානාටියනම්වූ බ්‍රහ්මමන්ත්‍රය වනාහි අමනුෂ්‍යොපද්‍රව නැමති අන්ධකාර විධ්වංසනයෙහි සරත්කාලයෙහිවූ සූර්යමණ්ඩලය වැන්නේයයි දතයුත්තේය—මෙතෙකින් පිරිත් ධර්මයෝ කවරෙකු විසින් කවරකළෙක කවරතැනකදී කුමක් පිණිස වදාරණලද්දාහුදැයි යන ප්‍රශ්නයන්ගේ විසර්ජනයෝ නිමකරණලද්දාහුය

## 8. ප්‍රශ්නය.

පිරිත් කිරීම පිණිස ආරාධනාවක් පැමිණිකල්හි භික්ෂූන් විසින් කෙසේ පිළිපැදියයුතුවේද, යත්හෙති විසජ්ජිතබ්බං-ගිලානස්සපරිත්තං කාරාපිතෙනකනිද්දෙසනා නකාතබ්බං භණිතාති වුත්තෙපන භණිතබ්බං—යන්නෙහන් පාළිමුත්තකයෙහි (යම් කිසි ගිහියෙක් භික්ෂුවක්හට පැමිණ) ස්වාමීනි අපගේ ගිලනාට පිරිතක් කළ මැනවැයි කී කල්හි භික්ෂූන්විසින් පිරිත නොකටයුත්තේය,(කුමක් හෙයින්ද යත් ගිලනාට ආරක්ෂාවක් කළ මැනවැයි කියා යකැදුරෙකුට භූතවෛද්‍ය කර්මයක්කිරීමට යාඥාවක් කරන්නාක්මෙන් පිරිතටද ආරක්ෂාවය යන අර්ථ ඇතිහෙයින් පිරිත්කළ මැනවැයි යන අසැපවචනයෙන් කළ ආරාධනාව පිළිගෙණ පිරිත් කිරීම භූත වෛද්‍යකර්මයක් කිරීමක් මෙන්ද ගිහිකර්මයක්මෙන්ද වන හෙයිනි ඒහෙයින් එසේ නොකියා )පිරිතක් කියනු මැනවැයි කී කල්හි වනාහි කියයුත්තේයයි දක්වන ලද්දේය. කුමක්හෙයින්දයත් පිරිත්කියවූයන වචනයෙන් කළ ආරාධනාව ධර්මාරාධනාවක් බැවින් ආරාධනාව නොලද්දහු විසින් පවා කියයුත්තේය-සචෙපිස්සහොති මනුස්සාතාම නජානන්ති අකයිර මානෙ විප්පටිසාරිනො භවිස්සන්තීති කාතබ්බං—යනු කී හෙයින් ඉදින් ඒ භික්ෂුවට මේ මනුෂ්‍යයෝ පිරිත් කියවූයන කැප වචනයෙන් ආරාධනාකරන්නට නොදන්නාහුය පිරිත් නොකරණු ලබත කල්හිද විප්‍රතිසාර ඇත්තෝවන්නාහුයයි හැඟිමවේනම් පිරිතකටයුත්තේය, පිරිත් වතුරක් හෝ පිරිත්නූලක් හෝ කොට දෙවූයයි කීයන් ලද භික්ෂුව විසින් වනාහි මේ පරිත්‍රාණය මෙයි ප්‍රවිෂ්ටකරවම යන සිතින් ගිහියන් සතුකෙවු වතුර අතින් කලඹ කැලඹා ඔවුන්ම යන් තක නූලෙහි අතින් පිරිමැද මැද පිරිත්කොට දියයුත්තේය, මේ කාරණය, පරිත්තොදකං පරිත්තසුත්තං කත්වාදාතබ්බන්ති වුත්තෙපන පන පොසංයෙව උදකං හත්ථෙන චාලෙත්වා සුත්තං පරිමජ්ජිත්වාදාතබ්බං, යන පාළිමුත්තක පාඨයෙන් ප්‍රකාශවේ, මෙහි හත්ථෙන චාලෙත්වා සුත්තංපරිමජ්ජිත්වා දාතබ්බං—යන්නෙහන් පිරිත් කරණ විධිය දක්වනලද්දේය, මෙහි චාලෙත්වා පරිමජ්ජිත්වා යන්නෙහන් මේ පිරිතෙහි ආඥුව මේ වතුරට ප්‍රවිෂ්ටකරමි යන සිතින් පැන් සොලවා නූල අතින් පිරිමැද මැද පිරිත්කියා දියයුත්තේයයි දක්වන ලද්දේය—මෙසේ වතුර නූල් තෙල් වැලි ආදියට පිරිත්කළ කල්හි පිරිතෙහි ආඥුව එහි ප්‍රවිෂ්ටකරණ ලද්දිනම්වේ, මේ කාරණය පරිත්තකාරණ විනිච්ඡය කථාලඞ්කාරයෙහි-ඉදංවාපරිත්තාණං එත්ථපවෙසෙමීති විචින්තෙන එවංකතෙ පරිත්තාණංඑත්ථපවෙසිතංනාමහොති, යන්නෙහන් කියනා ලද්දේය, තවද පාළිමුත්තක විනය විනිච්ඡය කථාව

සී—සඞ්ඝෙ විහාරතො උදකං අත්තනොසන්තකංවාසුත්තං දෙසිද්ධබ්බා
මං—යන්නෙහි ඉදින් යම් මහණකෙනෙක් විහාරයෙන් ගෙවත් පන්
සලින් වතුර හෝ තමා සන්තක නූල්පටක් හෝ පිරිත්කොට බෙහෙත්
කළහැකි තැයින් ගැරසෙසු ගිහියෙකුට දෙයි නම් ඒ භික්ෂුව දුකුළා ඇව
නට පැමිණේයයි කියන ලද්දේය තවද මනුෂ්‍යයෝ වතුරද නූල්ද
ගෙණවුත් තිඳ පිරිත් කියවූයයි කියත් නම් පිරිත්කළයුත්තේය. ඉදින්
මනුෂ්‍යයෝ පිරිත්නාවූ නොකියා කියවූ යන වචනයෙන් ආරාධන
කරන්ට නොදනිත් නම් එය භික්ෂූන් විසින් කියාදිය යුත්තේය, තවද
පෙළෙහිහුන් භික්ෂූන්ගේ පාදයන්හි පැන් ඉස රොගව්‍යසන සමනාදිය
පිණිස පිරිත්කිරීමට නූල්දතබා පිරිත්කියනු මැනවැයිකියා යන සිරි
තෙක් පෙර එක් ප්‍රදෙශයෙක මිනිසුන්ගේ ඇතිවූයේය. එසේකරණු
ලබන කල්හි භික්ෂූන්පාදයන් ඉවත්කරගණිත් නම් එය ඒ මනුෂ්‍යයෝ
අවමඞ්ගල්‍යයකැයි කියාද රොගය නොසන්සිඳෙන්නේයයි කියාද
සිතන්නාහුය. එහෙයින් එසේකළතැන්හිදී පාදයෝ ඉවත්කර
නොගතයුත්තාහුය, තවද ඇතුළුගමෙහිද ගිලනුන් පිණිස කියන්වා
යයි විහාරයට හරින්නාහුය එසේකළකල්හිද පිරිත් කියයුත්තේය
ඇතුළුගමෙහි රාජගෘහාදීන්හි රොගයක් හෝ උපද්‍රවයක් හෝ උපන්
කල්හි භික්ෂූන් කැඳවා පිරිත් කියවා ගන්නාහුය ඒතැන්හිදී භික්ෂූන්
විසින් ආටානාටිය සූත්‍රාදිය කියයුත්තාහුය—පහාරෙදින්නෙ මත්තෙපි
අමරණාධිප්පායස්ස අනාපත්තීති වුත්තත්තා තාළකණ්ටකෙනෙව අමනුස්ස
ගහිතස්ස පහාරොදාතබ්බො තාළපණ්ණං පන පරිත්තසුත්තංවා හත්ථෙ
වාපාදෙ වාබන්ධිතබ්බං රතනසුත්තාදීනිපරිත්තානි භණිතබ්බානි-යනු
කීහෙයින් පහරදුන් කල්හි මලේ නමුත් නොමරණ අභිප්‍රාය ඇත්
තා හට අනාපත්තිය කියනලදයයි සලකා එපමණකින් අමනුෂ්‍ය
යෙකු විසින් ගන්නා ලද්දෙක් හට පහරදෙනාදිය යුත්තේය අත්තයි
හෝ පමණ හෝ තාල පත්‍රයක් හෝ පිරිත්නූලක් හෝ බැඳිය යුත්
තේය රතන සූත්‍රාදි පිරිත් හෝ කියයුත්තාහුය, මෙහි තල්කොළය
පිරිත් ලියන තැනක් බැවින්ද පිරිත්හුය පිරිත්කරණ සඞ්ඝ ඇති බැ
වින්ද ඒ තල්පත් ආදිය දැක අමනුෂ්‍යයෝ පිරිත් සඳහාවෙත් පහව්යත්
නාහුය, එහෙයින්, තාලපණ්ණංපන පරිත්තසුත්තංවා හත්ථෙවා පා
දෙවාබන්ධිතබ්බං—යන්න කියන ලද්දේය, මාසීලවන්තානං භික්ඛූනං විහෙ
ඨෙයිනි ධම්මිකථාකාතබ්බා ආටානාටිය පරිත්තංවා භණිතබ්බං—සිල්
වත් භික්ෂූට වෙහෙස නොකරවයි කියා ධර්මකථාවක් කටයුත්තීය.
ආටානාටිය පිරිතහෝ කියයුත්තේය—මේ ප්‍රකාශවූයේ ඝනි පිරිත
හැර සෙසුතැන්හිදී භික්ෂූන් විසින් පිළිපැදියයුතු ක්‍රමයයි—

## 9. ප්‍රශ්නය.

සතියක් මුළුල්ලෙහි පිරිත් කියවනට නියමයක් ඇත්තේ නම් කවර නැනාහදී කුමක් පිණිසද යන ප්‍රශ්නයට පිළිතුරනම් —ආටානාටා දුදී වශයෙන් අමනුෂ්‍යොපද්‍රවයක් ඇතිවූ කල්හි [illegible] ආටානාටිය පිරිත කීමට බලාපොරොත්තුව ඒ ආටානාටියට පරිකර්මවශයෙන් සතියක් මුළුල්ලෙහි පිරිත් කියම්නට නියමය ඇත්තේය යනුයි—

## 10 ප්‍රශ්නය.

සතිය මුළුල්ලෙහි පිරිත් පිණිස කියයුතු සූත්‍රයෝ කවරහුද-යන ප්‍රශ්නයෙහි, මෛත්‍රසූත්‍රය ධජග්ගසූත්‍රය රතන සූත්‍රය යන සූත්‍ර තුන පමණක් සතිය මුළුල්ලෙහි කිය යුත්තාහුය යනු ප්‍රසිද්ධයෙවි—මේ කාරණය ආටානාටිය පිරිතට පරිකර්ම දක්වන්නාවූ අටුවාවෙහි, පඨම මෙව හි ආටානාටිය සුත්තං න භණිතබ්බං මෙත්තසුත්තං ධජග්ගසුත්තං රතනසුත්තන්ති ඉමානි තීනි සත්තාහං භණිතබ්බානි සචෙ මුඤ්චති සුන්දරං නො චෙ මුඤ්චති ආටානාටියසුත්තං භණිතබ්බං යන්නෙහෙන් පළමු කොටම ආටානාටිය සූත්‍රය නොකියයුත්තේය මෛත්‍රසූත්‍රය ධජග්ග සූත්‍රය රතනසූත්‍රයයි යන මේ සූත්‍රයෝ තුන සතියක් මුළුල්ලෙහි කියයුත්තාහුය ඉදින් අමනුෂ්‍යයා අත්මිදෙයිනම් යහපත්මෙව ඉදින් නොමිදෙයිනම් ආටානාටිය සූත්‍රය කියයුත්තේයයි කියනලද්දී, මෙහි සත්තාහං භණිතබ්බානි “සත්ත අහානි, සත්තාහං” යනු කාලවාචි විලිඞ්ගයා කොරෙත් පරම අත්‍යන්ත සංයොගයෙහි විනියාව යෙදීත්’ සරදං රමණී යානදී, සබ්බකාලං රමණීයං නන්දනං, තයොමාසෙ අභිධම්මං දෙසෙසි යනාදී තන්හි මෙන් සතියමුල්ලෙහි නිරන්තරයෙන් යටකී සූත්‍ර තුන පමණක්ම කියයුත්තාහුයයි දතයුතුයි. එහෙයින් පිරුවාණා පොත තබාගෙණ සරණාගමන සූත්‍රය පටන් අන්‍ය සූත්‍රවලින් නිරන්තරයෙන්යුගකීමද ධම්මචක්කාදි සූත්‍රකීමද පුරකඩඅස්න විහාර අස්න අනුශාසනාදියකීමද ආගමන්‍යමයක් නොව කිතුවත්කාර ආගමවිරුද්ධ පිළිවෙලක්බව දතයුත්තේය – මෙකී ආගම නියමයට පරිද්දෙන් මෛත්‍රාදිසූත්‍රතුන පමණයි සතිය මුළුල්ලෙහි කුමක්හෙයින් කියයුත්තාහුදයත් ඒ තුන්සූත්‍රය කීකල්හි ආටානාටිය පිරිත ලබනලද ආසෙවනයඇතිවී අතිශයින් බලවත්වන්නේය, මේ කාරණයද විනයාලඞ්කාරයෙහි, එවං නිලද්ධා සෙවනං ලද්ධා අපි බලවන්තං හොති – යත්තෙන් කියනලද්දේය—

## 11. ප්‍රශ්නය.

ආටානාටිය පිරිත කියන භික්ෂුව විසින් කෙසේ පිළිපැදියයුත්තේද — යන්නෙහි “ තං භණන්තෙන භික්ඛුනා පිට්ඨං වා මංසං වා න ඛා

දි තබ්බං සුසානෙ නාභවසිතබ්බං කස්මා අමනුස්සා ඔතාරං ලභන්ති පරිත්ත කරණට්ඨානං හරිතූපලිත්තං කාරෙත්වා තත්ථපරිසුද්ධං ආසනපඤ්ඤපෙත්වා නිසීදිතබ්බං"-යනු අටුවාහෙයින් ඒ ආටානාටිය කියන භික්ෂුව විසින් පිරිවෙන් එළිමහන් කුකුල්වන් හරක්වස් ආදී [illegible] ගේ 'පිට්ඨංපා [illegible],' යන්නෙහි අනියම්හිටිවා ගෙබඳුමයෙන් ප්‍රධාන වූ ගෙ දියමස් [illegible] වූව කැමිලි ආදිය හෝ නොගැලපුන්සේ [illegible], සොහොන් භූමියක නොවැසිය යුත්තේය, [illegible] නිසාදයෙන්, තමන් විසින් ප්‍රියකාරණලද කැඩුම් කැබිලි දියවස් [illegible] වස් ආදියෙහි නිරතුරුව වාසයකරණ සොහොනෙය යන සථාන ලබනෙද, බැවින් පිරිත්කරණ භික්ෂුවට උපද්‍රව කිරීමට අවතුණුයෙන් අවකාශ ලබන්නාහුය. එහෙයින් ඒසියල්ලෙන් වැලකි පිරිත්කරණ සථානය අමුගොම් ගැල්වීම කරවා එහි පිරිසිදු ආසනයක් පනවා හිඳගතයුත්තේය. (මෙහි ගොම ගැල්වීමකරවා භූමිය පිරිසිදුකිරීම පෙනුරාණිය [illegible] ව්‍යක්තවේ මෙසේ පිරිත්කරණ තැන භූමියද සුධයොට [illegible] විෂය හිඳ ගැණීමට පිරිසිදුආසනයක් ඕනැකරන්නාක් මෙන් [illegible] භික්ෂුවගේ ශීලවිසුද්ධියද මෙතනා [illegible] ඉතා විශුද්ධියද කැමතිවිය යුත්තීය, කුමක්හෙයින් දයත් දුශ්ශීලයාගේ දුශ්ශීල භාවය අනුදහනාඕසෙත්ද දුගීධාඕයෙත්ද පලිකඨක [illegible] කඩක්වේ, තංහි නිරයාදිසු අපායෙසු අනුගහන්ති අනුදහ [illegible] වන පිම් ලං, යනු කිහෙයින් ඒදුශ්ශීලභාවය වනාහී [illegible] අපායන්හි අනුදහනය කරානුයි අනුදහනාඕයෙන්ද කිළුශෙ [illegible] —තෙන [illegible] ගෙතාපුගනලොමාතා පිතෑපානම්පිසනාපි [illegible] අනතරෙ බොධිචෙතියට්ඨානෙසුපි ජිගුච්ජනිය [illegible] එව රූපංකිර තෙන පාපකම්මං කතන්ති අවණ්ණගෙඝාසාවාය තීනි දුනෙත් ධනට්ඨනච්ච්ලං—යනු කි හෙයින් ඒ දුශ්ශීලභාවයෙන් යුක්ත පුද්ගලයා මව්පියන්ගේ සමීපයෙහිද භික්ෂුසඞ්ඝයාගේ අතුරෙහිද බොධිචෛත්‍ය ස්ථානයන්හිද පිළිකුල් කටයුත්තෙක්වේ සියලු දිසාවන්හිද ඔහු විසින් මෙබඳු පාපකර්මයක් කරණ ලද්දේයයි කියා ඔහුගේ අවණ්ගඝයද වහනයවේනුයි දුගීධාඕයෙන්ද කිළුටෙන්වේ—තෙනසමන්නාගතා පුගනලාගතගතට්ඨානෙ උපතාපං වෙදනෙති [illegible] සාබෝ දීනිවස්ස අසුචිනී [illegible] අපනේසරනීනි කිලිට්ඨකාරණ [illegible] පිමලං—යනු කී හෙයින් ඒ දුශ්ශීල භාවයෙන් යුක්තපුද්ගලයා ගියගිය තන්හි උපතාපයද ලබන්මය ඔහුගේ කාය කම් [illegible] ප්‍රභාවර කර්මයෝවෙන්නුයි කලිඝට තරණ [illegible] —පටිවිසුද්ධිමාර්ගයෙහි—අපිච දුස්සීලං [illegible] පුග්ගලා [illegible] පොහොනි දෙවමනුස්සානං අනනුසාසනීයො [illegible] බ්‍රහ්මචාරීනං දුක්ඛිතො දුස්සීලනරකාසු විප්පටිසාරීසීලවතං පසංසාසු [illegible] දුස්සීලානං [illegible]

සාණසාටකොවිය දුබ්බණ්ණො මහාතියෙහො පනාසස දිද්ඨානුගතිං ආ
පජ්ජනාතිතෙසං දීඝරත්තං අපායදුක්ඛාවහනතො දුක්ඛසම්ඵස්සො සො
දෙය්‍ය ධම්මිං පතිගණ්හාති තෙසං න මහප්ඵලකරණතො අප්පග්ඝො
මනකවස්සගණ්ඨික ගූථකූපොවිය දුබ්බිසොධොඡවාලාතමිව උභතොප
රිබාහිරො භික්ඛුභාවං පටිජානන්තොපි අභික්ඛුයෙව ගොගණං අනු
බද්ධගද්‍රභොවිය සතතුබ්බිග්ගො සබ්බවෙරි පුරිසොවිය අසංවාසාරහො
මතකලෙබරංවිය සුතාදිගුණයුත්තොපි සබ්‍රහ්මචාරීනං අපූජාරහො
සුසානග්ගිවිය බ්‍රාහ්මණානං අභබ්බො විසෙසාධිගමෙ අන්ධොවරූප දස්
සනෙ නිරාසො සද්ධම්මෙ චණ්ඩාල කුමාරකො වියරජ්ජෙ—සත්තෙන්
වැලිදු දුස්සිල පුද්ගලතෙම තමාගේ දුස්සිලභාවය හෙතුකොටගෙණ
දෙවිමිනිසුන්ට අමනාප කෙණෙක්වේ පිළිසුල් බැවින් සබ්‍රම්සරුන්ට
අනුශාසනා කටයුත්තෙක් නොවේ දුස්සිලයන්ට ගහුකරණකල්හි
තමාද දුක්ඛිතයෙක්වේ සිල්වතුන්ට ප්‍රශංසාකරණකල්හි තෙමෙපසුව
තනාපයට පැමිණෙ එම දුස්සිලභාවයෙන් සණවාසාධන්මෙන් ගුණ
වණ්ණයෙන්ද ශරීරවණ්ණයෙන්ද පහවූයෙක්වේ, ගිහිපැවිදි යම් කෙ
ණෙක් ඒ දුස්සිලයාගේ ලබ්ධිඅනුභවට පැමිණෙත්ද ඔවුන්ට බො
හෝ කලක් අපාදුක්එලවන හෙයින් දුඃඛපහසී ඇත්තෙක්වේ යම්කෙ
ණෙකුන්ගේ දානවස්තුව පිළිගණීද ඔවුන්ට මහත්ඵල නොකරණ
බැවින් මදක් අගණෙවී නොයෙක් සියගණන් හවුරුදුවුඑල්ලෙහි
රුස්වූ අසුචි වලක්මෙන් සුධකරන්ට නොහැකිවේ දෙකොන ගිණි
ගත් මැද අසුචි තැවරුනු අවිහුල් පමණවූ සොහොන් පෙනහෙල්
ලක්මෙන් ශ්‍රමණභාවයෙන්ද ගිහිභාවයෙන්ද බාහිරවූයෙක්වේ මම
භික්ෂුවෙක්මියි ප්‍රතිඥකරන්නේද අභික්ෂුවෙක්මවේ ගවසමූහයක්ව
අනුබඳයන්නාවූ කොටළුවෙක් වැනිවේ, හැමදෙනාටම වෛරී පුරු
ෂයෙක්මෙන් නිරන්තරයෙන් කලකිරෙන්නෙක්වේ මලමිනියක්
මෙන් එක්ව වැසීමට නුසුදුස්සෙක්වෙ, ගිනිදෙව්සා පුදනා බමුණන්ට
සොහොන් ගින්නක්මෙන් සබ්‍රම් සරුන්ගේ පූජාවට නුසුදුස්සෙක්
වේ නීලපීතාදි රූපදශීනයෙහි අභව්‍යවූ අන්ධයෙකුමෙන් විශෙෂාධි
ගමයෙහි අභව්‍යයෙක්වේ රාජ්‍යයෙහි අභිෂෙකයට ආසානැතිසැඩොල්
දරුවෙක් මෙන් ප්‍රතිපත්ති ප්‍රතිවෙධසද්ධර්මයෙහි ආසානැත්තෙක්වේ
යයි කියන ලද හෙයින්ද, දුස්සිල්‍යමලය පහකරගැණීමෙන් පිරිත්
කරණ භික්ෂුවගේ සිල්විසුද්ධියද කැමතිවිය යුත්තිය—එවද, පරිනත
ක්‍රාරතොභික්ඛු විහාරතො නික්ඛමන්තොහි එලකාවුධෙහිප වාරෙනවා
නෙතබ්බා අබ්භොකාසෙ නිසීදිත්වා භවනතබ්බං මාරෙවාන පාණාදි
නිපිදන්තිත්වා නිසින්නෙනාන ආවුධහත්ථෙහි සම්පරිවාරිතෙන මෙතන
චිත්තං පුරෙචාරිකං කත්වා වත්තබ්බං—යනු අටුවාහෙයින් ආචාතාපි

ස පිරිතකරණ භික්ෂුවද විහාරයෙන් පිරිත්කරණ ගෘහයට වැඩම්වා ගෙණ යන්නාවුන් විසින් එලකාවුඩගත් අත්ඇති මිනිසුන් විසින් පිරිවරා පමුණුවා යතයුත්තේය අවයවකාශයෙක්හි හිඳ ආටානාටිය පිරිත නොකියයුත්තේය වාරවාතපානාදිය වසා ආවුධගත් අත්ඇති මිනිසුන් විසින් පිරිවරණලදුව හුන්නාවූ එක භික්ෂුවක් විසින් මෛත්‍රී චිත්තය පෙරටුකොට හසුරුවා ආටානාටිය පිරිත කියයුත්තේය-මෙයින් පිරිත් කරණ භික්ෂුවට අන්තරාවක් කිරීමපිණිස අමනුෂ්‍යයාට අවකාශ නොලැබෙනසේ ආධ්‍යාත්මිකබාහිරා රක්ෂාව සංවිධානය කරණලද්දේනම්වේ යම්සේ නා පොළොන් සිංහව්‍යාඝ්‍රාදි සත්වයින්ට ගොදුරු පිණිස අසුවුසතෙක්ව මුදවා හරින්නාවූ පුරුෂයාකෙරෙහි ඒ සිංහ ව්‍යාඝ්‍රාදිහු ප්‍රදුෂ්‍යසිත් ඇත්තොවී ඒ පුරුෂයාට අන්තරාකරන්නානුද එසේම අමනුෂ්‍යයාට අසුවූ පුරුෂයෙක්ව මුදවාගැණීම කරණ භික්ෂුව කෙරෙහි අමනුෂ්‍යයෝ ප්‍රදුෂ්‍ය සිත් ඇත්තෝවී අවකාශයක් ලැබුනාහුනම් අන්තරාකරන්නාහුය එහෙයින් මෙහි එලකාවුඩාදිය ගත්තවුන් විසින් පිරිවරානැණීමාදියෙන් බාහිරාරක්ෂාවද නියමකරණ ලද්දේය—එසේම-මෙත්තාභාවනා රහිතං පංසුපිසාචකාපිඩං සයනාති පගෙව උළාරා අමනුස්සා—යන්නෙන් පාංශුප්‍රේතයෝද මෛත්‍රීභාවනාව නැති පුද්ගලයාව විනාසකරන්නාහුය උළාරවූ අමනුෂ්‍යයෝ ගැණ කියනුමකවරේදැයි කියනලද හෙයින් මෙහි මෛත්‍රීභාවනාව පෙරටුකොට හැසුරුවීමද ආධ්‍යාත්මික ආරක්ෂාව නම්වේ—තවද, පඨමං සික්ඛාපදානි ගාහාපෙත්වා සීලෙපතිට්ඨිතස්ස පරිත්තංකාතබ්බං—යනු අටුවා හෙයින් (පිරිත්කරණ භික්ෂුවමෙන්) පළමුකොට ශික්ෂාපද සමාදන්කරවා සීලයෙහි පිහිටියාහටම පිරිත කටයුත්තේය. මෙසේද කොටමුදවාගන්ට නොහැක්කහු විසින් කුමක් කටයුත්තේදයත්,—එවම්පි මොචෙතුං අසක්කොන්තෙන විහාරං සොධෙත්වා චෙතියඞ්ගනෙ නිපජ්ජාපෙත්වා ආසනපූජංකාරෙත්වා දීපජාලං පොත්වා චෙතියඞ්ගණං සම්මජ්ජිත්වා මඞ්ගලගාථාවත්තබ්බා සබ්බසන්නිපාතො ඝොසෙතබ්බො විහාරස්ස උපවනෙ ජෙට්ඨකරුක්ඛො නාම හොති තත්ථ භික්ඛුසඞ්ඝො තුම්හාකං ආගමනං පතිමානෙතීති පහිණිතබ්බං සබ්බසන්නිපාතඨානෙ අනාගන්තුං නාමනලබ්භති තතො අමනුස්සගහිතකො තුං කොනාමො සිත්පුච්ඡිතබ්බො නාමෙ කථිතෙ නාමෙනෙව ආලපිතබ්බො ඉත්ථංනාමතුය්හං මාලාගන්ධාදිසු පත්ති ආසනපූජායං පත්ති පිණ්ඩපාතෙ පත්ති භික්ඛුසඞ්ඝෙන තුය්හං පණ්ණාකාරත්ථාය මහාමඞ්ගලගාථාවුත්තා භික්ඛුසඞ්ඝෙ ගාරවෙන එතංමුඤ්චාහිති මොචෙතබ්බො සචෙනමුඤ්චති දෙවතානං ආරොචෙතබ්බං තුම්හෙ තුම්හෙ ජානාථ අයං අමනුස්සො අම්හාකං වචනං නකරොති මයං බුද්ධආණං කරිස්සාමිති පරිත්තං කාතබ්බං අයං තාවගිහීනං පරිකම්මං—යනු අටුවාහෙයින් මෙසේද මුදවාගන්ට නොහැක්කහු විසින් ඒ අම

මනුෂ්‍යෝපද්‍රවය ඇති පුරුෂයාව විහාරයට ගෙණගොස් චෛත්‍යාඞ්ගණයෙහි හොවා බුඩාසනයන්හි මල්ආදිය පූජාකරවා පහන් දල්වා චෛත්‍යාඞගණය හැමද අමනුෂ්‍යයන්ගේ සිත් සතුටුකිරීමපිණිස පණ්ණාකාරකොට මඞගලගාථා කියයුත්තාහුය සියල්ලන් විසින් චෛත්‍යාඞගණයෙහි රැස්වියයුත්තේයයි ඒවිහාරයෙහි ඒ ග්‍රාමක්ෂෙත්‍රයෙහි සිටුනු භික්ෂූන්ගේ සන්නිපාතය ඝොෂාකටයුත්තේය—තදනන්තරව ඒ විහාරයට සමීපවූනයෙහි ප්‍රධාන වෘක්ෂයෙක් නම්වේ එතැන්හි නුඹවහන්සේලාගේ පැමිණීමහැණ භික්ෂුසංඝයා බලාපොරොත්තුව සිටිනේයයි දන්වා කොතෙක් හැරිය යුත්තේය, සියල්ලන්ගේ රැස්වනස්ථානයෙහි බුඩාඥවට භයින්ද සතරවරම් මහරජදරුවන්ගේ අණ පවතින ස්ථානය බැවින් රජාඥවට භයින්ද අමනුෂ්‍යයින්ම නොපැමිණ සිටින්ට නොලැබේ, එයින් පසු අමනුෂ්‍යාවේශය ඇත්තාහු අතින් නුඹ කිනම් ඇත්තෙක්දැයි විචාරියයුත්තේය, නාමය කිකල්හි ඒ නමින්ම ආමන්ත්‍රණය කළයුත්තේය. කෙසේද මෙනම් ඇති යක්ෂය තට මල්සුවඳදි පූජාවන්හි පිනද චෛත්‍යයෙහි බුඩාසන පූජාවෙහි පිනද භික්ෂුසංඝයාට පිණ්ඩපාත දානයෙහි පිනද දෙමු භික්ෂුසංඝයා විසින් තට පණ්ණාකාර පිණිස මහාමඞගල ගාථා කියන ලද්දැනුය භික්ෂුසංඝයා කෙරෙහි ගෞරවයෙන්ද මේ පුරුෂයාව හරුවයි කියා මුදැවිය යුත්තේය. ඉදින් මෙසේකොටද නොමිදෙයිනම් ඉන්ද සොමාදි යක්ෂසේනාපත්‍යාදි දෙවතාවුන්ට නුඹවහන්සේලා නුඹවහන්සේලා දූතගණීවූ මේ අමනුෂ්‍යයා අපගේ වචනය නොකරයි එහෙයින් අපි බුඩාඥව කරන්නෙමුයයි දන්වා ආටානාටිය පිරිත කටයුත්තේය මේ පළමුකොට භික්ෂුන්ට පිරිත් කිරීමෙහි කියනලද පරිකර්මයවි—තවද භික්ෂුවෙක්ව අමනුෂ්‍යයෙකු විසින් ගන්නාලද්දේනම් ආසනසෝද සඞසන්නිපාතය ඝොෂාකරවා අමනුෂ්‍යයාට සුවඳ මල් ආදියෙහි පින්දී ආටානාටිය කියයුත්තේය මේ භික්ෂුන්ට පිරිත් කිරීමෙහි පරිකර්මය නම්වේ, මෙයින් පිටත් පිරිත් කියන කරණ පිළිවෙළක් බුඩාගමෙම නැත්තේය. මේ දක්වූයේ ආටානාටිය පිරිතකියනා භික්ෂුව විසින් කෙසේ පිළිපැදියයුතුද යන්නෙහි විසඳීමනම්වේ

## 12. ප්‍රශ්නය.

මෙකල අප ලක්දිව සතිගණන් මුළුල්ලෙහි කරන්නාවූ පිරිත් පින්කම ආගමානුකූල පින්කමක්ද යන්නට පිළිතුරුනම්—මෙකල අප ලක්දිව භිඤපැවිදි දෙපක්ෂය එක්වී ධාතුනිධාන පින්කමයෙ කොතාපිහිටුවන පින්කමය, නෙත්‍රා තබන පින්කමය උපසම්පදා පින්

කාමය හවුරුදු පින්කමය ගෙට ගෙවදින පින්කමයයි කියා සහ පිරිත් පින්කමෙක් කරති, එහි පළමුකොට පිරිත පොත්කොට මහපිරිතයයි කියා පිරිතසන් හි හේවිලෙන් පවත් පිරුවාණා පොත තබාගෙණ සරණාගමන සූත්‍රයසටහන් ඉසිගිලි සූත්‍රය දක්වා සූත්‍රකියනවායයි ධම්මචක්කාදි සූත්‍රකිමද මහපිරිතයයි කියා මංගල රතනමෙත්තය නා සූත්‍ර තුනක්කිමද විහාරඅස්නය දෙරකඩ අස්නය අනුශාසනාවයයි කියා අට්ඨකථා සහිත පිටකත්‍රය ධර්මයෙහිම නැත්තාවූ ගී හැලී තුනක් කිමද සතරදෙනා බැගින් වාඩිවී දෙදෙනා දෙදෙනා එක එක පාඨය බැගින් ආටානාටිය සූත්‍රය කිමදකරන්නාහුය, මේ සිඟල්ල ගිත සවරයෙන්ම ගායනාකොට පිරිත අවසාන කරති මෙබඳු විසුලු විකාර පිරිත් පින්කමෙක් පෙරසිටි ආයුෂ්‍ය ශ්‍රාවකාදි ගිහිපැවිදි උත්තමයෝ කිසි කලෙකවත් නොකළාහුය. ඒ එසේමය, පළමුකොට දෙලොස් නහුතයක් හා සමග බුදුන් කරා පැමිණ බණ අසා සෝතාපත්ති ඵලයට පැමිණි බිම්බිසාරනම් මහරජතෙමේද ඒ වෙළුවනාරාමාදියෙහි පවා සතියක් තබා එකම දවසෙකවත් පිරිත් පින්කමයයි කියා මෙවැනි පින්කමෙක් නොකෙළේය. නොයෙක් දහස්ගණන් සිටි ශාක්‍ය කොලිය මහරජහුද මෙවැනි පිරිත් පින්කමෙක් නොකළාහුය විශාලා මහනුවරවාසි සත්දහස්සත්සිය සත්දෙනෙක් ලිච්ඡවි මහරජදරුවෝද රෝගදුර්භික්ෂ මනුෂ්‍ය යන තුන්භයක් පැමිණිකල්හි පවා මෙවැනි පිරිත් පින්කමෙක් නොකළාහුය, සිව්පනස්කෙළක් ධනවියදම්කොට ජේතවනාරාමය කරවා පූජාකළාවූ අනේපිඬු මහසිටානෝද සතියක් තබා එකම දවසෙකවත් මෙවැනි පිරිත් පින්කමෙක් නොකළේමය. සත්විසි කෙළක් ධනවියදම්කොට පූර්වාරාමය කරවා පූජාකළාවූ විසාඛා මහඋපාසිකාවද මෙවැනි පින්කමෙක් නොකළේය. ලෞකික ශ්‍රද්ධාවන් අචලශ්‍රද්ධාවන්තයෙක්වූ අජාසත්මහරජුද අසදෘශමහාධාතු නිධානාදියෙහි පවා මෙවැනිපිරිත් පින්කමෙක් නොකෙළේය චෛත්‍ය සහිත සුවාසූ දහසක් විහාරාරාමකරවා පූජාකළාවූ මුළුදඹදිවට අගරජවූ ධර්මාශෝක මහරජුද එම සුවාසූදහසක් චෛත්‍යවල ධාතුනිධානාදිය සඳහා සුවාසූදහසක් තබා එකම පිරිත් පින්කමෙක්වත් නොකෙළේය. අප ලක්දිව දෙවානංපියතිස්ස රජුද ථූපාරාමාදි චෛත්‍ය සඳහා එකම පිරිත් පින්කමෙක්වත් නොකෙළේය- එසේම කාකවණ්ණ තිස්ස මහරජුද තිස්ස මහවිහාරාදිය සඳහාද—මුළුලක්දිවට අගරජ බවට පැමිණ නොයෙක් සියදහස් ගණන් රටතුන්ට නිරන්තරයෙන් උපකාර කරමින් ස්වර්ණමාලි නම් අසදෘශ මහාචෛත්‍යාදිය කෙරෙව්වාවූ දුටුගැමුණු මහරජුද ඒ චෛත්‍යාදිය සඳහා සතියක්තබා එකදවසෙකවත් මෙවැනි පිරිත් පින්කමෙක් නොකෙළේය. එසේම සෙසු රජ යුවරජ සෙනෙවි සිටුවරාදීහුද ඒ ඒ විහාරාරාම පූජාදිය කරත්

නාහු මෙවැනි පිරිත් පිත්කමෙක් නම් නොකළාහුමය—එහෙයින් මෙකල කරන්නාවූ මහපිරිත්පිත්කම්නම් පෙර සිටි ගිහිපැවිදි උභමත් විසින් නොකළාවූ බුදුන්විසින් ප්‍රතික්ෂේපකරණලද ආමිසයම ගරුකොට සලකා ලාභසත්කාරාදිය උපදවාගණු කැමති මහණුන් විසින් ආගමානුකූල නොවනසේ සොදාගන්නාලද නාඩගමක් බව සැලකියයුත්තේය. ඒ එසේමය මෙකල යමහර ගෘහස්ථයෝ ලාභ උපදවා ගැණීම සඳහා ඒ ඒ නන්හි රූකඩ කෝලම් දිනනර ඇහළු පල වෙසඟනරාදි නාඩගම්කරවා මුදල් ආදිය සපයාගන්නාහුය එ පරිද්දෙන් බුදුන් විසින් නියමකළ ධම්දානාද ප්‍රතිපදාව හැරදමා තහනම්කළ ආමිස දානද ප්‍රතිපදාවට පිළිපන්නාවූ ආමිස ගරුක භික්ෂූහුද තමන්ට කැපනොවූ නම්ලමුදල් ක්ෂෙත්‍රවස්තු ගවමහිෂ ධන ධාන්‍යාදිය නා නා උපායෙන් රැස්කරන්නාහු පිරිත් පිත්කමයයි කියා මෙසේ පිරිතක් කිරීමද වස්තුසැපයීමට හැකිවූ එක්උපායෙකැයි සලකා පස්කම්සැපයෙහි ගිජුවූ මිනිසුන්ගේ සිත් පොළඹවන පරිද්දෙන් මේ පිරිත් නාඩගමද පටන්ගත්තාහුය. ඒ ගිහිපැවිදි පිරිත් නාඩගම්කාරයෝ ඊට සුදුසු පරිද්දෙන් පළමුකොට සතරදිගට දොරවූ ඇති විසාල මඩුවක් කරවා එහිතුලද වටකරකැමෙවනසේ විසිතුරු මණ්ඩපයක්ද බැඳ එහි එක්පසෙක පුටුදෙකක් පනවා ඒ පුටුදෙක හා එක්කොට පුවක්කරටියක් බැඳ එහිද පොල්මලක් හා පුවක් මලක් බැඳ රළිමාලා තබා සුදුරෙදි කඩක් ඔතා ඊට රජගහයයි නමක් කොට මන්ඩපයෙන් පිටද නානාවිධ හස්ති අශ්ව ගවමහිෂ සිංහ ව්‍යාඝ්‍රසුනඛ ශෘගාල බිලාර මූෂිකාදි රූකඩවලින් හා මොනර ගිරා කොබෝ ආදී නානාවිධ පක්ෂි රූකඩවලින්ද හා පොළොන් පිඹුරු ආදි සර්පජාතීන්ගේ රූකඩවලින්ද ස්ත්‍රීපුරුෂ රූපාදියෙන් විසිතුරුවූ චිත්‍රාදියෙන්ද මනාකොට සරසා එම පිරිත් නාඩගම කරවීම පිණිස නා නා ගී තාලයෙන් ඒ ඒ සූත්‍රාදිය ගායනා කිරීමෙහි දක්ෂවූ ශ්‍රමණ ගීකාරයන් හා බෙරකාරයන් තාලකාරයන් ගිනිකෙළි කාරයන් ලීකෙළිකාරයන් කලගෙඩිකාරයන් ගීකාරයන් විරුදුකාරයන් මහඩිකාරයන් සර්කස් කාරයන් බොරුකකුල් කාරයන් දෙවෙල් නැට්ටුවන් සත්ත් නැට්ටුවන් යන මේ ආදී නොයෙක් විසුළු විකාරකාරයන්ට ගෙන්වාගන්නාහුය. නැවද එම සථානයට ඒ ඒ දිසාවලින් පැමිණ කිරිවෙලෙන්දෝ පැනිවෙලෙන්දෝ පූවෙලෙන්දෝ බත්වෙලෙන්දෝ පාන්වෙලෙන්දෝ තෙල්වෙලෙන්දෝ මල්වෙලෙන්දෝ සුවඳ වෙලෙන්දෝ පොත්වෙලෙන්දෝ රෙදිවෙලෙන්දෝ සුරුට්ටු වෙලෙන්දෝ බුලත් වෙලෙන්දෝ යන මේ ආදි වෙලෙන්දෝ වෙන වෙනම සල්පිල් සරසාගණිති, එම පිරිත් නාඩගමෙ භික්ෂූහුද මව් සිළුවු පටසිවුරු ආදිය දරා පටලේන්සු සහිත විසිතුරු විජිනි පත් අතටගෙණ හේවිසි බෙර තාලකාරයන් විසින් කරණලද තූර්‍ය

නාදය පවත්නා කල්හි යවකි මණ්ඩපයතුලට පැමිණ දෙවාල පත්‍ර
ලිව්මාදියට සමඤවූ ඒ ඒ අය තෝරා ලියා තබා දෙවොල්බෙර නේවි
සි ආදිය ගස්වා පිරිත පේකොට නා නාගි තාලයෙන් පිරිත් ගායනා
වට පටන් ගණිති, එතැන් පටන් සේවාව කරන්නෝ පිරිත් පුරන්
නෝ අත අල්ලන්නෝ සුනය කියන්නෝ දෙවොල්පත් ලියන්නෝ
අසුන් කියන්නෝ සූත්‍ර කියන්නෝ පෙළහැරයන්නෝ පැටුම්බලන්
නෝ භුමාරකරන්නෝ තමතමන්ගේ ඒ ඒ කෘත්‍යයන් කරමින් සතිය
ඉක්මවති, එය පටන්ගත් දිනපටින් සෙසු නෘත්‍ය විකාරකාරයන්
අතුරෙන් බෙරද ගසන්නෝ තලාපිඹින්නෝ සින්දු කියන්නෝ විරිදු
කියන්නෝ දෙවොල් නටන්නෝ යතුන්නටන්නෝ මගඩිපනින්
නෝ පිනුම්පනින්නෝ සර්කස්යන්නෝ වැදිවෙස්ගන්නෝ දිවිවෙස්
ගන්නෝ යක්වෙස් ගන්නෝ උඩට පනින්නෝ බිම්පෙරලෙන්නෝ
වටකැරකෙන්නෝ කොඩි ඔසවන්නෝ පෙළහැරයන්නෝ සාධු කි
යන්නෝ සොහොන්යක්කුවැනි බොරුකකුල්නැට්වුවෝ ගැනු ඇඳුම්
ඇඳි කලගෙඩිනැට්වුවෝ දෙමල ඇඳුම් ඇඳී ලිකෙළි නැට්වූවෝ මහ්
වා වෙස්ගත් සමහර තැට්වූවෝ යන මේආදි විසුලු විකාරකාරයෝ ඒ
සතිය ඉක්ම යහතුරු ඒ ඒ තැන්වල රඟ මඩුලු සරසාගෙණ තම
තමන්ගේ විසුලු විකාර දක්වති, මොවුන් අතුරෙන් ගිනිනැට්වූවන්ට
එහි දායක කාරකයෝ සුරාබත් මස් ආදියෙන් සංග්‍රහකරති ශ්‍රමණ
ගායනාකාරයින්ට දිම පිණිස ඒ ඒ ගම්වලට දන්වා බත්මස් කැවිලි
ආදි නා නාවිධ කෑම කන්බැඳ ගෙන්වා විසිතුරුපිහත් තැටිවල ඔබ
ඔබා බෙදූ කෑමදෙන විසුතුරු ශාලාවෙහි හිඳුවා ඒ ශ්‍රමණ ගායනා
කාරයින්ට පිහන්තැටිවල කෑම දෙති ඔවුහුද ඒ සියල්ල කෑබී නො
යෙක් විසුලු විකාරකෙළි සිනාවෙන් දවස ඉක්මවන්නාහු නානාවිධා
ලංකාරයෙන් සැරසුනාවූ තරුණ තරුණියන්ගෙන් පිරීගිය විශාල
ශාලාවට පැමිණ තරුණතරුණියන් දෙස බලබලා නානාවිධ මධුර
ගීතනාදයෙන් පිරුවාණා පොත තබා ගායනාකරති මෙබඳු නාඩ
ගම බැලීමට පැමිණී ශබ්ද ගරුක සත්පුරුෂ තරුණ තරුණියෝ,
ඒ ගායනාකාර මහණුන්ගේ මධුරගීත නාදය අසා අසා සිත් පොලඹ
වා ගණිති, රූප ගරුක තරුණ තරුණියෝ පිරිත් මඩුවෙහි ඇත්තා
වූ අලංකාර රූපාදිය බලමින් සිත් පොලඹවාගෙණ නෘත්‍යකාරයින්
ගේ නෘත්‍යමණ්ඩලයකරා එලඹ එක්පසකින් සිටගනිති එහි පිරිත්
ගායනාකාර ශ්‍රමණයෝද නෘත්‍ය බැලීම පිණිස එක්පසකින් සිටගණි
ති දායක කාරක උපස්ථායකයෝ එක්පසකින් සිටගණිති එකල්හි ඒ
නෘත්‍ය විකාරකාරයෝ නානාවිධ නෘත්‍ය විකාර දක්වන්ට පටන්
ගත් නාහුය රස ගරුක සත්පුරුෂාදීහු වට සල්පිල්කරා එලඹ අනෙ

සාවිධ රසමසවුළු කමින් නොයෙක් බිම්ජාති බොමින් නාත්තිසකට මනාපැමිනම සියනිවෙස් කර යති ගන්ධනරුකයෝ සුවඳ සබන් කපුරු සුවඳ පැන් ආදිය රැගෙණ ඉවනරකාර යනි සට්ගී ගරුක ගිගි පැවිද්දෙදු ප්‍රියමනාප නානා ස්ළුගීයන් ස්ළුගීකරගණිනි, මෙසේ මේ බඳු විසුලු විකාර පඤ්චකාම බඩිනාදියෙන් ගැවසීගත් පිරිත් නාඩගමෙ. නොහොත් දෙවොල් නාඩගමෙ නේවාසාර භික්ෂුව එක් කපුවෙක්වේ දේවාලපන ලියන්නා එක් කපුවෙක්වේ පිරිත් පුරන්නෝද අග අල්ලන්නෝද ගීතස්වරයෙන් සූනය කියන්නෝද අතුරක් පාසා අදිමින් මනාවූ ගීතනාදයෙන් සූත්‍ර කියන්නෝ සින්දුකාරයෝමෙනි. ඇහැලපල නාඩගමෙ ඇහැලපලේ නිලමෙට අන්දවන්නාක්මෙන් ගම්දරුවෙක් අල්වා ඔහුට නුපුරුදු විසුලුවිකාර ඇඳුමක් අන්දවා ගි හැල්ලක් කියවන දූතයා මේ පිරිත් නාඩගමෙ එක් නැට්ටුවෙක්වේ දෙවාලපන ගෙණියාස් විෂ්ණුරූපා දිය ලඟ යානිකාකරණ භික්ෂුව මෙහි එක් කපුවෙක්වේ රජගෙ බඳගෙණ පටසිවුරු විජිනිපත් දරා විහාර අස්නාය අනුශාසනාවය යන ගි හැලි උණගණ ගීතනාදයෙන් යානිකා කරන්නාවූ භික්ෂුව මෙහි එක් කපුවෙක්වේ, ඔවුහොවුන් ජයග්‍රහණය පිණිස කරන්නාවූ කොලාහලයක් මෙන් සතර සතරදෙනා බැගින් වාඩිවී සාරම්භ යෙන් මැඩ පැවතිනිය සින්ඇනිව හමාර කියන භික්ෂූහු මේ නාඩ ගමෙ කළහකාරයෝ වෙති, අහෝ මෙබඳු විසුලු විකාර නාඩගම්පලට කවරනම් නුවනැත්තෙක් පින්කම්පලැයයි කියාද—ඒකාන්තයෙන් මේ නාඩගම් එම පක්ෂගත දෙවියන් සහිත ලෝකයා සතර අපාගත කරවන්නාවූ ආගම විරොධ පවුකම්පලක් බව කවරෙකුට්නම් නො වැටහේද මෙමෙන්ද මේ පිරිත්නාඩගම නෛයානික ශාසනය අතුරු දන්විම පිණිස පවත්නාවූ ආගම විරොධ කර්මයක්බව දතයුත්තේය. තවද මේපිරිත් නාඩගමෙ සතියක් පිරිත් කියත්යයි කියති, සතියක් මුළුල්ලෙහි පිරිත් කිරීම ආගම්ධර්මයෙහි නියමව ඇත්තේ ආටානාටිය සූත්‍රය කියයුතුවූ තදබල අමනුෂ්‍යොපද්‍රවයක් ඇතිතැන ආටානාටියට පරිකර්මවශයෙනි එබඳු පහකරගත නොහැකි අමනුෂ්‍ය උපද්‍රවයක් නැතිතැන ලාභසත්කාර සඳහා පිරිත්කරණහෙයින්ද මේ සති පිරිත ආගමවිරොධකර්මයක්වේ—තවද අවසානයෙහි කියන්නාවූ ආටානාටියට පරිකර්මවශයෙන් සතිය මුළුල්ලෙහි පිරිත් කිරීමට මහාකාශ්‍යපාදි පන්සියයක් මහරහතුන් විසින් තබනලද නියමයනම් මෙත්තා සූත්‍රය ධජග්ගසූත්‍රය රතනසූත්‍රය, යන තුන් සූත්‍රය පමණක් නිරන්තරයෙන් කියයුතු බවටයි, මෙකල සතිපිරිත්වලදී මහපිරිතයයි කියන පිරිතට මඞ්ගලරතන මෙත්ත යන තුන් සූත්‍රය මෙන් පිළිවෙලටද සෙසු වෙලාවලදී පරාභව පොත බලා සරණාගමන සූත්‍රය පටන් ඉසිගිලි සූත්‍රය කොළවරවනතෙක් යුනවිලටද, සූත්‍රකියනවායයි කියා

ධම්මචක්කාදි සූත්‍රද කියන්නානුය—මෙසේ පිරිත් කීම පන්සියයක්
රහතුන්ගේ නියමයට විරුද්ධ හෙයින් ආගම විරොධයි—තවද මෙකා
ල සමහරු මහපිරිතට කියන්නාවූ මඞ්ගල සූත්‍රයද පිරිතට කීම පිණි
ස නියමකල සූත්‍රයක් නොවේමය එය කීමට නියමය ඇත්තේ සති
යක් මුළුල්ලෙහි යටකී මෙත්තාදි තුන්සූත්‍රය කියා අවසානකලකල්
හිත් අමනුෂ්‍යයා පහව නොගියේනම් අටවෙනි දින මෙවනසුමුළුවට
රුස්වී ආටානාටිය කීමට පළමුකොට ඒ උපද්‍රව කාරණ යක්ෂයාට පඬු
රු පිණිසමේ එහෙයින් තුන් සූත්‍රයට ධජග්ගසූත්‍රය හැරදමා මඞ්ගල
සූත්‍රයගෙණ කීමද ආගම විරොධයි—තවද ඔය පිරිත් නාඩගමේ
දෙවදූතනම් තැව්වූවාලවා කියවන දොරකඩ අස්නය හා පුවක්කර
විය බඳුගෙණ කියන්නාවූ විහාරඅස්නය හා අනුශාසනාවත් අටුවා
ටීකා සහිත පිටකත්‍රධර්මයෙහි කොහැනකවත් නැත්තාවූ ඔය නාඩ
ගම්කාරයන් විසින් නොනාගත්තාවූ ගී හැලිනම් වෙති—ඒ සියල්ල
ගැණ බුදුන් විසින් ඔහණෙනි තෙපි ගමක් පාසා පිරිත් පින්කම්කර
මින් හැසිරියවූ එතැන්හිදි ගම් දරුවෙක් අල්වා ඔහුට දේවදූතයා
යයි නම් තබා මේ දොරකඩඅස්නය නම්වූ ගී හැල්ල පුහුණුකරවා
ආටානාටිය කීමට පළමුකොට මණ්ඩපයෙහි දොරටුව මැද සිටුවා ඔහු
ලවා එය ගීත ස්වරයෙන් කියවවූ—තවද පුවක් කරටියක් කපා
එහි පුවක්මලක් හා පොල්මලකුත් බැඳ රැලිවාලා තබා සුදු රෙදිකඩ
කුත් ඔතා ඊට රජනගයයි නමකුත් පටබැඳ මණ්ඩපයෙහි සිටුවා ඒ
රජනග බඳුගෙණ මට සිළුටු පටිසිවුරක් දරා පටලෙල්පුසුවක් සහිත
දළම්ය විසිතුරු විජිනි පතක් ගෙණ මේ විහාර අස්නය හා අනුශාස
නාව ගීත ස්වරයෙන් කියවූ කියා පනවතලද ප්‍රඥප්තියක් පිටකත්‍ර
ධර්මයෙහිම නොමැති බැවින්—අපඤ්ඤත්තං පඤ්ඤපෙන්ති පඤ්ඤත්තං
සමුච්ඡින්දිස්සන්ති—යන බුද්ධවචනයෙන් සර්වප්‍රකාරයෙන් ආගම විරො
ධ භූතවිකාරයක්බව දතයුතුයි, තවද මේ පිරිත් නාඩගමේ අනුශාස
නා හැල්ල ඉවරවූ තැනපටන් සතරදෙනා බැගින් වාඩිවී දෙදෙ
නෙක් එක පාඨයක්ද අනික් දෙදෙනා අනික් පාඨයද බැගින් අපි
කියවනෙන් මේ දෙදෙනාව මැඩ පවත්වා මිනාහාලයෙන් හා ප්‍රියවූ
මහා ශබ්දයෙන් ජයගණිමුයයි යන උරම්භාශයෙලශබිතනාය පෙරදුරි
කොට සමහරපද තුර්තවද සමහරපද දිඝීකොටද ආටානාටිය කියති
එසේ ආටානාටිය කීමගැණ—මහණෙනි තෙපි සතර සතර දෙනා
බැගින් වාඩිවී එකිනෙකා මම ජයගණිමි මම ජයගණිමි යන උපා
රම්භචිත්තයෙන් පෙරටුකොට හසුරුවා මෙසේ ආටානාටිය කියවූ කියා
නියමකරණලද බුද්ධ නියමයක් පිටකත්‍රධර්මයෙහිම නැත්තේය. එහෙ
යින් සතරදෙනාබැගින් වාඩිවී උපාරම්භචිත්තයෙන් පෙරටුකොටහසුරුවා
යටකීලෙස් ආටානාටිය කීමශාසනහානිය පිණිසපවා ආගම විරොධ

අපරාධයක්වේ—ආචානාපිය හිමද පන්සියයක් පිරිවරගතුන් සැළ නියම්යනම් එක භික්ෂුවවවේ, එබව යට දක්වූ ආචානාපියට පරිකම් කී පාඨයෙහි, තංහණ්ණෙනත සහිකබුනා පිදෙංචා මංසංවානබාදිතබ්බං යන්නෙහි, භික්ඛුනා, යන ඒක වචනයෙන්ද. තත්පරිපුඩං ආසනං පඤ්ඤපෙත්වා නිසීදිතබ්බං, යන්නෙහි, ආසනං යන ඒකවචනයෙන්ද පරිනායකො භික්ඛු විචාරණො ඛරංනෙනතා කී,—යනාද් පාඨයෙහි, පරිනායකාරකො භික්ඛු, යන වචනයෙන්ද, මාරවාත පානාදීනි පිද හිත්වා නිසීනෙනන, යනාදි පාඨයෙහි නිසීනෙනන, යන එක වචනයෙන්ද, ප්‍රකාශවේ,—සතරනමක් වාඩිවී කියයුතුනම් යට කී පාඨයන්හි, තංහණ්ණෙනතායි චතූහිභික්ඛුහි කියාද, චත්තාරි ආසනානි පඤ්ඤපෙත්වා, කියාද, පරිනායකාරකා චත්තාරො භික්ඛු, කියාද, මාරවාන පානාදීනි පිද හිත්වා නිසීනෙනන, කියාද කියයුතුවේ—එසෙයින් පදව්‍යඤ්ජනාදිය නොපිරිහෙලා සජ්ඣායනාදිය කිරීමේත් මනාසේ පුහුණුකරනප් එකභික්ෂුවක් විසින ලාභසත්කාරාදිය ගරුනොකොට නිස්සරණාධ්‍යාශයෙන් කියයුතු ආචානාපිය එසේ පුහුණුකර නොගත් භික්ෂූන් සතරදෙනෙකු විසින් ලාභ සත්කාරාදිය සඳහා පොත බලාගෙණ කියනනෙහයින්ද, මෙත්තචිත්තං පුරෙචාරිකංකත්වා චත්තබ්බං—යනුකී නයින් මෛත්‍රීචිත්තය පෙරටුකොට හසුරුවා කියයුතු තැන මම අනිත් අයට වඩා මහාශබ්දයෙන් කියමි යන උපාරම්භචිත්තය පෙරටුකොට හසුරුවා කියන හෙයින්ද මේකල ආචානාපිය කියන පිළිවෙළ භාත්පසින් ආගමවිරොධ අප්‍රසාදික පිළිවෙළක්බව දතයුතුයි. තවද ආචානාපිය කියන භික්ෂූව විසින්, පිටසංවා මංසංවානබාදිතබ්බං—යන්නෙන් පිටිමත්ස්‍යමාංස කැවුම්කැවිලි ආදිය නොකැයුතුයයි. තහනම්කරණලද හෙයින් මෙකල ඔය පිරිත් නාඩනවේ භික්ෂූනු දායක උපාසකයින්ට දියමස් ගොඩමස් කැවුම් කැවිලිආදිය නොගෙණෙනසේ තහනම් කරන්නාහුද ඒ ආචානාපිය කියන භික්ෂූහු දියමස් ගොඩමස් කැවුම් කැවිලි නොකන්නාහුද්‍යි වීමසා බැලියයුතුයි, තව්ද ගරුවූ විනයකර්මයක් කරන්නාවූ සීමාවතුලට වදින්ට නොදෙන්නාක් පරිද්දෙන් අනුපසම්පන්නයන් අතුරෙන් සාමණේරයෙකුටපවා මෙකල පිරිත් මණ්ඩපයතුලට වදින්ට නොදී තහනම්කරති, මෙසේ කිරීමද මේ පිරිත් කිරීමනම් ගරු විනයකර්මයක්මෙන් භික්ෂූන්ටම අනුදූන වදළ ගරුකර්මයක්යයි හඟවා අඥබාල ජනයාව රවටා ලාභසත්කාරාදිය උපදවාගැණීම පිණිස කරන්නාවූ බොරු ප්‍රයොගයක්වේ—මේ කාරණයද මේ සංක්ෂෙපයෙන්ද දක්වන දීඝායු වස්තුවෙන් දතයුතුයි. එක්සමයෙක්හි බුදුරජතෙම දීඝලම්බික නම් නුවර නිසා ආරණ්‍ය කුටියෙක්හි වැඩ වසනසේක—ඒකල්හි දීඝායු කුමාරයා අරබයා අභිවාදන සීලිස්ස

සහාදි ධර්මදේශනාව වදාළසේක — ඓශ්‍රනේද්‍රයන්, දීඝලම්බිකනම්
නුවරවාසී බ්‍රාහ්මණයෝ දෙදෙනෙක් තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අට
සාළිස් වසක් තපස්කළාහුය ඔවුන් අතුරෙන් එක්තාපසයෙක් මාගේ
ප්‍රවෙණිය නස්නේය එහෙයින් සිවුරු හරිමියි සිතා තමා විසින්
කරණලද්ද අනුන්ට විකිණ ගවයන් සියයක්ද කහවණු සියයක්ද
හා සමග භාර්‍යාවක් ලබා කුටුම්බසංස්ථාපනය කළේය නැවත ඔහු
ගේ භාර්‍යාව දරුවෙකු වැදිය අනික් සහඑතාපස තෙම වනාහි පිටදෙ
ශයක විසිවා ගොස් නැවත එම නුවරටම පෙරලා ආයේය- ඒ බ්‍රාහ්ම
ණයාද ඒ තාපසයාගේ ආබව අසා අඹුදරුවන් ගෙණ දකිම පිණිස
ගියේය. තාපසයා කරා ගොස් පුත්‍රයා වඩුඅනටදී තෙමේ පළමුකොට
වැඳ මවුද පුත්‍රයා පියා අතටදී වැන්දීය, ඒ තාපසයා ඔවුන්ට දීඝායුෂ
ඇත්තෝ වෙව්‍යයි කියේය පුත්‍රයාලවා වැන්දෙවූකල්හි කිසිවක්
නොකීයේය-ඉක්බිති තාපසයා අතින් ස්වාමීනි අප විසින් වඳින ලද්
දේ දීඝායුෂ ඇත්තෝ වේවායි කියා මොහු වඳිනකල්හි කුමක්හෙයින්
කිසිවක් නොකීවුදැයි විචාළේය බ්‍රාහ්මණය මෝහට එක් අනතුරෙක්
ඇතැයි කීයේය. ස්වාමිනි කෙතෙක්කල් ජීවත් වන්නේ දැයි විචාළේය
බ්‍රාහ්මණය සත්දවසෙකැයි කීයේය, ස්වාමීනි ප්‍රතිබාහන කාරණයක්
ඇත්තේ දැයි විචාළේය, ප්‍රතිබාහන කාරණයක් මම නොදනිමියි කි
යේය. ස්වාමීනි කවරෙක් දන්නේ දැයි විචාළේය. ශ්‍රමණගෞ
තමයන්වහන්සේ දන්නේය උන්වහන්සේගේ සමීපයට ගොස් විචා
රවයි කීයේය. ස්වාමීනි එසේ යන්නේ තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව
සිටත් නැවත ගිහිවූ මම ඒ තපසින් පිරිහුනු බැවින් බුදුන් සමීප
යට යාමට භය ඇත්තෙමියි කීයේය — බ්‍රාහ්මණය ඉදින් තට පුත්‍රස්නෙ
හයක් ඇත්තේනම් ඒ පිරිහිම නොසිතා බුදුන්සමීපයට ගොස් විචාර
වයි කීයේය ඔහු බුදුන්සමීපයට ගොස් තෙමේ පළමුකොට වැන්දේය
ශාස්තෘන්වහන්සේ ඔහුට දීර්ඝායුෂ ඇත්තෙක් වෙහිවායයි වදාළේ
ය භාර්‍යාව විසින් වඳින කාලයෙහි ඇටද එසේම වදාළ පුත්‍රයාලවා
වන්දවන කාලයෙහි කිසිවක් නොවදාළේය, ඔහු පළමුතසින්ම බුදුන්
අතින් විචාළේය. ශාස්තෘන්වහන්සේ එපරිද්දෙන්ම විසඳූසේක, ඒ
බ්‍රාහ්මණයා සර්වඥතාඥානය ප්‍රතිවෙධ නොකොටම තමාගේ වෙද
මන්ත්‍රය සර්වඥතාඥානය හා සංසන්දනය කොට බලා ප්‍රතිබාහන
උපායක් නොදැන ස්වාමීනි ප්‍රතිබාහන උපායෙක් වන්නේදැයි විචාළේ
ය. එකල්හි ශාස්තෘන්වහන්සේ වන්නේයයි වදාරා ඉදින් බ්‍රාහ්මණ
ය තෝ තමාගේ ගෘහ වාරයෙහි මණ්ඩපයක්කරවා ඒ මණ්ඩපයාගේ
මධ්‍යයෙහි ( ලදරුවා තැබීම පිණිස ) පුටුවක්කරවා එයවටකරමින්
අටක්හෝ දහසයක් හෝ ආසනයන් පනවා ඒ ආසනයන්හි මාගේ
ශ්‍රාවකයන් හිඳුවා සතියක් මුළුල්ලෙහි නිරන්තරයෙන් පිරිත්කරන්ට

හැකිවන්නේනම් මෙසේ ඔහුගේඅන්තරාව නැසෙන්නේයයිවදාළේය. ඒ බ්‍රාහ්මණයා එසේ මණ්ඩපාදියකොට බුදුන් සමීපයට ගොස් භික්ෂූන් ලබාගෙණ ආයේය—භික්ෂූහු ඒ ආසනයන්හි හිඳගත්තාහුය ලදරුවාද මණ්ඩපය මැද ආසනයෙහි හින්දෙවූවාහුය. භික්ෂූහු ඒ ලදරුවා වටකොට හිඳ සත්රෑ දවාලක් නිතරම පිරිත් කීවාහුය; සත්වෙනි දවසෙහි සවස්කාලයෙහි ශාස්තෲන්වහන්සේද වැඩිසේක, බුදුන් වැඩිකල්හි සියලු සක්වලයන්හි මහේශාක්‍ය දෙවතාවෝද රැස්වූවාහුය, ඒකාලයෙහි එක් අවරුද්ධක නම් යක්ෂයෙක් දොළොස් වර්ෂයක් මුළුල්ලෙහි වෙසමුනි රජුට උපස්ථානකොට ඒරජුගේ සමීපයෙන් වැටුප් ලබන්නේ මෙයින් සත්වෙනි දවසෙහි මේ දරුවාගන්නෙහියයි ලැබුයේය. එහෙයින් ඒයක්ෂයාඅවුත් එහිසිටියේය. බුදුන්වැඩියකල්හි මහේශාක්‍යදෙවතාවන්ද රැස්වූ කල්හි අල්පේශාක්‍ය දෙවතාවෝ අවකාශදෙමින් දොළොස් යොදුනක් පසුබැස ගියාහුය අවරුද්ධකනම් යක්ෂයාද එසේම පසුබැස ගියේය. ශාස්තෲන්වහන්සේද සම්රාත්‍රිය මුළුල්ලෙහි පිරිත්කළේය. සත්දවස ඉක්මගියකල්හි අවරුද්ධකනම් යක්ෂයාද දරුවා නොලැබුයේය. අටවෙනි අරුණය නැගී මාත්‍රයෙහි කුමරුවාගෙණ වුත් බුදුන්ට වැන්දෙවූවාහුය—බුදුරජද දීර්ඝායුෂ ඇත්තේ වේවායයි වදාළේය, බ්‍රාහ්මණයා පින්වත් ගෞතමයන් වහන්ස කුමරුවා කොතෙක් කල්සිටින්නේදැයි විචාළේය. බ්‍රාහ්මණය එක්සිය විසිවර්ෂයකැයි වදාළේය. ඉක්බිති ඔහට ආයුවර්ධන කුමාරයායයි නමක් කළාහුය හෙතෙම වැඩිවයසට පැමිණ පන්සියයක් උපාසකවරු විසින් පිරිවරණ ලද්දේව හැසුරුණේය. නැවත එක්දවසක් ඒ ආයුවර්ධන කුමාරයා අරබයා මේ සත්වයින්ගේ ආයුවැඩෙන කාරණයක් ඇත්තේ දැයි ධර්මසභාවෙහි උපන් කථාවක් අසා ශාස්තෲන් වහන්සේ 'අභිවාදනසීලිස්ස' යනාදී ගාථාව වදාළසේක. ඒ දේශනාවසානයෙහි පන්සියයක් උපාසකවරු හා සමග ආයුවර්ධන කුමාරයා සෝවාන් ඵලයෙහි පිහිටියේය. මෙසේ මේ දීඝායු කුමාරවස්තුවෙන් පෙර රහතන්වහන්සේලා පවා ගිහිලදරුවෝ මණ්ඩපය මැද හිඳුවාගෙණ පිරිත් කී බව ප්‍රකාශවේ එසේ පෙර සතියක් මුළුල්ලෙහි ගිහිලදරුවෙක් මණ්ඩපයමැද පුටුවක හිඳුවාගෙණ රහතන් වහන්සේලා නිරන්තරයෙන් පිරිත් කීවාහුනම් මෙකල කරන්නාවූ ආගම විරුද්ධ පිරිත් නාඩගමේ මණ්ඩපය තුළට කවරෙක් පැමිණියත් කුමනා වර දක්වේද, තවද මෙකල පිරිත් නාඩගමේ භික්ෂූනු පුන පිරිත් සූත්‍ර අනුශාසනාදිය අකුරක් පාශා වචනයක් පාශා අදිමින් මහා ගී තාලයෙන් ගායනාකරති මේද ආගම විරුද්ධ අප්‍රාසාදික අපරාධයක්වේ. ධර්මයෙහි සූත්‍රානය වෘත්තාය ජාතකට්ඨකථාය ගාථා වෘත්තාය කියාවාන්සෙයේ ඇත්තාහුය එයවිනාසකොට ඉතා දීර්ඝතාවත්ව නොවටිනේය.

චතුරස්‍රාභිනයෙන් පරිමණ්ඩල පදව්‍යඤ්ජනයෝ දක්වියයුත්තාහුය
අනුජානාමි භික්ඛවෙ සරභඤ්ඤං, යන වචනයෙන් ස්වරයෙන්පමණක්
ධර්ම්‍ය කියන්ට වටනේය. ස්වරයෙන් කියයුතුකල්හි, තරඞ්ගාත්‍යනතාය
අද්ධභාවාත්‍යනතාය ගණකාව්‍යනතාය යන මේආදී ව්‍යනතායෝ පිස්දෙකක්
ඇත්තාහුය ඔවුන් අතුරෙන් යමක් කැමතිනම් එය කරන්ට ලැබේ
සියලු පදව්‍යඤ්ජනයන් නොනසා විකාරනොකොට ශ්‍රමණ සාරූප්‍ය
යෙන් චතුරස්‍රනයින් පැවැත්වීමම ලක්ෂණයවේ. පාලියෙහිද හ්‍රස්වය
දීර්ඝයයි කියා අක්ෂරයෝ දෙකොටසක්වෙති, ඒ හ්‍රස්වදීර්ඝයන් අතු
රෙන් හ්‍රස්වාක්ෂරය එකවරක් ඇසිපිය හෙලන මාත්‍රයක්ද දීර්ඝාක්ෂරය
දෙවරක් ඇසිපියහෙලන මාත්‍රයක්දවනසේ නක්සබිද කළයුත්තේය. ඊට
වඩා දිඝව ඇදීම නොවටනේය ඊටවඩා දීර්ඝව බණපිරිත් ආදිය
කියන්නහුගේ ස්වරය ආයතකවූ ගීත ස්වරයනම්වේ. එහෙයින් මේ
කාල පිරිත් භාඩගම්කාරයන්ගේ යුගපිරිත් ආදී කියමන් හා සෙසු
අලජ්ජී මහණුන්ගේ රාත්‍රීබණ කිමාදියෙහි පන්සිල්දීමෙහි පටන්
ඇත්තාවූ කියමන්ද ආයතකවූ ගීතස්වරයෙන් පවත්වනබව සැල
කියයුත්තේය. පෙරබුදුආදී මහොත්තමයන්ගේ චම්බදු සිරිතක්නො
තිබුනේය—බුදුවරයන්ගේ භත්තානුමෝදනාකාලයෙහි මදක් වඩා
කරන්නාවූ අනුමෝදනා දෙශනාව පොතකට ලියා තගන්නේනම්
දික්සඟිය මැදුම්සඟිය ප්‍රමාණවන්නිය—පසුබතසම්ප්‍රාප්ත පිරිසට
කරන්නාවූ ධර්මදෙශනාව සංයුත්සඟිය අඞ්ගුත්තර සඟිය ප්‍රමාණවන්
නිය—අනදමහ තෙරුන්වහන්සේ වනාහි ගමන්කරණ කල්හි එක්
පාදයක් බිමතබා අනික්පාදය නගා පෙරටුවෙන් තැබීමට පළමුකොට
ඒ එක් පාදයෙන් සිටිනා ඇසිල්ලෙහි ගාථා පසළොස්දහසක් පද
සැමදගයක් උගෙණගැණීම හෝ කියවීමහෝ දෙශනා කිරීමහෝ
කරන්නේය—මේ කාරණයෙන්ද පෙර බුද්ධාදී මහොත්තමයෝ මෙක
ළ අලජ්ජී භික්ෂුහුමෙන් ආයතකවූ ගීතස්වරයෙන් සූත්‍රදෙශනාදිය
නොකළාහුයයි දතයුතුයි—තවද මෙකළ අලජ්ජීභික්ෂූහුමෙන් බුදුන්
ජීවමානකාලයෙහිවූ ඡබ්බග්ගිය භික්ෂූහුද ආයතකවූ ගීත ස්වරයෙන්
ධර්ම්‍ය ගායනා කිරීමට පටන්ගත්තාහුය, එකල්හි මනුෂ්‍යයෝ අපි යම්
සේ ගායනාකරමුනම් එසේම මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝද ආයතකවූ
ගීත ස්වරයෙන් ගායනාකරන්නාහුය මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ අලජ්
ජීහුයයි කියා ග්‍රාමකවශයෙන් සිතුවාහුය මොවුන්ට ශ්‍රමණභාවයක්
නම් නැත්තේයයි අගුණ ප්‍රකාශකළාහුය ඒ ඒ තන්හි අගුණ පතුරු
වා හැරියාහුය එකල්හි සෙසු භික්ෂූහුද එසේ ලාමකවශයෙන් සිතන්
නාවූ අගුණ කියන්නාවූ අගුණ පතුරුවන්නාවූ ඒ මිනිසුන්ගේ වචන
ය ඇසුවාහුය. එහි යම් අල්පෙච්ඡලජ්ජී භික්ෂූහු සිටියාහුද එ

භික්ෂූහුද කෙසේනම් මේ ඡබ්බග්ගිය භික්ෂූහු ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය ගායනා කරන්නාහුද මෙසේ කරන්නාවූ මේ ඡබ්බග්ගිය භික්ෂූහු අලජ්ජීහුයයි ලාමක වශයෙන් සිතුවාහුය. අගුණ ප්‍රකාශ කළාහුය අගුණ පතුරුවා හැරියාහුය, ඉක්බිති ඒ භික්ෂූහු බුදුන්ටද ඒබව ශලකළාහුය, එකල්හි බුදුරජානන් වහන්සේ මේ නිදානයෙහි භික්ෂු සංඝයා රැස්කරවා ඒ ඡබ්බග්ගිය භික්ෂූන් අහින් මහණෙනි තෙපි ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය ගායනා කරන්නාහුය යන වචනය සැබෑදැයි විචාළේය. සැබෑයයි කීකල්හි බුදුරජානන්වහන්සේ අනනුච්ඡවිකං මොඝ පුරිසා අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං යනාදි නයින් තුච්ඡපුරුෂයෙනි තොප විසින් තුච්ඡ මනුෂ්‍ය කර්මයක් කරණලද්දේය, ඒ ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය ගායනා කිරීම ශ්‍රමණකරණ ධර්මයන්ට හෝ මාර්ගඵල නිර්වාණ ශාසනයන්ට හෝ නුසුදුසුවූ කර්මයක්මවේ, එහෙයින් ශ්‍රමණකරණ ධර්මයන් කෙරෙන් දුරුවූ කර්මයක් කරණලද්දේය. ඒ ශ්‍රමණකරණ ධර්මාදියට නුසුදුසු බැවින් අනුලොම් නොවන කර්මයක්ම කරණලද්දේය. ශ්‍රමණකරණ ධර්මාදියට අනුලොම්නොවන හෙයින්ම අප්‍රතිරූපවූ කර්මයක් කරණලද්දේය, අප්‍රතිරූප බැවින්ද ශ්‍රමණයන්ගේ කර්මයක් නොවේමය, එහෙයින් අශ්‍රමණ කර්මයක්ම කරණලද්දේය, අශ්‍රමණ කර්මයක් බැවින් ශ්‍රමණයන්ට කැපනොවන කර්මයක්ම කරණලද්දේය. ශ්‍රමණයන්ට කැපනැති බැවින් නොකැපයුත්තක්ම කරණලද්දේය, තුච්ඡ පුරුෂයනි තෙපි කෙසේනම් ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය කීවාහුද, හිස්පුරුෂයෙනි මේ ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය කීමය යන කාරණය ශාසනය කෙරෙහි අප්‍රසන්න මනුෂ්‍යයන්ගේ පැහැදීම පිණිසද, ප්‍රසන්න මනුෂ්‍යයන්ගේ බොහෝවීම පිණිසද නොවන්නේය. වැලිදු හිස්පුරුෂයනි මේ ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය කීමය යන කාරණය, අප්‍රසන්න මනුෂ්‍යයන්ගේද අප්‍රසාදය පිණිසම වන්නේය. සමහර ප්‍රසන්න මනුෂ්‍යයන්ගේද ප්‍රසාදයාගේ අන්‍යථාභාවය හෙවත් විපිළිසරවීම පිණිසම වන්නේයයි මෙසේ භාග්‍යවතුන්වහන්සේ ඒ ඡබ්බග්ගිය භික්ෂූන්ට අනේකප්‍රකාරයෙන් ගහහිකොට දුර්භරතාවගේ දුෂ්පොෂතාවගේම හිච්ඡතාවගේ අසන්තුෂ්ටිභාවයාගේ සඞ්ගණිකාරාමයාගේ කුසීතභාවයාගේ අගුණ ප්‍රකාශකොට අනේකප්‍රකාරයෙන් සුභරතාදියගේ ගුණ ප්‍රකාශකොට භික්ෂූන්ට තදනුච්ඡවිකවූ තදනුලොමිකවූ ධර්මකථාවක්කොට භික්ෂූන් කැඳවා,—පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායන්තස්ස අත්තනාපි තස්මිංසරෙ සාරජ්ජති පරෙපි තස්මිං සරෙ සාරජ්ජන්ති ගහපතිකාපි උජ්ඣායන්ති සරකුත්තිම්පි නිකාමයමානස්ස සමාධිස්ස භඞ්ගො හොති පච්ඡිමාජනතා

දීඝානුගතිං ආපජ්ජති ඉමේ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං භණන්තස්ස යන්නෙහත් මහණෙනි, ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය ගායනා කරන්නහුගේ මෙවනාහි දෝෂයෝ පසෙක් වෙති. තමාද ඒ ස්වරයෙහි විශෙෂයෙන් ඇලෙයි, අන්‍යයෝද ඒ ස්වරයෙහි විශෙෂයෙන් රාගය උපදවා ගණිති, ගෘහපතියෝද (අපි යම්සේ ගායනාකරමු නම් එසේම මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝද ගායනාකරන්නාහුය එහෙයින් මේ ශ්‍රමණයෝ අලජ්ජීහුයැයි) ලාමක කොට සිතති, ස්වරාකල්පය කැමතිවන්නාලබන්නහුගේද සම්ථවිදශීතා විතනයාගේ බිඳීම වේ, පශ්චිම ජනතාවද ඔවුන්ගේ දෘෂ්ටානුගතියට පැමිණේ, මහණෙනි මේවනාහි ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය කියන්නාහුගේ දෝෂයෝ පස වෙත්යයි වදාරා, තදනන්තරව—නභික්ඛවෙ ආයතකෙන ගීතස්සරෙන ධම්මො ගායිතබ්බො යො ගායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති,—යන්නෙහත් මහණෙනි ආයතකවූ ගීතස්වරයෙන් ධර්මය ගායනා නොකටයුත්තේය. යමෙක් ගායනා කරන්නේනම් දුශ්කෘතාපත්තියක්වේයයි ශික්ෂාපදයක්ද පනවා වදාළසේක, එහෙයින් මෙකල පිරිත් නාඩගම් ආදියෙහි ආයතකවූ ගීතස්වරයෙන් පුග පිරිත් යමාර සූත්‍ර අනුශාසනාදිය ගායනාරකන්නාවූ භික්ෂූහු ඒ ගායනාවෙන් වචනයක් පාසා දුශ්කෘතාපත්තියටම පැමිණෙන හෙයින් සියදහස්ගණන් දුකුළා ඇවැත්වලට දූන දූන පැමිණෙන්නාවූ දෙවියන්සහිත ලෝකයාට මහානර්ථකාරී ශාසනවිනාසක අලජ්ජී පාප භික්ෂූනුයයි දතයුත්තේය. තවද මේ පිරිත් නාඩගම් ආදියෙහි නෘත්‍යකාරයන් නටනා කල්හී එය දකිම පිණිසද, නෘත්‍යකාරයන් ගී සින්දු ගායනාකරණ කල්හිද, ශ්‍රමණයන් පිරිත් සූත්‍රාදිය භායනාකරණ කල්හිද. බෙරවාදාදීන් ඒ ඒ වාදනය භාණ්ඩවාද්‍යකරණ කල්හිද, එය ඇසීම පිණිස හුන්සැනින් නැගීම යන්නාවූ භික්ෂූන්ට සියගණන් දුකුළා ඇවිත් සිබවන්නාහුය, භික්ෂූන්ට මේ සියල්ලම තහනම්කොට බුදුන් විසින්-'නභික්ඛවෙ නච්චංවා ගීතංවා වාදිතංවා දස්සනාය ගන්තබ්බං යොගච්ඡෙය්‍ය ආපත්තිදුක්කටස්ස-යන මේ ශික්ෂාපදය පනවනලද්දේය. භාවය—මහණෙනි නෘත්‍යයක් හෝ ගීතයක් හෝ වාදිතයක් හෝ දකිම පිණිස නොයායුතුය, යමෙක් යන්නේනම් දුකුළා ඇවතය යනුයි. මෙහි අටුවාවෙහිද 'එනවනච්චනති නටාදයොවා,පාවච නාතු සොණ්ඩාවා මොරසුක මක්කටාදයොපි සබ්බෙමපතං නච්චංමෙවනාසමා අන්තමසො මොරනච්චම්පි දස්සනාය ගච්ඡන්තස්ස දුක්කටංයෙවම්පි නච්චන්තස්සවා නච්චාපෙන්තස්සවා දුක්කටමෙව,—යන්නෙහත් මෙහිද නච්චං යනු නෘත්‍යකාරාදිහු හෝ සුරාසොණ්ඩයෝ හෝ යමන්පිරිසයින් මොනර ගිරා වඳුරු ආදී තිරිසනෙක් හෝ නටන්වා එසියල්ලම නෘත්‍යයම වේ.

එහෙයින් යටත්පිරිසයින් මොනරයන්ගේ නැටීමද දකිව පිණිස යන්නාවූ භික්ෂුවට දුකුළා ඇවතම වේ. තෙමේද නටන්නාවූ හෝ අනුන් නටවන්නාවූ හෝ භික්ෂුවට දුකුළා ඇවතම සිඩවේයයි කියනලද්දේය. මෙහි ගීතය සඳහා—'ගීතන්ති නටාදීනංවා ගීතං හොතු අරියානං පරිනිබ්බානකාලෙ රතනත්තය ගුණූපසංහිතං සාධු කීළිත ගීතංවා අසංයතභික්ඛූනං ධම්මභාණක ගීතංවා අන්තමසෝ දන්තගීතම්පි යං ගායිස්සාමාති පුබ්බභාගෙ ඔකූජන්තා කරොන්ති සබ්බම්පෙතං ගීතමෙව සයං ගායන්තස්සපි ගායාපෙන්තස්සපි දුක්කට මෙව,— යම්තෙනක් ගීතං යනු නෘත්‍යකාරාදීන්ගේ ගීතයක් හෝ වේවා, ආර්යයන්ගේ පරිනිර්වාණ කාලයෙහි රත්නත්‍රය ගුණෝපසංහිතවූ සාධු ක්‍රීඩිත ගීතයක් හෝ වේවා සීලසංයමයක් නැති මහණුන්ගේ ගීත ස්වරයෙන් ගායනාකරණ ධර්මභාණක ගීතය හෝ වේවා, යටත්පිරි සයින් ගායනා කරන්නෙමුයයි පූර්වභාගයෙහි අව්‍යක්තජනය කරන්නාහු යම් දන්ත ගීතයක්ද කරත්ද එබඳු ගීතය හෝ වේවා ඒ සියල්ලම ගීතය නම්වේ. එය තෙමේ ගායනාකරන්නාවූද ගයනා කරවන්නාවූද භික්ෂුවට දුකුළා ඇවතම වේයයි කියනලද්දේය, වාදිතය සඳහා, වාදිතංනාමතන්ති බද්ධාදිවාදනීය භණ්ඩවාදිතංවා හොතු කුට භෙරි. වාදිතංවා අන්තමසො උදකභෙරිවාදිතම්පි සබ්බමෙතං නවට්ටති යම්තෙනක් වාදිතය නම් තත් බඳිනලද්දාදීවූ වාදනීය භණ්ඩාදිතයක් හෝ වේවා කුම්භබෙරවාදිතයක් හෝ වේවා යටත්පිරිසයින් වතුර පිට ගසන භෙරිවාදිතයද යන මේ සියල්ලම නොවටීයයි කියනලද්දේය. තවද විප්පසන්නා ගීවංපරිවත්තෙන්තාපි පසසන්තාපි ආපත්තියෙව යන්නෙහයින් මේ නෘත්‍යාදිය වීථියෙහි යම්තැන සිට ග්‍රීවය පෙරළා හෙවත් ඉසහරවා බලන්නාවූ භික්ෂුවටද ඇවතම වේ. ෂිතබා යම් මහණ කෙණෙක් උපාසකවරුනි මේ චෛත්‍යයට මේ පිරිතට පූජා බෙර ගැස්වීමාදිය කරවූයයි කීයන්නෑම් ඒභික්ෂූහුද වචනයක් පාසා ඇවැතට පැමිණෙති. ඔබවහන්සේලාගේ මේ චෛත්‍යයට මේපිරිතට පූජාබෙරගැස්වීමාදියෙන් අපි උපස්ථානකරමුදයි කීකල්හි එය පිළිගත් භික්ෂූහුද ඇවතටම පැමිණෙති. එහෙයින් මේ පිරිත් නාඩගමේ නෘත්‍යගීතාදි සියල්ල කරවන්නාවූද කරන්නන්ට අවසර දෙන්නාවූද ඒ නෘත්‍යාදිය දකිව පැමිණෙන්නාවූද ඒ ගීතාදියකරන්නාවූද යියලුම භික්ෂූහු එයින් දතාදන සියදහස්ගණන් ශික්ෂාපද කඩකරගන්නෝ වෙති. එහෙයින් ඔවුහු දෙවියන්සහිත ලෝකයා අපාමගට පමුණුවන්නාවූ සාසන අන්තර්ධානය කරන්නාවූ අලජ්ජී භාවයට පැමිණෙති, යටකිසේ ඒ නෘත්‍යාදිය කරන්නාවූද කරවන්නාවූද අවසර දෙන්නාවූද සාමණේරයන්ගේ එකම සීලයක්වත් ඉතිරි නොවී විනාස වෙති, එහෙයින් ඒ සාමණේරයෝද අලජ්ජී පාප සාවූ

චෞර බවට පැමිණෙති. මේ පිරිත් නාඩගම දැකීමාදිය පිණිස යන්නාවූ අටසිල්ගත් උපාසකවරුන්ගේ 'නච්චගීත' යන ශික්ෂාපදයද බිඳේ. එහෙයින් ඔවුහුද පාප උපාසක බවට පැමිණෙති, සෙසු ගිහියෝද ගිහිවිනයෙහි වදාළ 'කාවනච්චං කවයිතං' යනාදි බුද්ධ ප්‍රඥප්තිය කඩකරමින් එම පිරිත් නාඩගම බැලීමටගොස් ඒ පාප භික්ෂූන්ගේ අප්‍රසාදිකවූ ප්‍රතිපත්ති කෙරෙහි පැහැදීමෙන්ද අගුණකියයුතු ඒ පාප භික්ෂූන්ගේ හා එම නාඩගමේ ගුණ කීමෙන්ද බොහෝ පවු රාසියක් රැස්කරගැණීමෙන් දීර්ඝකාලයක් සතර අපා දුක් විඳිමට පැමිණෙන්නාහුය, මෙසේ ඒ පිරිත් නාඩගම්කාර පාප භික්ෂූන්ට රුවටී ශාසන විනාසය පිණිසද බොහෝ දෙවියන්සහිත ලොකසත්වයාට අහිත පිණිස අහිත පිණිස සතර අපා දුක් පිණිසද පවත්නාවූ මේ පිරිත් නාඩගම කාරවත්නාවූ දායක කාරක උපස්ථායකයෝ මේ පිරිත් නාඩගමට අනුබලදීමාදියෙන් බරක් හෙලුවාක්මෙන් මරණින් මතු සතර අපායගතවන වරදකාරයෝ වෙති. එහෙයින්ද මේ පිරිත් නාඩගම සියප්‍රකාරයෙන් ශාසනයටද ලෝකයාටද තමන්ටද අන්තරාවපිණිස වන ආගම විරුද්ධ අපරාධ කර්මයක් බව දතයුත්තේය.

## 13. ප්‍රශනය.

පිරිත් පින්කම් ආදියෙහි භොජන ශාලාවල වැඩහිඳ පිඟන් තැටිවල දන් වැළඳීම භික්ෂූන්ට අනුදැනවදාළ චාරිත්‍රයක්ද යනප්‍රශ්නයාගේ විසඳීම නම් ඒ ඒ භොජන ශාලාවලට පාත්‍රා නොගෙණ වැඩමුවා දායකයින්ගේ පිඟන්තැටිවල දන්වලඳන සිරිතක් බුද්ධාදි මහෝත්තමයන්ගේ කිසිකාලෙකවත් නොමඇත්තේය, එහෙයින් මෙකල දායක කුලයන් කරා පැමිණ හෝ පිරිත් පින්කමයයි කියනතැන් කරා පැමිණ හෝ භොජනශාලාවලහිඳ ගිහියන්මෙන් පිඟන්තැටිවල වළඳනා පාද්දෙන් දන් වැළඳීම බුදුන් අනුදැනවදාළ චාරිත්‍රයක් නොවන බව සැලකියයුතුයි. බුද්ධාදිමහෝත්තමයෝ භොජන සෙවීමෙහිද පිළිගැණීමෙහිද පරිභොගයෙහිද යුක්ත ප්‍රමාණය දැනගැණීම් වශයෙන් පැවැත්නාවූ භොජනයෙහි මාත්‍රඥතාවය ඇත්තෝ වෙති. ප්‍රණීත ආහාරයෙහි ලොල්වූ බුදුන්ගේ අවජාත පුත්‍රවූ අලජ්ජී පාප භික්ෂූහු එසේ භොජනයෙහි යුක්ත ප්‍රමාණය නොදත්නාහුය, එහෙයින් භොජන සෙවීමෙහි මාත්‍රය නොදැන වළඳන්නාවූ අලජ්ජීහු අඥානතක අප්‍රවාරිත දායකයින්ට අසවල් අසවල් මත්ස්‍ය මාංස සූප කිරි පැණි බත් ආදිය ගෙණෙවු කියා ඉල්ලිඉල්ලා අනුභවකරයි. එසේම දැනදැන ශික්ෂාපද කඩකරමින් බුදුන් විසින් අනුනොදන්වන ලද්දේය, නරමින් හැසිරෙන්නාවූ අලජ්ජී දුස්සීලයන් සත්තයාණද

ශද, වෙදකම් නැකත් බෙලදම් කිරීමාදී අනෙසනයෙන්ද ඔලදිගැණීමෙන්ද සපයාගත් භොජනද වලඳති, බුඩාදී උත්තමයෝ ඒ සියල්ල විස ගත භොජනයක්මෙන්ද අසුචි මිශ්‍ර භොජනයක්මෙන්ද සලකා මිථ්‍යාජීවයන් දුරුකොට දැහැමින් සෙමින් භික්ෂාචාරයෙන් ආහාර සොයා වලඳති, පිළිගැණීමෙහි ප්‍රමාණය නොදන පිළිගෙණ වලඳන්නාවූ අලජ්ජීහු දායකයාගේ දුප්පත් පොහොසත් බවද ශ්‍රද්ධාව ඇති නැති බවද තමාට වලඳන්ට හැකිපමණද නොසලකා දෙනතාක් පිළිගෙණ වළඳ ඉතිරි හරිය ගිහියන්ටද දෙති, ලජ්ජී සීල සම්පන්නයෝ එසේ නොකොට භොජනශාලාවන්හිදී තමතමන්ගේ භික්ෂාපාත්‍රා අත්වලව තබාගෙණ හිඳිනාහු දායකයා දිළින්දෙක් නම් ඉතාම ස්වල්පයක්ද පොහොසතෙක්වුවත් ශ්‍රද්ධාව නැත්තෙක් නම් ඉතාම ස්වල්පයක්ද පොහොසතෙක්දවී ශ්‍රද්ධාවද ඇත්තෙක්වූයේනම් වැඩියක් පිළිනොගෙණ තමන්ට වලඳන්ට හැකිප්‍රමාණයම සලකා පිළිගන්නාහුය. පත්තං පූරෙත්වා අතිත්තං නපටිග්ගහෙ තබ්බං- යන්නෙන් පාත්‍රය පුරවා ගෙණඑනලද භොජනය පිළිනොගත යුත්තේයයි කියාද, සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛාකරණීයා- යන්නෙන් අධිෂ්ඨානුපග පාත්‍රයාගේ ඇතුලත මුවවිට ඉක්මවා පුරවනලද යම් කිසි යාවකාලික ආහාරයක් පිළිනොගෙණ මුවවිට නොඉක්මවා සම්පූර්ණ කරණලද භොජනය පිළිගත්තේනම්යි ශික්ෂාව කටයුත්තේයයි කියාද වදාළ බුඩානුසාසනාව නොයික්මවා භොජනපිළිගැණීම අල්පේච්ඡවූ ප්‍රියශීලි භික්ෂූන්ගේ චාරිත්‍රය වේ, පරිභොගයෙහි ප්‍රමාණය නොදන වළඳන්නාවූ අලජ්ජීහු නෘත්‍යකාරාදීහුමෙන් නෘත්‍ය ගීත කාව්‍ය ශලාක සංඛ්‍යාතවූ ක්‍රීඩාවන්ගේ වැටහීමපිණිසද රජරජමහාමාත්‍යදීහුමෙන් තමන්ගේ මානමද පුරිසමදාදීන්ගේ වැඩීම පිණිසද, හැඳිගැරුප්පු තබා පිණ්ඩ රස භොජනය අනුභවකරන්නාහුය, එසේම වෛශ්‍යස්ත්‍රීහුමෙන් මෙසේ මාගේ අඟප්‍රත්‍යංගයන්ගේ සණ්ඨානතාව සද ඡවිවණ්ණයාගේ ප්‍රසන්නභාවයද වන්නේයයි සිතිදු මොලොක් සද බොදුන් වලඳන්නාහුය. මල්ල යොධාදීහුමෙන් ශරීර මාංසය පිනවීම පිණිස මත්‍ස්‍යමාංසාදිය තෘෂ්ණාවෙන් ගිජුව වලඳන්නාහුය. ලජ්ජී ගුණවත් භික්ෂූහු සවකී සියල්ල පිණිස නොවලඳ කිසිම කෙළි සිනාවක්නැතිව ජිගුප්සාපටිපිනොදනය සහ මෙය මෙහි නිස්සරණයයි සලකා කාන්තාර මාර්ගයෙහිදී, ප්‍රිය පුත්‍ර මාංසයක් වලඳන්නාක් මෙන් භොජනය වලඳන්නාහුය. මෙකල පිරිත් තාඩගම් ආදියෙහි භොජන ශාලාවලදී දායකයන්ගේ පිහන් තැටිවල පුරවා බෙදාදෙනලද බත පිළිගැණීම තබා ශ්‍රමණ සාරූප්‍යවූ පාත්‍රවත්දායකයින්අතටදී ඔවුන්ට කැමතිපරිද්දෙන් බෙදාදෙනලද භොජනයද පිළිගෙණ ඇයිතක් වළඳ ඉතිරිහරිය පාත්‍රය සමඟ ගිහි දරුවන්ට දීමද අල්පෙච්ඡවූ

භික්ෂූන්ගේ චාරිත්‍රයක් නොවන්නේමය. පෙර මෙම ලක්දිව තිස්ස සාමි මහරජතෙමේද, සෑගිරියෙහි භික්ෂුසංඝයාට නිමන්ත්‍රණයකරව, රාජාන්තඃ පුරයට භික්ෂූන් වැඩියකල්හි දන් බෙදා නෙණවුත් පිළිගැන්වීම පිණිස පාත්‍රා දෙනුමැනවයි ඉල්වූයේය, එවිට ඒ භික්ෂූහු ගෙපිළිවෙළින් පිඩු පිණිස යන භික්ෂූන්ගේමුත් භොජනශාලාවලදීද දන් වලදන භික්ෂූන්ගේ සිරිතක් නොවන හෙයින්, අලංමිහාරාජ අත්තනොපමාණෙන භික්ඛා ගණ්හිස්සන්තීති—යන්නෙන් මහරජ පාත්‍රා දීම නුසුදුසුය භික්ෂූහු තමාගේ ප්‍රමාණයෙන් භික්ෂාව ගන්නාහු යයිකියා එකම භික්ෂූන්වහන්සේ කෙනෙකුන්වත් පාත්‍රයනුදුන්නේය. සියල්ලෝ ප්‍රමාණයෙන් යුක්තවම පිළිගත්තාහුය, බුදුන් කාලයෙහි භොජනශාලාවලදී භික්ෂූන්ගේ පාත්‍ර ඉල්වා තමතමන්ට කැමති පරිද්දෙන් දන් බෙදා නෙණවුත් එහිම හිඳ වැලඳීමට පිළිගන්වන සිරිතක් ශාසන චාරිත්‍රයද නැත දන්දෙන දායකවරුන්ගේද නැත්තේය. ඔවුහු භික්ෂූන් වඩාහිඳුවා පළමුකොට දක්ෂිණොදකය පිළිගන්වා තදනන්තරව පාත්‍රා සොදා ගැණීම පිණිස වතුර නෙණවුත් භික්ෂූන්ගේම අත්වල තිබෙන පාත්‍රවලට වතුර පිළිගන්වාගෙණ යන්නාහුය, භික්ෂූන්ම තමතමන්ගේ පාත්‍ර තම්තමන්ම සොදාගත්කල්හි ඒ වතුර නෙණගොස් දමීමට භිස්භාජනයක් නෙණවුත් වතුර පිළිගෙණ යන්නාහුය, තදනන්තරව බත් සූප ව්‍යඤ්ජනාදිය බෙදාගෙණ යන්නාහුය, භික්ෂූන්ද ප්‍රමාණය දැණ පිළිගෙණ වැලඳූවාට්පසු ඒ පාත්‍ර සොදා ගැණීමට පෙරසේම වතුර නෙණවුත් පිළිගන්වාගෙණ යන්නාහුය එසේද ඉවරවූපසු සියල්ලෝද අවකාශව අවුත් අනුමොදනාව ඇසීමට වැඳ එකත්පසව හිඳගන්නාහුය. එකල්හි ධර්මකථික භික්ෂූන්වහන්සේ කෙනෙක් එම පිරිසට අනුමොදනා දෙසනාව කරන්නේය. මේපෙර දායකවරු භොජනශාලාවල භික්ෂූන් හිඳුවා දන්දෙනපිළිවෙළනම්වේ අප බුදුරජාණන්ද දන් වැළඳීම පිණිස භක්තාග්‍රවලට පැමිණිකල්හි යටක්සේ දායකයන් විසින් පිළිගන්වනලද පාත්‍ර සොදන වතුරෙන් තමාම පාත්‍රය සොදාගැණීමාදී සියල්ල කරණසේක, ඒ බව බ්‍රහ්මායු සූත්‍රයෙහිද-සොපත්තොදකං පටිගණ්හන්තො නපත්තං උන්නාමෙති නපත්තං ඔනාමෙති නපත්තං සන්නාමෙති නපත්තං විනාමෙති සොපත්තොදකං පටිගණ්හාති නාතිථොකං නාතිබහුං සොනඛුළුඛුළු කාරකං පත්තං ධොවති නසම්පරිවත්තකං පත්තං ධොවති නපත්තං භූමියං නික්ඛිපිත්වා හත්ථෙ ධොවති හත්ථෙසුධොතෙසු පත්තොධොතො හොති පත්තෙධොතෙ හත්ථාධොතා හොන්ති සොපත්තොදකං ඡඩ්ඩෙති නාතිදූරෙ නාච්චාසන්නෙ නචවිච්ඡඩ්ඩයමානො සොඔදනං පටිගණ්හන්තො නපත්තං උන්නාමෙති නපත්තං ඔනාමෙති නපත්තං සන්නාමෙති නපත්තං විනාමෙති—යනාදිවශයෙන් ඒ සර්වඥයන්

වහන්සේ පාත්‍රය සෝදන වතුර පිළිගන්නේ පාත්‍රයාගේ මුවවිට උදක
දායකයාගේ පැන් භාජනයෙහි වදනාපරිද්දෙන් පාත්‍රය උඩට නොන
ගන සේක, පාත්‍රය පතුලපිට තබන්නාසේ යටට නොනමනසේක,
පාත්‍රය දැඩිකොට නොගන්නාසේක, පාත්‍රය ඔබිනොබ නොසොල්
වන සේක, මෙසේ නොකොට දැතින් පාත්‍රය අල්වාගෙණ මදක්
නමා පාත්‍රය සෝදන වතුර පිළිගන්නාසේක ඒ සර්වඥතම පාත්‍රය
සෝදන වතුර ඉතා මද නොකොට ඉතා බොහෝත් නොකොට පිළි
ගන්නේය. ඒ සර්වඥතෙම බුළු බුළු යන අනුකරණ ඇතිව (ශබ්ද
නගා පාත්‍රය නොසෝදනසේක, පාත්‍රය ඇතුල සේදීමට පළමුවෙන්
පාත්‍රය පිට නොසෝදනසේක, පාත්‍රය බිමතබා අත් නොසෝදන
සේක, අත් සේදූකල්හි පාත්‍රය සේදූයේම වේ, පාත්‍රය සේදූකල්හි
අත් සේදුවාහුම වෙති, ඒ බුදුරජතෙම පාත්‍රය සේදූ වතුර ඉතා දුරෙ
හිද ඉතා ආසන්නයෙහිද වතුර පිළිගන්නා දායකයාව තෙමෙන
පරිද්දෙන් විසුරුවාද නොදමනසේක, ඒ බුදු රජ තෙම බත පිළි
ගන්නේ දායකයාගේ බත් භාජනයෙහි පාත්‍රය මුවවිට වැදෙන පරිද්
දෙන් උඩට නොනගන සේක. පාත්‍රය යටටද නොනමනසේක,
පාත්‍රය දැඩිකොට නොගන්නා සේක. පාත්‍රය ඔබිනොබ නොසොල්
වනසේකැයි දක්වනලද්දේය, මේ ප්‍රකාශවූයේ භොජන ශාලාවලදී
වැළඳීම කරන්නාවූ බුදුරජාණන් වහන්සේගේ වත් රාශිය වේ.
මෙය භික්ෂූන්ටද භක්තාග්‍රවතෙහිදී වදාරණලද්දේය, එහි නියම
පරිද්දෙන් භික්ෂූන් විසින්ද භොජනශාලාවලදී දායකයන් විසින්
පාත්‍රය සෝදන වතුර දෙනුලබන කල්හි පාත්‍රය දැතින් අල්වාගෙණ
වතුර පිළිගත යුත්තේය, පෙරටුව ආධාරකයෙහි (දායකයා විසින්
පෙරටුව තබනලද තිපි මේසයෙහි) පාත්‍රය තබා දක්ෂිණෝදකය පිළි
ගත යුත්තේය. වතුර ශබ්ද නොකරමින් පාත්කොට පාත්‍රය සෝද
ගත යුත්තේය. ඉදින් පාත්‍රය සේදූ වතුර පිළිගෙණයන්නෙක්
වේනම් ඒ උදකපටිග්ගාහකයාද සඟලසිවුරද භාත්පස භික්ෂූනුද
යම්සේ නොතෙමෙත් නම් එසේ පාත්කොට උදකපටිග්ගාහකයාගේ
භාජනයට හෙළිය යුත්තේය. පිළිගන්නෙක් නැතිනම් සඟලසිවු
රද භාත්පස භික්ෂූන්ද නොතෙමෙන පරිද්දෙ බිමට දැමියයුත්තේය,
බත දෙනු ලබනකල්හි පාත්‍රය දැතින් අල්වාගෙන සූප ව්‍යඤ්ජන
වලට අවකාශ තබා බත පිළිගත යුත්තේය. වළඳන්ට හැකිපමණට
වඩා පිළිනොගෙණ තමාට වැළඳීමට හැකි මෙපමණයයි මාත්‍රසංඥත
බත පිළිගතයුත්තේය. සිහිය එලවා ආහාරය පිළිගතයුත්තේය,
තමාගේ පාත්‍රයෙහි උපනිබද්ධ සංඥා ඇතිව ආහාරය පිළිගතයුත්තේය
බතෙන් සතරෙන් කොටසක් සූපව්‍යඤ්ජන ඇත්තාවූ ආහාරය පිළි
ගත යුත්තේය (මුවවිට රේඛාව ඉක්මවා ගැටියෙන් මතුපිට හොයමෙ-

කොලයක්මෙන් පුරවාදෙන බත පිළිගත් භික්ෂුව එකෙණෙහිම දුකුළං ඇවතට පැමිණේ) සිහිඑළවා ආහාරය වැළඳිය යුත්තේය. පාත්‍රයෙහි උපනිබද්ධ සඤ්ඤාඇතිව ආහාරය වැළඳිය යුත්තේය. පාත්‍රයෙහි කෙළවරක පටන් අනුපිළිවෙළින් වැළඳිය යුත්තේය, බතින් සතරවන කොටස පමණව සූපව්‍යඤ්ජන සහිතවූ ආහාරය වැළඳිය යුත්තේය. (බතින් සතරවන කොටසට වඩා සූපාදිය පිළිගත් කෙණෙහිම ඇවතට පැමිණේ) බත් මුදුනෙන් අනා නොවැළඳිය යුත්තේය. මුද්ගසූපාදි සූපයන්හෝ නානාප්‍රකාර මාංසාදි ව්‍යඤ්ජනයන්හෝ බොහෝ ලබාගැණීමට කැමති බව නිසා බතින් නොවැසිය යුත්තේය. එසේ කරන්නාවූ ගිලනට පවා ඇවැත්ම වේ: ගිලන් බවක් නැති භික්ෂුව විසින් සූපයක් හෝ මාංසාදී ව්‍යඤ්ජනයක් හෝ අහවා ඉල්වා නොවැළඳිය යුත්තේය. අගුණ වශයෙන් සිතනලද සිත්ඇතිව අනුන්ගේ පාත්‍රය දෙස නොබැලියයුත්තේය. මොනර බිජුවටක්සේ ඉතා මහත්කොට ආලෝපය නොකටියුත්තේය වටකොට ආලෝපය කටයුත්තේය ආලෝපය මුඛවාරයට එලවන්ට පළමුකොට මුඛවාරය නොඇරිය යුත්තේය, වළඳමින් සියඑඅත ගෙවත් ඇඟිලි මුඛයෙහි නොදැමිය යුත්තේය.. ආලෝපසහිත මුඛයෙන් හෙවත් කම්පමණකින් වචනය අසම්පූර්ණවේනම් එපමණ ආහාරය මුඛයෙහි තබාගෙණ කථා නොකටයුත්තේය. බත් පිඩු මුඛයට දමා නොගැසිය යුත්තේය. ආලෝපය මුඛයෙන් කඩකඩා නොවැළඳිය යුත්තේය. වඳුරෙකුගේ ගණ්ඩයෙහි (හක්කෙහි) රුස්කොටකොට නොවැළඳිය යුත්තේය. අත සලසලා නොවැළඳිය යුත්තේය. බත්හුලු ඉසඉස නොවැළඳිය යුත්තේය. දිව නෙරනෙරා නොවැළඳිය යුත්තේය. චපුචපු යන හඬ පවත්වපවත්වා නොවැළඳිය යුත්තේය. සුරුසුරු යන හඬ පවත්වපවත්වා නොවැළඳියයුත්තේය. අත ඇඟිලි ලෙවලෙවා නොවැළඳිය යුත්තේය. එක ඇඟිල්ලකින්දු පාත්‍රය ලෙවලෙවා නොවැළඳිය යුත්තේය. දිවින් පිටතොල ලෙවලෙවා නොවැළඳිය යුත්තේය. ආමිසය සහිත අතින් පැන් තැටිය පිළිනොගත යුත්තේය. යම්තාක් සියල්ලෝම නොවැළඳූවෝ වෙත්ද ඒතාක් ස්ථවිරයා විසින් අත සෝදන වතුර පිළිනොගත යුත්තේය. ඉදින් මනුෂ්‍යයෝ ස්වාමීනි පාත්‍රයද අතද සෝදයන මැනවැයි කියත්නම් හෝ භික්ෂූන් වහන්සේලා වතුර පිලිගන මැනවයි කියත්නම් හෝ පිළිගත යුත්තේය. පාත්‍රය සෝදන වතුර දෙනු ලබනකල්හි දැතින් පාත්‍රය අල්වාගෙණ වතුර පිළිගත යුත්තේය. පාත්කොට වතුර ශබ්ද නොකරස්නාවූ විසින් ඝට්ටනය නොකොට පාත්‍රය සෝදගතයුත්තේය, යතණම්ආදි වත් රාසියක් භොජනශාලාවලදී වළඳන භික්ෂූන් විසින් පිරියයුතුමෙස් හගෙහතාශු වන වදාරණලද්දේය, එතන

සිත් මෙකල කරන්නාවූ පිරිත් නාඩගමෙහිද වෙනත් ගිහිගෙවල් වලද ඒ ඒ භක්තාග්‍රසන්හි දායකයින්ගේ පිඟන්තැටිවල බෙදා ගෙණ වුත් දෙන බතද දායකයන් අතට පාත්‍රයන්දී ප්‍රමාණය නොදැන බෙදා ගෙණවුත් දෙන බතද පිළිගෙණ සටකී වත් රාසිය නොපුරා වළඳන් නාවූ භික්ෂූහු ඒවත් රාසිය කඩකිරීමෙන් සිඟගණන් ඇවත්විලට පැමි ණෙන්නාවූ දෙවියන් සහිත ලෝකයාට මහානර්ථකාරීවූ තුන්හලාවට පිහිටි ඇති ශාසනයද නසන්නාවූ නිර්ලජ්ජී පාප භික්ෂූහුනම් වෙති එහෙයින් භෝජන ශාලාවල හිඳ පිඟන් තැටිවල දන් වැළඳීම භික්ෂුත්ව අනුදැන වදාළ චාරිත්‍රයක් නොවනබව මෙතෙකින් දත යුත්තේය.

## 14. ප්‍රශ්නය.

යටකිසේ මෙකල කරන්නාවූ පිරිත් පින්කම කරණ කරවන ගිහිපැවිදි දෙපක්ෂයට පරලොවුහිදී ලැබෙනවිපාකානිසංසය කෙසේද යන්නෙහි විසඳීමනම්, මෙකල පිරිත් පින්කමයයි කියා යටකීසේ කරන්නාවූ ආගම විරුද්ධ නාඩගම කරණකරවන ශ්‍රමණයෝ එම නාඩගමෙන් බුදුන් විසින් පනවනලද සියදහස්ගණන් ප්‍රඥප්ති කඩ කොට කපිලාදිපාපයෝ මෙන් ප්‍රවරවූ බුද්ධසාසනයද නසා මරණින් මතු කපිලදෙවදත්තා කොකාලිකාදි පාපතරයෝ මෙන්ම නොයෙක් වර්ෂකොටි සතසහශ්‍ර ගණන් මුළුල්ලෙහි අතිභයානකවූ අවීචි ආදී මහ නරක දුක් විඳ එයින්ද චුතවූවාහු—තස්ස සඞ්ඝාටිපි ආදිත්තා සම් පජ්ජලිතා සජෝති භූතාපත්තොපි ආදිත්තො සම්පජ්ජලිතොසංජෝති භූතො කායබන්ධනම්පි ආදිත්තං සම්පජ්ජලිතං සජෝති භූතං කායොපි ආදිත්තො සම්පජ්ජලිතො සජෝතිභූතො—යන්නෙන් ඒ ශ්‍රමණ ප්‍රෙතයාගේ සංඝාටියද ගිනිගත්තාලද්දිය හාත්පසින් දිලිසෙන ලද්දිය ගිනිදල් සහිත වන්නීය—පාත්‍රයද ගිනිගත්තා ලද්දේය හාත්පසින් දිලිසෙනලද්දේය ගිනිදල් සහිත වන්නේය. පටියද ගිනිගත්තාලද් දේය හාත්පසින් දිලිසෙනලද්දේය ගින්දල් සහිතවන්නේය, ශරීරය ද ගිනිගත්තා ලද්දේය හාත්පසින් දිලිසෙනලද්දේය—ගිනිදල්සහිත වන්නේයයි ලක්ෂණ සංයුක්තකයෙහි වදාළ නයින් හාත්පසින් ගිනි ගත්තාවූ අයොමය සිවුරු පාත්‍රාදියෙන් යුක්තවූ ගොදුනක් පමණ උසඇති ගිනිගත්කය ඇත්තාවූ ශ්‍රමණ ප්‍රේතයෝවී නැවත බලුකවුඩු ගරබරණ සිහිපලගාදි තිරිසන් යෝනියෙහි ඉපිද අපමණ ජාතිඅප දුක් විඳින්නාහුය.

සකිංපිතං හලාහලං උපරුන්ධති ජීවිතං
සාසනෙන විරුජ්ඣිත්වා කප්පකොටිම්හි ඩය්හති

යන්නෙන් පානයකරණලද හලාහල විෂය එකවරක් ජීවිතය නසයි සාසනයෙහි විරුද්ධකම්කොට කල්පකෝටියෙක්හි දනුලැබේයයි

වදාළ නයින්ද—චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභත නික්ඛිත්තො එවංනිරයෙ, යනාදින්—මහණෙනි පාපධර්ම සතරකින් යුක්තවූ පුරුෂතෙම ගෙණැවුත් තැබූද බරක් හෙළුවාක්මෙන් නරකයෙහි පිහිටියේම වේයයි වදාළ නයින්ද—තයිදං භික්ඛවෙ හොති බහුජන අහිතාය බහුජන අසුඛාය බහුනොජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං—යනාදින්, මහණෙනි එපාපභික්ෂූන්ට(බොහෝ උපස්ථායකාදින්ගේ ඇතිවීමෙන් බලලැබීමය යන කාරණය බොහෝ ජනයාට අහිත පිණිස බොහෝ ජනයාට අසැප පිණිස බොහෝජනයාට බොහෝ දෙවිමිනිසුන්ට අනර්ථපිණිස අහිත පිණිස සතර අපායදුක් පිණිස වන්නේයයි වදාළ නයින්ද මේ පින්කම මෙලෝ පරලෝ දෙකට වැඩ ඇති මහපින්කමයයි රැවටී මේ ආගම විරෝධ පිරිත් නාඩගම් කරවන්නාවූ දායකයෝද වෙස්සන්තර නාඩගම නටන්නාවූන්ට උපස්ථානකරමින් අනුබලදෙන්නෝමෙන් මෙම පිරිත් නාඩගම කරණ මහණුන්ට බත් කන් බැඳ බැඳ ගෙණගොස් පිහන්තැටිවල ඔබ ඔබා කැමදෙමින් ඒ නාඩගම කිරීමට අනුබලදෙන දායකයෝද එම නාඩගම බැලීමට යන සෙසුගිහියෝද එකී නාඩගමේ, එවරූපාසමණ බ්‍රාහ්මණා නසක්කා තබ්බාන ගරුකතබ්බාන මානෙතබ්බාන පූජෙතබ්බා—යනු වදාළ නයින් සත්කාර ගරුකාර ආදර සිවුපසපූජා නොකටයුතුවූ ගිහියන්ගේ පිහන් තැටිවල බත්කමින් නොයෙක් කෙළිසිනාවන් දවස ඉක්මවන්නාවූ ඒ අලජ්ජිපාපතරයන්ගේ අප්‍රසාදික ක්‍රියාවන්හි සිත පහදවාගැනීමෙන්ද අගුණ කියයුතු එම පාප මහණුන්ගේ ගුණකීමෙන්ද එම පාපමහණුන්ව ආශ්‍රය කිරීම බලවත්වූ අසත්පුරුෂ සේවනයක් බැවින් එ පාපමිත්‍ර බාල අසත්පුරුෂ සේවනයෙන්ද රැස්වන්නාවූ අකුසල රාසිය හේතුකොටගෙණ මරණින්මතු බරක් හෙළුවාක්මෙන් සංජීවකාල සූත්‍ර සංඝාත රෞරව මහාරෞරව තාප ප්‍රතාප අවීචිය යන අට මහනරකයෙහිද සෙසු ඔසුපත් නරකයන් ඇතුලුකොට ඇති එක්සිය සතිස් මහනරකාන්හිද බලුකවුඩු ආදි තිර්යන් යෝනියෙහිද ප්‍රේතවිෂයෙහිද ඉපිද අපමණ කල් අපායදුක් විඳින්නාහුමයයි නිසැකව දතයුත්තේය—තමද ජානුත්තරිය සූත්‍රයෙහි එබඳු පාප මහණුන්ගේ දකීම ඇසීම පිණිස යාමද ඔවුන් කෙරෙහි පැහැදීමද උපස්ථාන කිරීමද සිහිකිරීමද යනමේ ආදිය අතිශයින් හීනවූ අන්ධබාල ග්‍රාමවාසීන් සන්තකවූ පෘථග්ජනිකයන් සන්තකවූ අනාර්යවූ අනර්ථපිණිස පවත්නාවූ පාපකර්මයයි කියාද ඒ දශිනාදිය සතර කලකිරීමාදිය පිණිස නොපවත්නේයයිකියාද විදුරණලද්දේය-එහෙයින් ආත්මාර්ථ පරාර්ථකාමී සත්පුරුෂයන්විසින් හැමකල්හි සතරකලකිරීම්පිණිසද රාගාදීන්ගේ නොඇලීමපිණිසද නිරොධයපි

ණීසඳ සංසිඳුම පිණිසද විශිෂ්ටඥණයෙන් චතුරාර්‍ය සත්‍යය දැනගැණීම පිණිසද මාර්ගඥණයාගේ අවබෝධය පිණිසද නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද නොපවත්නාවූ අතිශයින් ගිනවූ අන්ධබාල ග්‍රාමවාසින් සන්තකවූ අනාර්‍යවූ අනාර්‍ය පිණිසම පවත්නාවූ යටකී පිරිත් නාඩගම කරවීමය ඊට අනුබලදීමය දකීමට යාමය එම අලජ්ජීබාල පාපමිත්‍ර අසත් පුරුෂ මහණුන් සෙවනය කිරීමය යන මේ ආදීයෙන් විශෙෂයෙන් වැලකී ප්‍රියශීලී කල්‍යාණමිත්‍ර අනුජාත බුද්ධපුත්‍රශ්‍රමණයන්වහන්සේලා සොයා නොලදහොත් එකචරියංදලහංකයිරා නත්ථිබාලෙ සහායතා,යි වදාළ බුද්ධානුසාසනාව සිහිකොට—ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි මනාකොට පිහිටා හුදකලාව හැසිරෙමින් සවගී මොක්ෂසම්පත් සිද්ධකරගැණීමට උත්සාහ කටයුත්තේය— මෙතෙකින් මහත්මයා විසින් අසනලද පරිත්‍රාණ ප්‍රශ්නයෝ තුදුස කරුණු සහිතව ආගමානුකූලව විසඳන ලද්දාහුයයි දතයුත්තේය—

ඉදට්ඨිකණ්ඩාන නිසම්මධීරා
ජහන්තු දුල්ලබ්ඛෙසා අත්ථ කාමා
සුසික්ඛිතාතෙ විනයෙසමග්ගා
සද්ධරා සාසනං පාලයන්තු
ඉමිනාපුඤ්ඤ කම්මෙන
යාවසම්බොධි පත්තියා
සදෙවකස්ස ලොකස්ස
අත්ථායච හිතායච
සුඛාය සබ්බදායෙව
භවන්තං පටිපන්නකො—

— නිමි —

මේ බවට,

කොට්ටාවේ බෞද්ධ තාපසාරාමාධිවාසී
ශ්‍රීසද්ධර්මානුලෝමික භික්ෂුප්‍රව්‍රජ්‍යාපනත
බැලගම සුබෝධානන්ද බෞද්ධ
තාපසඋන්නාන්සේය.
බී. ඒ. සුබෝධානන්ද.